පර්යේෂණ වාර්තා

HARTI

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

දේශීය ආහාර බෝග අංශයේ ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාවන් හි ප්‍රගතිය සඳහා වන අභියෝග සහ විභවතා: කුරුණෑගල දිස්ත්‍රික්කය ඇසුරින්

එම්.ඩී. සුසිලා ලූර්දු

සංගීත් ප්‍රසාද් ප්‍රනාන්දු

සාගරිකා හිටිහාමු

දේශීය ආහාර බෝග අංශයේ ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාවන් හි ප්‍රගතිය සඳහා වන අභියෝග සහ විභවතා : කුරුණෑගල දිස්ත්‍රික්කය ඇසුරින්

එම්.ඩී. සුසිලා ලූර්දු
සංගීත් ප්‍රසාද් ප්‍රනාන්දු
සාගරිකා හිටිහාමු

පර්යේෂණ වාර්තා අංක 72

2025 දෙසැම්බර්

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය
114, විජේරාම මාවත,
කොළඹ 07

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල නාමාවලි සූචිය

ලූර්දු, එම්.ඩී. සුසිලා

දේශීය ආහාර බෝග අංශයේ ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවවන් හි ප්‍රගතිය සඳහා වන අභියෝග සහ විභවතා:කුරුණෑගල දිස්ත්‍රික්කය ඇසුරින්/එම්.ඩී.සුසිලා ලූර්දු, සංගීත් ප්‍රසාද් ප්‍රනාන්දු සහ සාගරිකා හිටිහාමු. කොළඹ: හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය, 2025. පි.xii: 63:ප්‍රස්තා; සෙමී.29.-(පර්යේෂණ වාර්තා; 72)

ISBN 978-624-5973-66-8

i 338.16072 ඩිවි 23	ii ලූර්දු, එම්.ඩී.සුසිලා
iii ප්‍රනාන්දු, සංගීත් ප්‍රසාද් (සම කර්තෘ)	iv. හිටිහාමු, සාගරිකා (සම කර්තෘ)
v. ග්‍රන්ථ නාමය	vi ග්‍රන්ථ මාලාව

1. කෘෂිකර්මය - පර්යේෂණ-ශ්‍රී ලංකාව	2. කෘෂිකර්මය-තාක්ෂණික නවෝත්පාදන-ශ්‍රී ලංකාව
2. ගොවීන්ගේ ආකල්ප-ශ්‍රී ලංකාව	4. තාක්ෂණික අනුවර්තනය-ශ්‍රී ලංකාව

පරිසනක පිටු සැකසුම් හා කවර නිර්මාණය - ඒ.පී. උදේනි කරුණාරත්න

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය
114, විජේරාම මාවත, කොළඹ 07
ශ්‍රී ලංකාව

දුර කථනය : +94112696981
: +94112696437
ෆැක්ස් : +94112692423
විද්‍යුත්තැපැල : librarian@harti.gov.lk
වෙබ් අඩවිය : www.harti.gov.lk

පෙරවදන

ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය, කෘෂිකාර්මික දැනුම හා තොරතුරු බිම් මට්ටම දක්වා ඵලදායී ලෙස ව්‍යාප්ත කිරීම සඳහා වත්මන් කෘෂිකාර්මික ව්‍යාප්ති පද්ධතිය තුළට එක් වූ නවතාවයකි. ‘‘දේශීය ආහාර බෝග අංශයේ ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාවන් හි ප්‍රගතිය සඳහා වන අභියෝග සහ විභවතා’’ යන මැයෙන් කුරුණෑගල දිස්ත්‍රික්කය පාදක කරගනිමින් සිදුකළ මෙම අධ්‍යයනය මඟින් ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාවන් හි සාර්ථකත්වයට ගොවීන්ගේ හා නිලධාරීන් සම්බන්ධයෙන් පවතින බාධක මඟහරවා ගැනීමට එම පාර්ශ්වයන් තුළ ඇති අවස්ථාවන් හා විභවතාවන් ප්‍රයෝජනයට ගත හැකි ආකාරය අධ්‍යයනයට ලක් කර ඇත.

අධ්‍යයන ප්‍රදේශය තුළ මෙන්ම සමස්තයක් ලෙස ග්‍රාමීය කෘෂිකාර්මික අංශය තුළ ද මෙම ඩිජිටල් මෙවලම් සහ ඩිජිටල් වේදිකා මඟින් ප්‍රතිඵලදායක තත්ත්වයක් ඇති වීමට නම්, ගොවි ප්‍රජාව මෙන්ම ව්‍යාප්ති නිලධාරීන් අතර ඩිජිටල් සාක්ෂරතාවය සම්බන්ධයෙන් පවතින අසමානතාවයන් අවම කිරීම සහ ගොවීන් හට මෙම ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති යෙදුම් (App) ඇතුළු සියලු ඩිජිටල් මෙවලම් පිළිබඳ විශ්වාසය ගොඩනැගීම අත්‍යවශ්‍ය බව අධ්‍යයනය විසින් නිගමනය කර ඇත.

ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාවන්, ගොවීන් සහ ව්‍යාප්ති නිලධාරීන් වෙත සමීප කරවීමට අවැසි ප්‍රතිපත්ති සහ සැලසුම් සැකසීමේ දී මෙම පර්යේෂණ අධ්‍යයනය මඟින් අනාවරණය කර ඇති දැනුම මෙන්ම නිගමන සහ යෝජනා කෙරෙහි ඊට අදාළ පාර්ශ්වයන්ගේ අවධානය යොමු වනු ඇතැයි අපේක්ෂා කරන අතර ශ්‍රී ලංකාවේ ඩිජිටල්කරණ ක්‍රියාවලිය පිළිබඳ දැඩි අවධානයක් යොමු කෙරී ඇති පසුබිමක මෙවැනි මාතෘකාවක් ඔස්සේ පර්යේෂණ අධ්‍යයනයකට යොමු වීම කාලෝචිත බව ද සඳහන් කළ යුතු වේ.

මහාචාර්ය ඒ.එල්. සන්දික
අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී

ස්තූතිය

මෙම පර්යේෂණ අධ්‍යයන වාර්තාව ප්‍රකාශනයක් ලෙස එළිදැක්වීමට අනුමැතිය ලබා දුන් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ වත්මන් අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී මහාචාර්ය ඒ.එල්.සන්දික මහතාට සහ පරිපාලනමය හා ආයතනික පහසුකම් සැපයූ ආයතනයේ අතිරේක අධ්‍යක්ෂ (වැ.බ.) ආචාර්ය සමන්ත පල්ලියගුරු මහතාට අපගේ ස්තූතිය පුදකර සිටිමු.

මෙම පර්යේෂණ වාර්තාව විමර්ශනය කරමින් එය උසස් තත්ත්වයකට ගෙන ඒමට අභ්‍යන්තර විමර්ශක ලෙස කටයුතු කළ ආචාර්ය පී.සී.ජේ. ද සිල්වා මහතාට අපගේ ස්තූතිය පුද කෙරෙන අතර මෙම පර්යේෂණ වාර්තාවේ වලංගුභාවය නිශ්චය කරමින් එය ශාස්ත්‍රීය වාර්තාවක් දක්වා ගෙන ඒමට අදහස් හා යෝජනා සැපයූ අචාර්ය ෆෙඩ්රික් අබේරත්න මහතාට අපගේ විශේෂ ස්තූතිය පුද කෙරේ.

මෙම අධ්‍යයනයට අවශ්‍ය කෙරෙන දත්ත හා තොරතුරු රැස් කිරීමට සහය දැක්වූ විමර්ශන නිලධාරීන් වන පී.එම්. දිලිනි භාග්‍යා වීරසේකර සහ දිනූෂා ඉඳුනිල් දිසානායක යන මෙනෙවියන්ටත් දත්ත විශ්ලේෂණ කාර්යය මැනෙවින් ඉටු කළ සංඛ්‍යාන සහකාර නිලධාරී කුෂානි රාජකරුණා මහත්මියටත් අපගේ ස්තූතිය පුද කෙරෙන අතර දළ පිටපත පරිගණකගත කිරීමේ කාර්යය නිවැරදිව ඉටු කළ කළමනාකරණ සහකාර එස්. ඩී. ලහිරුකා රශ්මිනී මහත්මියගේ සේවය ද වඩාත් අගය කරන්නෙමු.

මෙය ප්‍රකාශනයක් ලෙස එළිදැක්වීමේ දී භාෂා සංස්කරණය, සෝදුපත් කියැවීම, කවර නිර්මාණය සහ මුද්‍රණය ආදී සමස්ත ප්‍රකාශන ක්‍රියාවලියම වගකීමෙන් කාර්යක්ෂමව ඉටුකළ තොරතුරු හා සන්නිවේදන අංශයේ අංශ ප්‍රධාන ඇතුළු සියලුම කාර්ය මණ්ඩලයටත් මේ සඳහා විවිධ රාජකාරීමය සහයෝගයන් දැක්වූ සියලු දෙනාටත් අපගේ හදපිරි ස්තූතිය පිරිනැමීමට කැමැත්තෙමු.

එම්.ඩී. සුසිලා ලූර්දු
සංගීත් ප්‍රසාද් ප්‍රනාන්දු
සාගරිකා හිටිහාමු

විධායක සාරාංශය

ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය විවිධ ව්‍යාප්ති ප්‍රවේශයන් අනුගමනය කරමින් ව්‍යුහාත්මක සහ ක්‍රියාත්මක තත්ත්වයන් හි වෙනස්වීම් සිදු කෙරෙමින් වර්තමානය දක්වා විකාශනය වෙමින් පවතී. වත්මන් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය, එහි අපේක්ෂිත ප්‍රතිලාභ සාක්ෂාත් කර ගැනුමට බාධා කෙරෙන අභියෝග රැසකට මුහුණ දී සිටී. එබැවින් රටේ කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාව, රජයට අඩු බරක් සහිත අඩු මෙහෙයුම් පිරිවැයක් සමඟ ගොවි අවශ්‍යතාවලට ප්‍රතිචාර දැක්විය හැකි පරිදි වඩාත් කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් බවට පත් වීමට අපොහොසත් වීමේ දැඩි පීඩනයකට ලක්ව ඇත. මෙම අභියෝග ජයගැනීමට ව්‍යාප්ති සේවාව සැපයීම සඳහා විවිධාංගීකරණය වූ සන්නිවේදන මාධ්‍ය භාවිතා කිරීම, එනම් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මාධ්‍යයන් මෙන්ම සමාජ මාධ්‍ය උපකරණ භාවිතා කිරීම කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාවට මෑතක දී එක් වූ නවතාවයකි. මෙම තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සහ ඊට අදාළ මෙවලම් භාවිතා කරමින් ව්‍යාප්ති සේවාව සැපයීම "ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය" ලෙසින් ගොවි ප්‍රජාව වෙත හඳුන්වා දී ඇත.

කෘෂිකාර්මික අංශයට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය එක්කර ගැනීම 2004 වර්ෂයේ "සයිබර් කෘෂිකාර්මික ව්‍යාප්ති ව්‍යාපෘතියේ" ආරම්භයත් සමඟ සනිටුහන් වේ. අනතුරුව පර්යේෂණ සහ ව්‍යාප්ති පද්ධතිය තුළ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ආශ්‍රිත ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති මෙවලම් රාශියක මුලපිරීම් සිදු වූ අතර විවිධ රාජ්‍ය, රාජ්‍ය නොවන සහ දේශීය හා ජාත්‍යන්තර ලාභ නොලබන සංවිධාන විසින් ගනුදෙනු කිරීමේ පිරිවැය (Transaction Cost) අඩු කිරීමේ අපේක්ෂාවෙන් ජංගම දුරකථන යෙදුම් (Mobile App) ද 50කට අධික සංඛ්‍යාවක් සංවර්ධනය කර ඇත. මෙම සියලු මුලපිරීම්වල සාර්ථකත්වයට ප්‍රධාන වශයෙන් ගොවීන්ගේ පාර්ශ්වය හා සම්බන්ධ බාධාකාරී සාධක සහ මෙම මුලපිරීම් ක්‍රියාත්මක කිරීමට වගකිව යුතු ආයතනික තත්ත්වයන් සහ නිලධාරීන් සම්බන්ධ බාධක වශයෙන් දෙයාකාර වූ විවිධ සාධක බාධා ලෙසින් ක්‍රියාකර කරනු ලබයි. ශ්‍රී ලංකාව තුළ ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය ක්‍රියාත්මක කිරීම සඳහා මෙම දෙයාකාර වූ බාධාවන්, ඒවා මඟහරවා ගැනීමට ගොවීන්ගේ සහ නිලධාරී පාර්ශ්වයෙන් ඇති විභවතාවන් සහ ඒ සඳහා අනුගමනය කළ හැකි විසඳුම් ක්‍රියාමාර්ග හඳුනා ගැනීමට යෝජනා සැපයීම අරමුණු කරගනිමින් මෙම අධ්‍යයනය කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා බල ප්‍රදේශයන් 05ක් සහ ගොවි සංවිධාන 10ක් පාදක කරගනිමින් සිදු කරන ලදි.

මෙම අධ්‍යයනය මඟින් අනාවරණය වන පරිදි, සම්ප්‍රදායික කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාව වෙත නවතාවයෙන් එක්ව සිටින තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ආශ්‍රිත ඩිජිටල් කාෂිකාර්මික ව්‍යාප්ති සේවයට අදාළව ඩිජිටල් මෙවලම් සහ ඩිජිටල් වේදිකා බහුල ලෙස නිර්මාණය වී ඇත. එසේම ගොවි ප්‍රජාවන් විසින් එම උපාංග මඟින් ලබන ප්‍රයෝජනවල ද ප්‍රගතියක් ඇත. එම සේවාවන් භාවිතා කිරීමේ දී ගොවීන් මෙන්ම ග්‍රාමීය ව්‍යාප්ති නිලධාරීන් ද මුහුණ දෙන බාධාවන් අවම කිරීමට ඩිජිටල් කාෂිකාර්මික ව්‍යාප්ති සේවාවන් හි මෙන්ම එය භාවිතා කරන පාර්ශ්වයන් සතු ශක්තීන් හා අවස්ථාවන් නිසි ලෙස ප්‍රයෝජනයට ගනිමින් ගොවීන්ගේ හා නිලධාරීන්ගේ විභවතාවන් ඉහළ නැංවීමේ අවශ්‍යතාවයක් පවතින බව අධ්‍යයනය විසින් හඳුනාගන්නා ලදි. පවත්නා ව්‍යාප්ති සේවා පද්ධතිය තුළ පර්යේෂණ ආයතන, ව්‍යාප්ති නිලධාරීන් හා ගොවීන් අතර දැනුම, තාක්ෂණය හුවමාරු වීමේ යාන්ත්‍රණය කාර්යක්ෂම කිරීම සඳහා ඩිජිටල් කෘෂිකාර්මික මෙවලම් නිර්මාණය සම්බන්ධයෙන් ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය (National Agriculture Information and Communication Centre - NAICC) කැපී පෙනෙන කාර්යභාරයක් ඉටු කරනු ලබයි. එවැනි ආයතනයන් හඳුනාගැනීම හා ඒවායෙ හි ව්‍යුහාත්මක හා ක්‍රියාත්මක තත්ත්වය තව දුරටත් පුළුල් මට්ටමක් කරා ගෙන යාමට රාජ්‍ය අංශයේ මැදිහත් වීම අත්‍යවශ්‍ය බව අධ්‍යයනය විසින් නිගමනය කරනු ලබයි.කාෂිකාර්මික ව්‍යාප්ති සේවය තුළ හඳුනාගත් බාධාකාරී තත්ත්වයක් අවම කිරීම සඳහා ගොවීන්ගේ සහ ව්‍යාප්ති නිලධාරීන්ගේ විභවතාවන් ප්‍රයෝජනයට ගනිමින් වත්මන් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය කාර්යක්ෂම හා ඵලදායී එකක් බවට පත්කර ගැනීමට ඩිජිටල් කාෂිකාර්මික ව්‍යාප්ති සේවය සම්බන්ධයෙන් යෝජනා කිහිපයක්

අධ්‍යයනය මඟින් ඉදිරිපත් කෙරේ. එනම්, බිම් මට්ටමේ සිටින කෘෂිකාර්මික අංශයට අදාළ නිලධාරීන්ට (කෘෂිකර්ම උපදේශක නිලධාරී, තාක්ෂණික සහායක නිලධාරී, කෘෂිකර්ම පර්යේෂණ සහ නිෂ්පාදන සහකාර නිලධාරී) ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්තිය, භාවිතය හා ප්‍රවේශය ඉහළ නැංවීම. එම පුහුණුව ලත් නිලධාරීන් හරහා සෑම ගොවිජන සේවා මධ්‍යස්ථානයකම තෝරාගත් ගොවි සංවිධාන හා කාන්තා ගොවි සංවිධාන මට්ටමින් ගොවීන්ට ඩිජිටල් කෘෂි ව්‍යාප්තියට නැඹුරු වීමට ප්‍රායෝගික පුහුණුවක් ලබා දීම, සමාජ මාධ්‍ය ජාලාවන් හි කෘෂිකාර්මික ක්ෂේත්‍රයට අදාළ දැනුම හා තොරතුරු ව්‍යාප්තිය රාජ්‍ය මැදිහත් වීම හරහා නියාමනයට ලක් කිරීම, උතුරු සහ නැගෙනහිර පළාත්වල කෘෂිකාර්මික ගැටලුවලට සම්බන්ධ කෘෂි උපදේශන සේවා ඇමතුම් මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම සහ එම මධ්‍යස්ථාන ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය සමඟ සම්බන්ධ කිරීම, දුරකථන අනුවාදයට අනුව ජංගම කෘෂිකාර්මික ව්‍යාප්ති යෙදුම් (App) යාවත්කාලීන කිරීමට කෘෂිකාර්මික ව්‍යාප්ති යෙදුම් (App) නිර්මාණය කිරීමේ කාර්යයට මැදිහත් වන අදාළ ආයතනයන්ට රාජ්‍ය අංශයේ මැදිහත්වීම යටතේ තාක්ෂණික දැනුම සහ පහසුකම් සැපයීම, ඩිජිටල් ව්‍යාප්ති මෙවලම් නිර්මාණය කිරීමේ දී තරුණ කණ්ඩායම්වල කෘෂිකාර්මික සුවිශේෂතා පිළිබඳව වඩාත් සැලකිලිමත් වීම, රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරිත්වය යටතේ දැනටමත් ක්‍රියාත්මක වෙමින් පවතින ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාවන් තව දුරටත් පුළුල් කිරීම සහ දියුණු කිරීම හරහා ගොවීන් වෙත කෘෂිකාර්මික දැනුම හා තොරතුරු ඵලදායී ලෙස සන්නිවේදනය වීම අසමානතාවයකින් තොරව ලැබීමේ පසුබිම සැකසීම යන යෝජනා මෙම අධ්‍යයනය විසින් නිර්දේශ කරනු ලබයි.

පටුන

පෙරවදන		iii
ස්තුතිය		iv
විධායක සාරාංශය		v
පටුන		vii
ප්‍රස්තාර සටහන්		x
රූපසටහන්		xi
වගු සටහන්		xi
සිතියම්		xi
ඇමුණුම්		
පළමුවැනි පරිච්ඡේදය		**1**
	හැඳින්වීම	1
1.1	අධ්‍යයනයේ පසුබිම	1
1.1.1	ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය අර්ථදැක්වීම	2
1.1.2	කෘෂිකාර්මික අංශය තුළ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ භාවිතය	2
1.2	අධ්‍යයන ගැටලුව	3
1.3	ප්‍රධාන අරමුණු	4
1.3.1	විශේෂිත අරමුණු	4
1.4	අධ්‍යයනය සිදු කිරීමේ ක්‍රමවේදය	4
1.4.1	අධ්‍යයනයට අදාළ න්‍යායාත්මක හා සංකල්පීය පසුබිම	4
1.4.2	තොරතුරු රැස්කිරීම සහ විශ්ලේෂණය	5
1.4.3	අධ්‍යයන ප්‍රදේශ	6
1.4.4	දත්ත හා තොරතුරු	7
1.5	දත්ත රැස්කිරීම	7
1.5.1	දත්ත රැස්කිරීමේ ක්‍රම	7
1.5.2	දත්ත විශ්ලේෂණ ක්‍රම	8
දෙවැනි පරිච්ඡේදය		**9**
ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය		**9**
2.0	හැඳින්වීම	9
2.1	කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය හා ප්‍රධාන ව්‍යාප්ති ප්‍රවේශයන්	9
2.2	ශ්‍රී ලංකාවේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය	12

2.2.1 රාජ්‍ය නොවන සංවිධාන සහ පෞද්ගලික අංශයට අදාළ ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය 13

තෙවැනි පරිච්ඡේදය 15

ශ්‍රී ලංකාව තුළ දැනට පවතින ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාවන භාවිතය පිළිබඳ වර්තමාන තත්ත්වය 15

3.0 හැඳින්වීම 15

3.1 ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය හා මෙවලම් 15

3.2 ජාතික කෘෂිකාර්මික තොරතුරු හා සංනිවේදන මධ්‍යස්ථානය (NAICC) 15
3.2.1 1920 කෘෂිකර්ම උපදේශන සේවා අංශය 16
3.2.3 කෘෂිකර්ම වීඩියෝ අංශය 17
3.2.4 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය 18
3.3 රාජ්‍ය ආයතන, පෞද්ගලික ආයතන හා පෞද්ගලික අයිතිය සහිතව හඳුන්වා දී ඇති කෘෂිකාර්මික ජංගම දුරකතන යෙදුම් 20
3.4 ශදූඅත විශ්ලේෂණය (SWOT Analysis) 30

සිව්වැනි පරිච්ඡේදය 33

ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාවන් භාවිතා කිරීමේ දී ගොවීන් සතු විභවයන් සහ බාධක 33

4.0 හැඳින්වීම 33

4.1 අධ්‍යයනයට සහභාගී වූ ගොවීන්ගේ ප්‍රජාවිද්‍යාත්මක ලක්ෂණ 33
ප්‍රතිචාර දැක්වූ නිලධාරීන්ගේ වයස සහ අධ්‍යාපන සුදුසුකම්
4.1.2 නිලධාරීන්ගේ ස්ත්‍රී පුරුෂභාවය 33

4.2 අධ්‍යයන ප්‍රදේශයේ සාමාන්‍ය කෘෂිකර්ම ව්‍යාප්ති සේවයේ ස්වභාවය 36

4.3 ගොවීන් අතර ස්මාර්ට් ජංගම දුරකතන භාවිතය 36

4.4 ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාවන් සඳහා ගොවීන්ගේ නැඹුරුව හා දැනුවත්භාවය 37
4.4.2 ගොවීන්ගේ වයස් මට්ටම අනුව ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති මෙවලම් භාවිතයට ඇති නැඹුරුව 39
4.5 ගොවීන්ගේ ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති මෙවලම් භාවිතා කිරීමේ ස්වභාවය 40
4.6 ඩිජිටල් කෘෂිකාර්මික ජංගම දුරකතන යෙදුම් (Mobile Apps) පිළිබඳ ගොවීන්ගේ නැඹුරුව 41
4.7 ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවා භාවිතා කිරීමේ දී ගොවි මට්ටමේ බාධක 42

පස්වැනි පරිච්ඡේදය **47**

නිගමන, යෝජනා සහ අනාගත පර්යේෂණ අවශ්‍යතා **47**

5.0 හැඳින්වීම 47

5.1 අධ්‍යයනයට සහභාගී වූ නිලධාරීන්ගේ ප්‍රජා විද්‍යාත්මක ලක්ෂණ 47

5.2 ව්‍යාප්ති නිලධාරීන් හා බිම් මට්ටමේ අනෙකුත් නිලධාරීන්ගේ ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාව පිළිබඳ දැනුවත්භාවය 48

5.3 ව්‍යාප්ති නිලධාරීන් ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති මෙවලම් භාවිතා කිරීමේ ස්වභාවය 49

5.4 පෞද්ගලික ආයතන / පුද්ගලයින් හා විවිධ ව්‍යාපෘතිවල අවශ්‍යතාවයන්ට හඳුන්වා දී ඇති ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති යෙදුම භාවිතා කිරීම 50

5.5 අධ්‍යයන ප්‍රදේශය තුළව්‍යාප්ති නිලධාරීන් ඩිජිටල් කෘෂිකාර්මික ජංගම දුරකතන යෙදුම් භාවිතයට වැඩි නැඹුරුවක් නොදැක්වීමට බලපාන ලද හේතු 50

හයවැනි පරිච්ඡේදය **51**

නිගමන හා යෝජනා **51**

6.0 හැඳින්වීම 51

6.1 අධ්‍යයනයේ සොයා ගැනීම් 51

6.1.1 නිගමන 53

6.2 යෝජනා 54

ආශ්‍රිත ග්‍රන්ථ 56

ප්‍රස්තාර සටහන්

ප්‍රස්තාර අංක	4.1	ස්ත්‍රී/පුරුෂ අනුව ව්‍යාප්තිය	33
ප්‍රස්තාර අංක	4.2	වයස අනුව ව්‍යාප්තිය	34
ප්‍රස්තාර අංක	4.4	ප්‍රධාන රැකියාව අනුව ව්‍යාප්තිය	35
ප්‍රස්තාර අංක	4.5	ගොවීන් නියැලෙන ගොවිතැන් කටයුතු අනුව ව්‍යාප්තිය	35
ප්‍රස්තාර අංක	4.6	ස්මාර්ට් ජංගම දුරකතන හිමිකම අනුව ගොවීන්ගේ ව්‍යාප්තිය	37
ප්‍රස්තාර අංක	4.7	ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති මෙවලම් භාවිතා කිරීමට ඇති නැඹුරුව අනුව ගොවීන්ගේ ව්‍යාප්තිය	38
ප්‍රස්තාර අංක	4.8	ස්ත්‍රී පුරුෂ භාවය අනුව ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති මෙවලම් භාවිතා කිරීමට ඇති නැඹුරුව	38
ප්‍රස්තාර අංක	4.9	වයස අනුව ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති මෙවලම් භාවිතයට ඇති නැඹුරුව	39
ප්‍රස්තාර අංක	4.10	අධ්‍යාපන මට්ටම අනුව ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති මෙවලම් භාවිතයට නැඹුරුව	40
ප්‍රස්තාර අංක	4.10	ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති මෙවලම් භාවිතා කිරීමේ දී ගොවීන් මුහුණ දෙන ගැටලු අනුව ගොවීන්ගේ ව්‍යාප්තිය	43
ප්‍රස්තාර අංක	5.1	වයස අනුව ව්‍යාප්තිය	48
ප්‍රස්තාර අංක	5.2	අධ්‍යාපනය අනුව ව්‍යාප්තිය	48
ප්‍රස්තාර අංක	5.3	ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාව හා භාවිතයේ දැනුවත්භාවය	49
රූප සටහන්	1	Best – Fit රාමුව ආශ්‍රයෙන් අධ්‍යයනය සඳහා සකසා ගනු ලැබූ සංකල්පීය රාමුව	06
රූප සටහන්	2	ආහාර බෝග අංශයට අදාළ ප්‍රධාන ව්‍යාප්ති සේවා සැපයුම්කරුවන්ගේ සංවිධාන ව්‍යුහය	21

වගු සටහන්

වගු සටහන්	1.1	තෝරා ගත් ගොවිජන සේවා මධ්‍යස්ථාන, ගොවි සංවිධාන සහ සහභාගී වූ ගොවීන්	8
වගු සටහන්	2.1	ශ්‍රී ලංකාවේ ප්‍රධාන කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාවන්	10
වගු සටහන්	3.1	ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශයට අදාළ ක්‍රියාකාරී මට්ටමේ පවතින ඩිජිටල් ජංගම දුරකතන යෙදුම්	20
වගු සටහන්	3.4	ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාවන් හි ශක්තීන්, දුර්වලතාවන්, අවස්ථාවන් හා තර්ජන	31
වගු සටහන්	4.1	ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති මෙවලම් භාවිතා කිරීම් ස්වභාවය	41
වගු සටහන්	4.2	ඩිජිටල් කෘෂිකාර්මික ජංගම යෙදුම් භාවිතා කිරීමේ ස්වභාවය	42

සිතියම්

සිතියම්	අංක 1	අන්තර් පළාත් ව්‍යාප්ති බලප්‍රදේශ	22

ඇමුණුම්

ඇමුණුම්	අංක 1	ගූගල් පෝරමයසඳහා ප්‍රතිචාර දක්වන ලද පළාත් අන්තර් පළාත් නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ නිලධාරීන්	55
ඇමුණුම්	අංක 2	දුරකථන සාකච්ඡා සඳහා සමබන්ධ වූ පළාත් හා අන්තර් පළාත් බලප්‍රදේශයන් හි කෘෂිකර්ම අධ්‍යක්ෂ (ව්‍යාප්ති) නිලධාරීන්	58

පළමුවැනි පරිච්ඡේදය

හැඳින්වීම

1.1. අධ්‍යයනයේ පසුබිම

කෘෂිකාර්මික ව්‍යාප්තිය යනු මිනිසුන්ට ප්‍රයෝජනවත් තොරතුරු ලබා ගැනීමේ (සන්නිවේදන පැතිකඩ) අඛණ්ඩ ක්‍රියාවලියක් සේම මෙම තොරතුරු හෝ තාක්ෂණය (අධ්‍යාපන පැතිකඩ) ඵලදායි ලෙස භාවිතා කිරීමට අවශ්‍ය දැනුම, කුසලතා සහ ආකල්ප ලබා ගැනීමට එම පුද්ගලයින්ට සහාය වීම ලෙස අර්ථ දැක්විය හැකි ය (Sivayoganathan, 2020). ව්‍යාප්ති සේවයේ අවසාන අරමුණ වන්නේ මිනිසුන්ට ඔවුන්ගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා කුසලතා, දැනුම සහ තොරතුරු භාවිතා කිරීමට අවස්ථාව ලබා දීමයි.

ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාව සලකා බැලීමේ දී එය සාම්ප්‍රදායික තාක්ෂණ හුවමාරුව, පුහුණුව සහ හමුවීම, ඒකාබද්ධ කෘෂිකර්ම ව්‍යාප්තිය සහ ක්ෂේත්‍ර ආදර්ශනය ඇතුළු විවිධ ප්‍රවේශයන් අනුගමනය කරමින් කාලයාගේ ඇවෑමෙන් විකාශනය වී ඇත. මේ අතරට වර්තමානයේ එක් වූ නවතම ව්‍යාප්ති ප්‍රවේශය වන්නේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය හා ඒකාබද්ධ වූ “ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති ප්‍රවේශය” යි. මෙහි දී වගා පද්ධතිය මෙන්ම බෝග ක්ෂේත්‍රය අනුව අනුගමනය කරන ලද ව්‍යාප්ති ක්‍රමවේදයන් වෙනස් වේ. උදාහරණයක් ලෙස තේ, රබර්, පොල් සහ උක් වැනි වැවිලි බෝග, අපනයන කෘෂිකාර්මික බෝග, වාර්ෂික බෝග සහ පශු සම්පත් අංශයන් හි ගොවි අවශ්‍යතා මත පදනම් වූ ඔවුන්ගේම ව්‍යාප්ති සේවාවක් ඇත. මෙහි දී කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය සැපයීමේ කාර්යය රාජ්‍ය අංශය ප්‍රධාන වශයෙන් සිදුකරනු ලබන අතර ඊට අමතරව පෞද්ගලික අංශය සහ රාජ්‍ය නොවන සංවිධාන විසින් සිදු කරනු ලබයි. ශ්‍රී ලංකාවේ ඉහළ ජනගහනය මඟින් ආහාර සඳහා ඇති ඉල්ලුම වැඩි වීම, ආහාර නිෂ්පාදනය හා ආහාර සැපයුම සීඝ්‍ර ලෙස වර්ධනය කිරීමේ අවශ්‍යතාව පෙන්වා දෙනු ලබයි. ඒ සඳහා දැනට පවතින වගාබිම්වල ඵලදායිතාවය ඉහළ නැංවීම අත්‍යවශ්‍ය වේ. නව බීජ ප්‍රභේද, සංස්කෘතික භාවිතයන් සහ ගොවිතැන් පද්ධති, සම්ප්‍රදායික ගොවිතැන් ක්‍රමවලින් විද්‍යාත්මක ගොවිතැන් ක්‍රමවලට මාරු වීම යන සාධක භූමියේ ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා වඩාත් තීරණාත්මක සාධක වේ. කෙසේ වෙතත් ගොවීන් විසින් උසස් කෘෂිකාර්මික තාක්ෂණයන් අනුගමනය කිරීමේ දී ඒ සඳහා බාධා කෙරෙන, දැනුම සහ දැනුම භාවිතය අතර සැලකිය යුතු මට්ටමේ පරතරයක් පවතී (Significant knowledge - Practice Gap). මෙම පරතරය මඟහරවා ගැනීම සඳහා ප්‍රධාන විසඳුමක් ලෙසින් තීරණ ගැනීමේ දී සහ සම්පත් උපයෝගී කරගැනීමේ දී ගොවීන්ට සහය වන නියෝජිතයින් ද සමඟින් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය ඉස්මතු වන අතර මෙම ව්‍යාප්ති ජාලය විද්‍යාත්මක, තාක්ෂණික සහ අධ්‍යාපනික දියුණුව සඳහා වාහකයක් ලෙස ක්‍රියා කරන සමස්ත කෘෂිකාර්මික සංවර්ධනය සඳහා පදනම වේ (Karim, 1999; Kashem and Halim, 1999; Sivayoganathan, 2020).

කෙසේ වෙතත් ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ව්‍යාප්ති පද්ධතිය, එහි අපේක්ෂිත ප්‍රතිලාභ සාක්ෂාත් කර ගැනුමට බාධා කරන අභියෝග රැසකට මුහුණ දී සිටී. ජාතික කෘෂිකාර්මික ව්‍යාප්ති ප්‍රතිපත්තියක් නොමැතිකම, ව්‍යාප්ති වෘත්තිකයින්ගේ හිඟය, ව්‍යාප්ති වෘත්තිකයින්ගේ පහසුකම් හා වෘත්තීමය ගැටලු සහ කාෂිකාර්මික ව්‍යාප්ති අංශය තුළ ප්‍රමාණවත් පර්යේෂණ සංවර්ධනය නොවීම ශ්‍රී ලංකාවේ රාජ්‍ය ව්‍යාප්ති පද්ධතියට එල්ල වන පීඩනය තීව්‍රකර ඇත (Sivayoganathan, 2020). මෙම තත්ත්වයට පිළියම් ලෙසින් පෞද්ගලික අංශයේ වෙළඳපොළ නැඹුරු ව්‍යාප්ති ප්‍රවේශයන් සමඟ රාජ්‍ය අංශයේ ව්‍යාප්ති පද්ධති ඒකාබද්ධව ක්‍රියාත්මක වීමේ නැඹුරුවක් පවතී (Wanigasundara, 2015). එසේම තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ උපාංග මෙන්ම සමාජ මාධ්‍ය ආශ්‍රිත මෙවලම් භාවිතා කිරීම ද නව ව්‍යාප්ති ප්‍රවේශයන් ලෙස හඳුනා ගෙන ඇත (ලූර්දු, 2022). තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතා කරමින් ව්‍යාප්ති සේවා සැපයීම “ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය” යි. ගොවීන් ගොවීන් අතර, ගොවීන් සහ ව්‍යාප්ති නිලධාරීන්, ව්‍යාප්ති විශේෂඥයින්, විද්‍යාඥයින්, පර්යේෂකයින්, වෙළඳපොළ හා සැපයුම්කරුවන්, යෙදවුම් සපයන්නන් අතර ව්‍යාප්ති කාර්ය සිදු වීමට ඩිජිටල් මෙවලම්, සමාජ මාධ්‍ය,

ජංගම දුරකථන, විද්‍යුත් තැපැල, වීඩියෝ, ශ්‍රව්‍ය - දෘශ්‍ය මාධ්‍ය, යන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මෙවලම් භාවිතා කෙරේ (Herath et al., 2021).

1.1.1. ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය අර්ථදැක්වීම

ඩිජිටල් කෘෂිකර්ම ව්‍යාප්ති සේවය අර්ථගැන්වීම (e - Extension Service) සඳහා විවිධ නිර්වචන ඇත. Biradar et al (2023) ට අනුව, "ගොවින්ට සහ කෘෂිකාර්මික අංශයේ අනෙකුත් පාර්ශ්වකරුවන්ට කෘෂිකාර්මික දැනුම සහ සේවා ව්‍යාප්ත කිරීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (Information and Communication Technology-ICT) භාවිතා කිරීම ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය යි" (Biradar et al, 2023, පි. 609). එමෙන්ම ගොවින්, ව්‍යාප්ති සේවකයින්, පර්යේෂකයින් පහ ප්‍රතිපත්ති සම්පාදකයින් සඳහා කාලෝචිත සහ සුදුසු තොරතුරු සැපයීම සඳහා ජංගම දුරකතන, ලෝක ව්‍යාප්ත වෙබ්, සමාජ මාධ්‍ය වේදිකා සහ වෙනත් ඩිජිටල් වේදිකා වැනි විවිධ තොරතුරු තාක්ෂණ උපකරණ භාවිතා කරන බව ඔහු වැඩි දුරටත් පැහැදිලි කරයි. Mulungu et al (2023) අනුව, ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය, ඊ- ව්‍යාප්තිය (e-Extension), තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පාදක කරගත් ව්‍යාප්තිය ලෙස හඳුන්වා දී ඇත. ගොවීන්ට සහ කෘෂිකාර්මික ක්ෂේත්‍රයට අදාළ අනෙකුත් පාර්ශ්වකරුවන්ට කෘෂිකාර්මික තොරතුරු හා උපදෙස් සඳහා උචිත වේලාවට පහසුවෙන් ප්‍රවේශ විය හැකි පරිදි ජංගම දුරකථන, අන්තර්ජාලය, කෘත්‍රිම බුද්ධිය වැනි ඩිජිටල් මෙවලම් භාවිතා කිරීම ලෙස ද මෙය අර්ථ දක්වා ඇත. "ඩිජිටල්/ විද්‍යුත් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය" යනු කෘෂිකාර්මික ව්‍යාප්ති සේවා සඳහා නවීන ප්‍රවේශයක් වන අතර ඒ සඳහා වෙබ් අඩවි, ජංගම යෙදුම් සහ සමාජ මාධ්‍ය වැනි විද්‍යුත් මාධ්‍ය හරහා කෘෂිකාර්මික අධ්‍යාපනය පුහුණුව හා සම්පත් ලබා ලබා දීම ගොවීන්ට නිවැරදි තීරණ ගැනීමට හා ඔවුන්ගේ ගොවිතැන් පිළිවෙත් වැඩිදියුණු කිරීමට හැකියාව ලබාදීම සිදුකරයි (NAICC, 2024).

මෙම අර්ථදැක්වීම් මඟින් ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය මඟින් සිදුවන ප්‍රධාන මෙහෙයුම් කරුණු හතරක් හඳුනා ගත හැකි ය. එනම්, ගොවින් සඳහා තාක්ෂණය මත පදනම් වූ ව්‍යාප්ති හා උපදේශන සේවාවක් ලෙස කටයුතු කිරීම, කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය ඩිජිටල් තාක්ෂණය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය හා ඒකාබද්ධ කිරීම සහ ගොවීන්ට පුද්ගලික වශයෙන් තම වගා කටයුතු ආශ්‍රිත අවශ්‍යතා සපුරා ගැනීමට සුදුසු ඩිජිටල් උපදේශන වේදිකාවක් සැපයීම යි (Thapa, 2025). මීට අමතරව ඉහත අර්ථදැක්වීම මඟින් සුවිශේෂී මෙහෙයුම් කාර්යයක් වන්නේ අවශ්‍ය ඕනෑම වේලාවක දී සහ අවස්ථාවක දී දැනුම හා තොරතුරු ලබා ගැනීමේ හැකියාව පැවතීම යි.

1.1.2. කෘෂිකාර්මික අංශය තුළ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ භාවිතය

ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශයට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (ICT) එක්කර ගැනීම ප්‍රථමයෙන් සිදු වූයේ, 2004 වර්ෂයේ දී තොරතුරු බෙදා හැරීමේ යාන්ත්‍රණයක් ලෙස සයිබර් කෘෂිකාර්මික ව්‍යාප්ති ව්‍යාපෘතියේ ආරම්භයත් සමඟ ය. 2004 වර්ෂයේ සිට 2006 වර්ෂය දක්වා කාලය තුළ ගොවිජන සේවා මධ්‍යස්ථානවල සයිබර් කෘෂිකර්ම ව්‍යාප්ති ඒකක 45ක් ස්ථාපිත කිරීම මඟින් මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. ඉදිරි වසර දෙකක කාලය තුළ ජාතික කෘෂිකාර්මික පර්යේෂණ හා ව්‍යාප්ති පද්ධතියේ සංවර්ධනය අරමුණු කර ගනිමින් විද්‍යුත් පාලනයේ (e-governance) සීඝ්‍ර සංවර්ධනයක් ද සහිතව මෙම මධ්‍යස්ථානයන් වෙත අන්තර්ජාල සම්බන්ධතා ලබා දෙන ලදී. මෙයට අමතරව, පර්යේෂණ සහ ව්‍යාප්ති පද්ධතිය තුළ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතය ආරම්භ වීමත් සමඟම කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් 1920 ක්ෂණික ඇමතුම් අංකය හරහා ගාස්තු රහිත (Toll Free) කෘෂිකාර්මික ව්‍යාප්ති හා උපදේශන සේවාවක් සපයන ලදි. එමඟින් ගොවීන් සහ සාමාන්‍ය ජනතාව අතර තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතයේ පුළුල් වීමක් සිදු විය. එසේම කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් පිහිටුවන ලද අන්තර් ක්‍රියාකාරී වෙබ් මෙවලමක් වන "සයිබර් කෘෂිකාර්මික විකිපීඩියාව" නවතම හඳුන්වා දීමකි. මේවා හැරුණු විට විවිධ රාජ්‍ය, රාජ්‍ය නොවන සහ දේශීය හා ජාත්‍යන්තර ලාභ නොලබන සංවිධාන විසින් ගනුදෙනු කිරීමේ පිරිවැය (Transaction Cost) අඩු කිරීමේ අපේක්ෂාවෙන් බෝග වගා කිරීම සහ අලෙවි කිරීම සඳහාත් ඒ හරහා දැනුවත්ව තීරණ ගැනීමට, ඉහළ ලාභ සහ උසස් ජීවන තත්ත්වයන් අත්පත් කර ගැනීමත් සඳහා පහසුකම් සැලසීමට ජංගම දුරකථන

පදනම් කරගත් යෙදුම් (Mobile based Application) 50කට අධික සංඛ්‍යාවක් සංවර්ධනය කර ඇත (ඇමුණුම 1).

නමුත් මෙම සියලු ඩිජිටල් භාවිතයන් හි සාර්ථකත්වයට ප්‍රධාන ලෙස බලපානු ලබන්නේ, මෙම සේවාවන් වෙත ගොවීන්ගේ ඇති නැඹුරුව සහ ප්‍රවේශයත්, ඩිජිටල් භාවිතයන් ක්‍රියාත්මක කරන ව්‍යාප්ති නිලධාරීන්ගේ ක්‍රියාකාරීත්වයත් වේ. ඒ අනුව, ශ්‍රී ලංකාව තුළ ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාව ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට ගොවීන්ගේ හා ව්‍යාප්ති නිලධාරින්ගේ මට්ටමේ දී පවත්නා බාධක හඳුනා ගැනීමට මෙන්ම එම බාධක සඳහා විසඳුම් යෝජනා කිරීම මෙම පර්යේෂණ අධ්‍යයනයේ අපේක්ෂාව වේ.

1.2. පර්යේෂණ ගැටලුව

කෘෂිකර්මාන්තය තුළ ඩිජිටල් කාෂිකාර්මික ව්‍යාප්ති සේවය ක්‍රියාත්මක කිරීම ඔස්සේ කාලීන වෙළඳපොළ මිල තොරතුරු, යෙදවුම් මිල සහ පාරිභෝගික ප්‍රවණතා පිළිබඳව ගොවීන්ට වේගවත් ලෙස දැනුවත් වීමේ හැකියාව සලසා දී ඇති අතර, එය ඔවුන්ගේ ජීවනෝපාය වර්ධනය කිරීම සඳහා ද උපකාර වී ඇත. එමෙන්ම, මෙම තාක්ෂණ භාවිතය ඔස්සේ කේවල් කිරීමේ හැකියාවන් ද ගොවීන්ට උදාකර දී ඇත. එසේම, නව තාක්ෂණයන් පිළිගැනීම සඳහා ගොවීන්ව නැඹුරු කරවීම ද තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ඇතුළත් ව්‍යාප්ති සේවය වෙත පැවරුණු වැදගත් භූමිකාවකි. නමුත්, ගොවීන් අතර මෙන්ම ව්‍යාප්ති නිලධාරීන් අතර ද තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය හරහා අදාළ තාක්ෂණයන් ලබා ගැනීම සහ භාවිතය සම්බන්ධයෙන් සමාන වූ තත්ත්වයක් නොමැත. මෙම තාක්ෂණයේ අසමාන ලබාගැනීම සහ භාවිතය නිසා, ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය ක්‍රියාත්මක කිරීම සඳහා සමාන ප්‍රවේශයක් සැලසීම, ගොවිතැන් ක්‍රමවල විප්ලවීය පරිවර්තනයක් සිදුකිරීම සහ ඵලදායිතාව වැඩිදියුණු කිරීම යනාදිය තවමත් අභියෝගයන් මත රඳා පවතී (Rohila et al., 2017). ඒ අනුව මෙම අධ්‍යයනයේ ප්‍රධාන ගැටලුව වන්නේ, ගොවීන් හා ව්‍යාප්ති නිලධාරීන් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය හරහා තාක්ෂණය භාවිතා කිරීම හා ලබා ගැනීමේ පවතින අසමානතාවය නිසා ශ්‍රී ලංකාව තුළ ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාව ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට ගොවීන්ගේ හා ව්‍යාප්ති නිලධාරීන්ගේ මට්ටමේ දී පවත්නා ගැටලු, බාධාවන් ලෙස ඉදිරියට පැමිණීමයි.

තිරසාර කෘෂිකර්මාන්තයක් කරා යෑමේ දී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය හා කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාව ඒකාබද්ධ වූ ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවයක් අත්‍යවශ්‍ය වන බැවින්, එය සාර්ථකව සිදුකර ගැනීම සඳහා මෙම අසමානතාවයන්ට හේතු වන ගැටලු සහ ඒවා අවම කිරීමට අවැසි විභවයන් හඳුනා ගැනීම අත්‍යවශ්‍ය වේ. සාහිත්‍ය විමර්ශනයන් විසින් ද පෙන්වා දෙන පරිදි ගොවීන්ගේ මට්ටමේ දී සහ නිලධාරීන්ගේ මට්ටමේ දී යන දෙකෙහිම පවතින මෙම අසමාන තත්ත්වයන්ට බලපාන ගැටලු සඳහා හේතු වන කරුණු හඳුනා ගැනීමකින් තොරව ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවයේ දියුණුව සඳහා රජය විසින් සිදු කරනු ලබන මැදිහත්වීම ඵලදායක නොවනු ඇත. එබැවින් ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය හා සම්බන්ධ මෙම පර්යේෂණ ගැටලුව හා සම්බන්ධ විද්‍යාත්මක තොරතුරු පිළිබඳ පරතරය සම්පූර්ණ කිරීම මෙම පර්යේෂණ අධ්‍යයනයේ ඉලක්කය වන අතර, මෙම පර්යේෂණ ගැටලුවට ආමන්ත්‍රණය කිරීම සඳහා පහත සඳහන් පර්යේෂණ ප්‍රශ්න උපයෝගී කරගනු ලැබිණි.

(1) ශ්‍රී ලංකාවේ දැනට පවතින ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවා මෙවලම් සහ භාවිතා කිරීමේ වත්මන් තත්ත්වය කෙබඳුද?

(2) ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාව ක්‍රියාත්මක කිරීමට සහ සංවර්ධනය කිරීමට ඇති නිලධාරීන්ගේ මට්ටමේ විභවයන් සහ බාධක මොනවාද සහ ඒ සඳහා ඇති විසඳුම් කවරේ ද?

(3) ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාව ක්‍රියාත්මක කිරීමට සහ සංවර්ධනය කිරීමට ගොවීන්ගේ මට්ටමේ විභවයන් සහ බාධක මොනවාද සහ එම බාධක සඳහා විසඳුම් මොනවා ද?

1.3. පර්යේෂණයේ ප්‍රධාන අරමුණ සහ සුවිශේෂී අරමුණු

1.3.1. ප්‍රධාන අරමුණ

මෙම **පර්යේෂණයේ** ප්‍රධාන අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාවන් භාවිතයේ ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා විසඳුම් යෝජනා කිරීමට ඒ සම්බන්ධයෙන් වූ වත්මන් පසුබිම පිළිබඳ ගවේශනාත්මක අධ්‍යයනයක නියැළීමයි.

1.3.2. සුවිශේෂී අරමුණු

1. ශ්‍රී ලංකාව තුළ දැනට පවතින ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවා මෙවලම් සහ භාවිතය පිළිබඳ අධ්‍යයනය කිරීම;
2. ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවා භාවිතා කිරීමේ හා ලබාගැනීමේ දී ගොවීන්ගේ මට්ටමේ ඇති අසමානතාවයන්, ගැටලු සහ විභවයන් අධ්‍යයනය කිරීම;
3. ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවා භාවිතා කිරීමේ හා ලබාගැනීමේ දී නිලධාරීන්ගේ මට්ටමේ ඇති අසමානතාවයන්, ගැටලු සහ විභවයන් අධ්‍යයනය කිරීම;
4. ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාව ඵලදායී ලෙස භාවිතා කිරීම සඳහා නිගමන හා නිර්දේශ සැපයීම.

1.4. ක්‍රමවේදය

1.4.1. න්‍යායාත්මක පසුබිම

මෙම අධ්‍යයනය කුරුණෑගල දිස්ත්‍රික්කයට අදාළව ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාවන් භාවිතයේ දී සහ ඒවා හඳුන්වා දීමේ දී ගොවීන්ගේ මට්ටමේ මෙන්ම නිලධාරීන්ගේ මට්ටමේ විභවයන් සහ බාධක මොනවා ද සහ ග්‍රාමීය ගොවි ප්‍රජාවන්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා ඒවා ශක්තිමත් කළ හැකි ආකාරය තේරුම් ගැනීමට ඉලක්කගත වේ. ඒ අනුව කෘෂිකාර්මික අංශයේ ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාවන් හි අභියෝග සහ විභවයන් විශ්ලේෂණය කිරීමේ දී සන්නිවේදනය සහ සංවර්ධන අධ්‍යයනයන්ට අදාළ න්‍යායන් හි මෙම අධ්‍යයනයට ඇති අදාළත්වය හඳුනා ගැනීම වඩාත් වැදගත් වේ. ඒ අනුව සන්නිවේදනය හා සංවර්ධන අධ්‍යයනයන්ට අදාළව ඩේවිස් (1989) සහ එවරට්ස් රොජර්ස් (2014) විසින් හඳුන්වා දෙනු ලැබූ 'තාක්ෂණය පිළිගැනීමේ න්‍යාය' (Technology Acceptance Theory) සහ 'නවෝත්පාදන න්‍යාය' (Diffusion of Innovations Theory) මෙහි දී වැදගත් වේ. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ භාවිතය සම්බන්ධයෙන් සියලු දෙනා අතර සමාන දායකත්වයක් සිදු නොවන්නේ මන්දැයි අවබෝධ කර ගැනිමට මෙම න්‍යායන් වඩාත් උපකාරී විය.

එවරට්ස් රොජර්ස් (2014) විසින් හඳුන්වාදෙන ලද "නවෝත්පාදන ව්‍යාප්ති න්‍යායෙන්" පැහැදිලි කෙරෙන්නේ නව තාක්ෂණයක් හෝ නව අදහසක් සමාජ පද්ධතියක් පුරා පැතිර යන්නේ කෙසේද? එසේ පැතිර යන්නේ ඇයි? සහ එය සිදුවන්නේ කුමන ප්‍රමාණයකින් ද (අනුපාතයකින් ද) යන්න පිළිබඳව යි. මෙම න්‍යායේ ප්‍රධාන අංග වන්නේ,

- නවෝත්පාදනය, එම නවෝත්පාදනය හඳුන්වා දෙන සන්නිවේදන මාධ්‍ය,
- මෙම නවෝත්පාදනයන් වෙත ගොවීන් සහ ආයතන නිලධාරින් හුරුවන කාලරාමුව,
- නවෝත්පාදනයන් ව්‍යාප්ත වන සමාජ පද්ධතිය ආදිය යි.

මෙම අංග විශ්ලේෂණය කිරීම මඟින් ගොවීන්ගේ සහ නිලධාරින්ගේ නවෝත්පාදනයන් සම්බන්ධයෙන් පවත්නා මතවාදයන්, මෙවැනි නවෝත්පාදකයන් සඳහා හුරු වීමේ දී පවත්නා බාධක සහ ගොවීන් එම තාක්ෂණයන් වෙත නැඹුරු වීමේ අදියරයන් හඳුනා ගැනීමට හැකි විය.

ඩේවිස් (1989)ට අනුව තාක්ෂණය පිළිගැනීමේ න්‍යායෙන් (Technology Acceptance) පැහැදිලි කෙරෙන්නේ පුද්ගලයින් නව තාක්ෂණය වෙත යොමු වීම හා සම්බන්ධ හැසිරීම (User adoption behavior of new technology) පිළිබඳව ය. නව තාක්ෂණයක් වෙත පුද්ගලයෙකු යොමු වීමට ඇතිවන කැමැත්ත කෙරෙහි ප්‍රධාන සාධක දෙකක් බලපානු ලබන බව ඩේවිස් විසින් යෝජනා කරයි. එනම්,

(1). තාක්ෂණය භාවිතයේ ප්‍රයෝජනවත් බව ගැන දැනුවත් වීම නිසා සහ

(2). තාක්ෂණය භාවිතයේ පහසුව ගැන දැනුවත් වීම යනුවෙනි.

ඒ අනුව මෙම අධ්‍යයනයේ දී ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවා සන්දර්භය තුළ වර්තමානය වන විට ඩිජිටල් කෘෂිකර්ම ව්‍යාප්තිය සඳහා භාවිතා වන සේවාවන් ලෙස, දුරකථන මාර්ග ඔස්සේ සිදු කරනු ලබන කෘෂි උපදේශන සේවා, SMS/ කෙටි පණිවුඩ සේවා, සමාජ මාධ්‍ය ජාල (WhatsApp, Facebook, YouTube, blogs කෘෂි තොරතුරු සේවාවන් සඳහා වන Google පිටු), ජංගම දුරකථන යෙදුම් (Mobile apps), කළමණාකරණ තොරතුරු පද්ධති (Management information systems -MIS) සහ විද්‍යුත් තැපැල (e mail) භාවිතා කිරීමේ ප්‍රතිලාභ සහ සරල බව ගොවීන් සහ අදාළ නිලධාරීන් වටහා ගන්නා ආකාරය මෙම මෙම න්‍යාය මඟින් තේරුම් ගැනීමට හැකි වේ. සමහර ගොවීන් මෙම තාක්ෂණයන් පහසුවෙන් හා කැමැත්තෙන් වැළඳ ගන්නා නමුත් තවත් සමහරෙක් මෙම ඩිජිටල් තාක්ෂණයන්ට ප්‍රතිවිරෝධී හෝ නොදැනුවත්ව සිටිමට උත්සහ දරති. එම න්‍යාය අනුව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතා කිරීම හා පිළිගැනීම සම්බන්ධයෙන් ගොවි ප්‍රජාව අතරත් ව්‍යාප්ති නිලධාරීන්-නිලධාරින් අතරත් අසමාන වූ තත්ත්වයක් ගොඩනැගෙන බව පැහැදිලි වේ. ඒ අනුව ගොවීන් හා ව්‍යාප්ති නිලධාරීන් නව තාක්ෂණයන් වෙත නැඹුරු වීමට හෝ නොවීමට හේතු හඳුනා ගැනීමට සහ ඇගැයීමට මෙම න්‍යායන් උපකාරී විය.

ඒ අනුව, ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාවන් හි දියුණුවට බලපාන ගොවීන්ගේ අදහස් සහ ගැටලු ඩිජිටල් පද්ධතියේ වර්තමාන තත්ත්වය හා ඉදිරි දර්ශනයන්, නිලධාරීන්ගේ අදහස් ආදිය පිළිබඳව ඒකාබද්ධ වූ සංකල්පගත ප්‍රවේශයක් සහිතව පරිපූර්ණ අධ්‍යයනයක් සිදුකිරීමට සන්නිවේදනය හා සංවර්ධන අධ්‍යයනයන්ට අදාළ වූ මෙම න්‍යායන්ගේ මාර්ගෝපදේශකත්වය ඉහළ වැදගත්කමක් අධ්‍යයනය වෙත සපයන ලදි.

1.4.2. ඵලදායක ලෙසින් ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාව වෙත ගමන් කිරිම

ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාව කාලීන අවශ්‍යතාවයක් වීමට හේතුවන්නේ පවත්නා කෘෂිකාර්මික ව්‍යාප්ති සේවයේ ඇති ගැටලුකාරී තත්ත්වයන් වේ. පුළුල් ජාතික කෘෂිකාර්මික ව්‍යාප්ති ප්‍රතිපත්තියක් නොමැති වීම, සම්පත් හා යටිතල පහසුකම් හිඟකම, ප්‍රවීණත්වයෙන් යුත් ව්‍යාප්ති වෘත්තිකයින්ගේ හිඟය සහ ව්‍යාප්ති සේවයට අදාළ පර්යේෂණ හිඟකම වැනි ගැටලු මඟහරවා ගැනීමට වඩාත් කාර්යක්ෂම හා ඵලදායී, අඩු මෙහෙයුම් පිරිවැයක් සහිත සහ රජයට අඩු බරක් අපේක්ෂාවෙන් ව්‍යාප්ති සේවය සැපයිම සඳහා විවිධාංගීකරණය වූ සන්නිවේදන මාධ්‍ය එනම්, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය මත පදනම් වූ ඩිජිටල් මැදිහත්වීම් වෙත නැඹුරු වීම වර්තමානයේ වඩාත් ඵලදායක වන බව හඳුනා ගෙන ඇත (Wanigasundara and Atapattu, 2019).

අධ්‍යයනය සංකල්ප ගත කිරීම අනුව ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාව වෙත ගමන් කිරිමේ දී ඊට අදාළ ප්‍රධාන පාර්ශ්වයන් දෙක වූ ගොවි ප්‍රජාව සහ ව්‍යාප්ති නිලධාරීන්ට බලපාන සාධක 4ක් හඳුනා ගත හැකි වේ. එනම්, තාක්ෂණික සාධක, සමාජ ආර්ථික සාධක, ආයතනික හා ප්‍රතිපත්තිමය සාධක සහ ව්‍යාප්ති පද්ධතියට අදාළ සාධක වශයෙනි. මෙම සාධක සමඟ නව තාක්ෂණය වෙත අනුවර්තනය වීමට බලපාන සාධක වූ අදාළ ඩිජිටල් තාක්ෂණය භාවිතයෙන් ලැබෙන සාපේක්ෂ වාසි, කාර්යය සඳහා ගැළපීම, සංකීර්ණතාවයේ තත්ත්වය, අත්හදා බැලීමේ හැකියාව සහ නිරීක්ෂණ හැකියාව යන සාධක මෙන්ම එම තාක්ෂණය පිළිගැනිමට අදාළ සාධක ලෙසින් භාවිතයේ පහසුව, ප්‍රයෝජනවත් බව වටහා ගැනීම, ආකල්ප සහ භාවිතයට ඇති අභිප්‍රාය යන සාධක මත ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවයෙන් ගොවීන්ට හා නිලධාරීන්ට ඇති ඵලදායකත්වය තීරණය වේ. කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය තුළ ඩිජිටල්

කෘෂිකාර්මික ව්‍යාප්තිය භාවිතය කාර්යක්ෂම වීමෙන් ගොවීන්ට සහ ව්‍යාප්ති නිලධාරීන්ට වැඩි දියුණු කළ තොරතුරු වෙත ප්‍රවේශය වීමෙන් ඒ හරහා නිවැරදි තීන්දු තීරණ ගත හැකි වීමත්, ඒ නිසා සමස්ත නිෂ්පාදනයේ ඉහළ යාමක් ද සිදු වේ.



රූප සටහන් අංක 1.1: සංකල්ප රාමුව
මූලාශ්‍රය: පර්යේෂකගේ සැකසීමකි, 2024

1.4.3. අධ්‍යයන ප්‍රදේශය

මෙම පර්යේෂණය සඳහා කුරුණෑගල දිස්ත්‍රික්කය පාදක කරගනු ලැබිණි. හිතාමතාම (Purposively) මෙම දිස්ත්‍රික්කය තෝරා ගැනිමට හේතු වූයේ, මෙම දිස්ත්‍රික්කය තෙත් හා වියළි කලාපයන්ට අතරමැදි කෘෂිකාර්මික කලාපයක් ලෙසින් විවිධාංගීකරණය වූ ගොවිතැන් පද්ධතියක් සහිත විවිධ ජනවර්ග ජීවත්

වන ශ්‍රී ලංකාවේ ප්‍රධාන කෘෂිකාර්මික දිස්ත්‍රික්කයක් වීමයි. එසේම, මෙම දිස්ත්‍රික්කයේ පවත්නා කෘෂි - පාරිසරික විවිධත්වය තුළ ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාව පිළිබඳ අධ්‍යයනය කිරීමටත් ප්‍රධාන වගා පද්ධති (වී, එළවළු, පලතුරු, ක්ෂේත්‍ර බෝග සහ පශු සම්පත්) සියල්ල නියෝජනය කෙරෙන ගොවීන් කණ්ඩායම් තෝරා ගැනීමටත් සුදුසු දිස්ත්‍රික්කයක් වන බැවින් අධ්‍යයන ප්‍රදේශය ලෙස අනෙකුත් දිස්ත්‍රික්ක අතරින් මෙම දිස්ත්‍රික්කයට ප්‍රමුඛත්වය දෙන ලදි.

1.4.4. දත්ත හා තොරතුරු

මෙම පර්යේෂණ අධ්‍යයනය සඳහා අදාළ නිලධාරීන් සමඟ කෙරෙන සම්මුඛ සාකච්ඡා සහ දුරකථන සාකච්ඡා, ඉලක්කගත සම්මුඛ සාකච්ඡා මඟින් රැස්කරනු ලබන ප්‍රාථමික දත්ත මෙන්ම මේ සම්බන්ධයෙන් සිදු කළ සාහිත්‍ය විමර්ශනය, පර්යේෂණ වාර්තා, අදාළ ලේඛනවලින් ලබා ගත් ද්විතියික දත්ත යා තොරතුරු ද උපයෝගී කරගනු ලැබිණි. කෘෂිකාර්මික අංශයේ ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය පිළිබඳ ගොවි මට්ටමේ සංජානනය (Farmer perceptions), ආයතනික ඉදිරි දර්ශන (Institutional perspectives) සහ දැනට පවත්නා ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති මෙවලම් හඳුනා ගැනීමට, රැස් කරගනු ලබන ප්‍රාථමික දත්ත උපයෝගී කර ගන්නා ලදි. අධ්‍යයන සොයා ගැනීම් තව දුරටත් පෝෂණය කිරීමටත්, සන්දර්භගත කිරීමටත් ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්තිය සහ භාවිතයන් පිළිබඳ අමතර අවබෝධයක් ලබා ගැනීමටත් ද්විතියික දත්ත උපයෝගී කර ගන්නා ලදි.

1.5. දත්ත රැස්කිරීම

1.5.1 දත්ත රැස්කිරීමේ ක්‍රම

මෙම පර්යේෂණ අධ්‍යයනය සඳහා පහත සඳහන් දත්ත රැස් කිරීමේ ක්‍රම භාවිතා කරන ලදි.

(අ) **අදාළ නිලධාරීන් සමඟ කෙරෙන සම්මුඛ සාකච්ඡා සහ දුරකථන සාකච්ඡා** (Key Informant Interview):
කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානයේ (NAICC) ඩිජිටල් ව්‍යාප්ති සන්නිවේදනය හා සම්බන්ධ නිලධාරීන්, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ අදාළ නිලධාරීන්, කෘෂිකර්ම අමාත්‍යාංශයේ අදාළ නිලධාරීන්, රාජ්‍ය නොවන සංවිධාන, පෞද්ගලික අංශයේ අදාළ නිලධාරීන් ඇතුළු ප්‍රධාන පාර්ශ්වකරුවන් සහ ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා (FGD) 10ක් සිදු කිරීම සඳහා සම්බන්ධ වූ ගොවිජන **සේවා මධ්‍යස්ථානවලට** අදාළ ව්‍යාප්ති නිලධාරීන් (කෘෂිකර්ම උපදේශක නිලධාරීන්) සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත් වූ අතර එම සම්මුඛ සාකච්ඡා මඟින් ආයතනික බාධාවන්, ප්‍රතිපත්ති සඳහා ඉදිරි දර්ශන සහ ඩිජිටල් ව්‍යාප්ති සේවාව ක්‍රියාත්මක කිරීමට ඇති බාධාවන් පිළිබඳ අවබෝධයක් ලබා ගන්නා ලදි.

(ආ) **ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා** (Focus Group Discussions)**:**
අධ්‍යයනය සඳහා තෝරාගත් කුරුණෑගල දිස්ත්‍රික්කයේ වී, එළවළු, පලතුරු, ක්ෂේත්‍ර බෝග සහ පශු සම්පත් යන ප්‍රධාන වගා පද්ධති ආවරණය වන සේ තෝරාගත් **ගොවිජන සේවා** මධ්‍යස්ථාන 5න් අහඹු ලෙස ගොවි සංවිධාන 2 බැගින් තෝරා ගනිමින් එම ගොවි සංවිධානවලින් ගොවීන් 10-15 ත් අතර සංඛ්‍යාවක් ඉලක්ක කරගනිමින් කණ්ඩායම් සාකච්ඡා 10ක් සිදු කරන ලදි. ඒ සඳහා සහභාගී වූ මුළු ගොවීන් සංඛ්‍යාව 128ක් වූ අතර ව්‍යාප්ති නිලධාරීන් සහ බිම් මට්ටමේ කෘෂිකාර්මික නිලධාරීන් 22ක් විය. මෙම සාකච්ඡා 10 සිදු කරමින් ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාවන් සම්බන්ධයෙන් ගොවීන්ගේ අත්දැකීම්, අදහස් හා ඔවුන්ගේ කැමැත්ත, තාක්ෂණයට ප්‍රවේශය , ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවා පිළිබඳ දැනුවත්භාවය සහ නව ක්‍රම අනුගමනය කිරීමට පවතින හැකියාවන්, ඒවා භාවිතා කිරීමේ දී පවතින බාධාවන් වැනි සාධක ගවේශනය කිරීමට අවශ්‍ය දත්ත හා තොරතුරු සපයා ගන්නා ලදි. එමෙන්ම ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා 10 සඳහා සම්බන්ධ වූ ගොවි කණ්ඩායම් වෙත

ඉදිරිපත් කෙරුණු කෙටි ප්‍රශ්නාවලී මඟින් එම ගොවීන්ගේ සමාජීය ආර්ථික අංශයේ දත්ත හා තොරතුරු සපයා ගන්නා ලදි.

වගු අංක 1.1: තෝරා ගත් ගොවිජන සේවා මධ්‍යස්ථාන, ගොවි සංවිධාන සහ සහභාගී වූ ගොවීන් සංඛ්‍යාව

දිස්ත්‍රික්කය	ගොවිජන සේවා මධ්‍යස්ථාන	ගොවි සංවිධානය	ගොවීන් සංඛ්‍යාව
කුරුණෑගල	මහව	උඩුවේරිය	13
		ලියනගම	12
	නිකවැරටිය	ඉහකොළගම	13
		තිඹිරියාව	12
	නාගොල්ලාගම	කටුවන්නාව	13
		මිරිහන්පිටිය	13
	කොබෙයිගනේ	පන්නව	13
		හිරිගොල්ල	13
	රඹේ	තලාකොළවැව	13
		තම්බුව	13
එකතුව			128

1.5.2. දත්ත විශ්ලේෂණ ක්‍රම

සුවිශේෂී අරමුණු

1. ශ්‍රී ලංකාව තුළ දැනට පවතින ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවා මෙවලම් සහ භාවිතය පිළිබඳ අධ්‍යයනය කිරීම;
ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය තුළ භාවිතා කෙරෙන ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති මෙවලම් හි ප්‍රධාන ලක්ෂණ හඳුනා ගැනීමට විස්තරාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රම භාවිතා කෙරේ. එහිදී එම වැඩසටහන් හි ශක්තීන්, දුර්වලතා, අවස්ථා සහ තර්ජන හඳුනා ගැනීමට ශඳුඅත විශ්ලේෂණය (SWOT Analysis) භාවිතා කරන ලදි.

2. ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවා භාවිතා කිරීමේ හා ලබා ගැනීමේ දී ගොවීන්ගේ මට්ටමේ ඇති ගැටලු සහ විභවයන් අධ්‍යයනය කිරීම;
ප්‍රමාණාත්මක සහ විස්තරාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රම භාවිතා කෙරේ. එහි දී එම ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවා භාවිතා කිරීමට ගොවීන්ගේ මට්ටමේ ඇති හැකියාවන් සහ භාවිතයේ දී මුහුණ දෙන ගැටලු සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතය සහ එම තාක්ෂණය ලබා ගැනීමේ අසමානතාවයන් නිර්ණය කෙරිණි.

3. ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවා භාවිතා කිරීමේ හා ලබාගැනීමේ දී නිලධාරීන්ගේ මට්ටමේ ඇති ගැටලු සහ විභවයන් අධ්‍යයනය කිරීම;
විස්තරාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රම භාවිතා කරන ලදි. එහි දී ශ්‍රී ලංකාව තුළ ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවා භාවිතා ක්‍රියාත්මක කිරීමට ව්‍යාප්ති නිලධාරීන් සතු හැකියාවන් සහ බාධක පිළිබඳ පුළුල් අවබෝධයක් ලබා ගැනීම සිදු විය.

4 ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාව ඵලදායී ලෙස භාවිතා කිරීම සඳහා නිගමන හා නිර්දේශ සැපයීම

දෙවැනි පරිච්ඡේදය

සාහිත්‍ය විමර්ශනය

ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය

2.0. හැඳින්වීම

ශ්‍රී ලංකාව තුළ ක්‍රමිකව විකාශනය වෙමින් පැවත ආ සම්ප්‍රදායික කෘෂිකාර්මික ව්‍යාප්ති සේවයට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ඇතුළත් ව්‍යාප්ති සේවා සැපයීමේ ක්‍රම භාවිතය නැතහොත් ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය භාවිතය දක්වා වූ විකාශනය හා එහි අවශ්‍යතාවය පිළිබඳව සිදු කෙරුණු සාහිත්‍ය විමර්ශනය දෙවන පරිච්ඡේදයෙන් ඉදිරිපත් කෙරේ.

2.1. ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය

ශ්‍රී ලංකාවේ කාෂිකාර්මික ව්‍යාප්ති පද්ධතිය 1920 දී කෘෂිකර්ම දෙපාර්තමේන්තුව තුළ ආරම්භ වූ අතර, 1930 වන විට පළාත් ආවරණය වන පරිදි කෘෂිකාර්මික නිලධාරින් සහ කෘෂිකර්ම උපදේශක නිලධාරීන් ද ඇතුළත්ව කිරීම හරහා එය පුළුල් විය. 1950 වසරේ මුල් භාගය වන විට කොට්ඨාශ මට්ටමින් කෘෂිකර්ම උපදේශක නිලධාරීන් පත් කරන ලදී. ගොවි අවශ්‍යතා සපුරාලීම සඳහා 1957 දී දිස්ත්‍රික් කෘෂි ව්‍යාප්ති නිලධාරින් පත් කරන ලද අතර, පසුව එම අවශ්‍යතාව තව දුරටත් ඉහළ නැංවීමට ග්‍රාමීය මට්ටමේ දී කෘෂිකර්ම ව්‍යාප්ති සේවක නිලධාරීන් (KVS) ස්ථාපිත කරන ලදී. 1963 දී, නියෝජ්‍ය අධ්‍යක්ෂ (ව්‍යාප්ති) යටතේ ඒ සඳහා වෙන් වූ අංශයක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව තුළ ස්ථාපිත කරන ලද අතර ක්‍රමාණුකූලව සහ විධිමත් ආකාරයෙන් කටයුතු කිරීමේ ක්‍රමයක් සහතික කරන ලදී. 1990 වන විට, ව්‍යාප්ති පද්ධතිය විසින් රට පුරා ගොවි පවුල් සමඟ සෘජු සම්බන්ධතා පවත්වා ගනිමින් බිම් මට්ටමේ ව්‍යාප්ති සේවකයින් 2400කට අධික සංඛ්‍යාවක් අනුයුක්තව සිටීම මඟින් ව්‍යාප්ති ක්ෂේත්‍රයේ වර්ධනයක් පිළිඹිබු කරන ලදි (Wanigasundara and Atapattu, 2019).

ශ්‍රී ලංකාවේ ආහාර සැපයුම් දාමයේ කෘෂිකාර්මික ව්‍යාප්ති සේවා (වැවිලි බෝග, අපනයනය ඉලක්ක කරගත් බෝග, පලතුරු, එළවළු සහ අතිරේක ආහාර බෝග) වසර ගණනාවක් තිස්සේ වර්ධනය වෙමින් ක්‍රියාත්මක වේ. සාම්ප්‍රදායික දැනුම සහ තාක්‍ෂණ හුවමාරුව, පුහුණුව හා හමුවීමේ ක්‍රමය, ඒකාබද්ධ කෘෂිකාර්මික ව්‍යාප්තිය සහ ආදර්ශන නිරූපණය මෙන්ම තොරතුරු සහ සන්නිවේදන තාක්‍ෂණ (ICT) භාවිතය ඇතුළු විවිධ ව්‍යාප්ති සේවා ක්‍රම, ආකෘති සහ වැඩසටහන් සම්ප්‍රදායික ව්‍යාප්ති ක්ෂේත්‍රය තුළ භාවිතා කර ඇත (වගු අංක 2.1).

වගු අංක 2.1: ශ්‍රී ලංකාවේ ප්‍රධාන කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාවන්

ආකෘතිය/ප්‍රවේශය	**ග්‍රාමීය ප්‍රජාවගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීමට මැදිහත්වන ආකාරය**
පුහුණුව හා හමුවීමේ ක්‍රමය Training and Visit System (T&V)	පුහුණුව හා හමුවීමේ ආකෘතිය (T&V System) යටතේ ග්‍රාමීය මට්ටමේ ව්‍යාප්ති කාර්ය මණ්ඩලය සඳහා ක්‍රමානුකූල පුහුණු වැඩසටහන් පැවැත්වීම, ග්‍රාමීය මට්ටමේ පවුල් සහ ගොවිපළවල් වෙත දිනපතා පැමිණීම යන කාර්යයන් ඇතුළුව ස්ථාපිත කර ක්‍රියාත්මක කරන ලදී. එය ඉහළ සිට පහළට යන ප්‍රවේශයකි. පුහුණුව හා හමුවීමේ සංකල්පය ගම් මට්ටමේ ගොවීන් සඳහා නවීන උසස් තාක්ෂණයන් ලබා දීම සඳහා අදාළ තාක්ෂණයන් ප්‍රවර්ධනය ද සිදු කරන ලදි. සෑම වැඩසටහනකටම තනි රේඛීය විධාන ක්‍රමවේදයක් සහ සේවය සැපයීමේ ඇති භූගෝලීය සීමාවක් හොඳින් අර්ථ දක්වා තිබීම ද විශේෂ ලක්ෂණයකි. ගොවීන්ට වඩාත් සුදුසුම බෝග කළමනාකරණ පිළිවෙත් අනුගමනය කිරීමට, නිෂ්පාදන බාධාවන් තක්සේරු කිරීමට සහ මගපෙන්වීම් ලබා දීමට සහාය වීම සඳහා කුසලතා සහ දැනුම ලබා දෙන ආකාරය ව්‍යාප්ති සේවය සපයන නිලධාරීන් විසින් ඉගෙනගනිමින් ගොවීන් වෙත යනු ලබයි. එසේම, වැඩිදුර ක්‍රියාමාර්ග සඳහා ගොවීන්ගේ ප්‍රතිපෝෂණ පර්යේෂණ ආයතනය වෙත ලබා දීමට එම ව්‍යාප්ති නිලධාරීන් විසින් කටයුතු කරනු ලබයි. මෙම ව්‍යාප්ති ප්‍රවේශය, 1980 දශකයේ මුල ආරම්භ වී 80 දශකයේ අග භාගයේදී එනම් 1989 පළාත් සභාවලට බලය විමධ්‍යගත කිරීමත් සමඟ අවසන් විය
ගොවි ක්ෂේත්‍ර පාසල කෘෂිකාර්මික ව්‍යාප්ති ප්‍රවේශය Farmer Field School Approach (FFS)	මෙම ප්‍රවේශය වැඩිහිටි අත්දැකීම් සහිත ඉගෙනුම් සංකල්ප මත පදනම් වූ කණ්ඩායම්-නැඹුරු දර්ශනයකි. ගොවි ක්ෂේත්‍ර පාසල් (FFS) තාක්ෂණය යනු "පළමුව ගොවියා" යන දර්ශනය කෙරෙහි අවධානය යොමු කරන පහළ සිට ඉහළට යන ප්‍රවේශයකි. ග්‍රාමීය ගොවි ප්‍රජාවන් තුළ අත්දැකීම් සහිත ඉගෙනීම කෙරෙහි අවධානය යොමු කරන තීව්‍ර - දිගු කන්න වැඩසටහනක් වූ ගොවි ක්ෂේත්‍ර පාසල ආකෘතියේ කොටසක් ලෙස ගමක සිටින අනෙකුත් ගොවීන් සමඟ පර්යේෂණ නිර්මාණය කිරීමට, ඉගෙනීමට සහ ඔවුන්ගේ කුසලතා සහ දැනුම බෙදා ගැනීමට ගොවීන් නිතිපතා රැස්වීමෙහි විශේෂත්වය යි. ප්‍රජා සහභාගීත්වය, ග්‍රාමීය සහභාගීත්වය, තොරතුරු හුවමාරු කර ගැනීම, කුසලතා සංවර්ධනය සහ තාක්‍ෂණය යොදා ගැනීම සඳහා ගාමක බලවේගයක් ලෙස මෙම ප්‍රවේශය ක්‍රියාත්මක වේ. එනම්, ඒකාබද්ධ පළිබෝධ කළමනාකරණය -(Integrated Pest Management-IPM,) ඒකාබද්ධ පොහොර කළමනාකරණය -(Integrated Fertilizer Management-IFM) වැනි ක්‍රියාකාරකම් වේ. මෙම ප්‍රවේශය, 1990 දශකයේ මැද භාගයේ එනම් 1995 දී ආරම්භ වී 1999 වන විට තවදුරටත් පුළුල් වී තනි ජාතික වැඩසටහනක් ලෙසින් නොව බහු ව්‍යාපෘති හා හවුල්කරුවන් සමඟ දැනටත් ක්‍රියාත්මක වේ.
රාජ්‍ය නොවන සංවිධාන මඟින් ක්‍රියාත්මක වන ව්‍යාප්ති වැඩසටහන් NGO-Operated Extension Programs	මෙම ව්‍යාප්ති වැඩසටහන් උපකරණ සහ යන්ත්‍රෝපකරණ සහ ඒ ආශ්‍රිත අනෙකුත් සම්පත් පහසුවෙන් බෙදා හැරීමට උපකාර කරයි. රාජ්‍ය නොවන සංවිධාන විසින් සපයනු ලබන ව්‍යාප්ති සහ උපදේශන සේවාවන් හි සාර්ථක බව විවිධ පර්යේෂණ මඟින් පෙන්නුම් කරන අතර ව්‍යාප්ති වැඩසටහන් සැපයීම සඳහා, රාජ්‍ය නොවන සංවිධාන සහ රාජ්‍ය ආයතන සහයෝගයෙන් කටයුතු කළ යුතු බව ද පර්යේෂණ මඟින් පෙන්වා දී ඇත. 1990 දශකයේ සිට විධිමත් ලෙස ලේඛනගත වෙමින් වර්තමානයේත් ක්‍රියාත්මක වේ.
පුද්ගලික ව්‍යාප්ති සේවා සහ බෝග උපදේශකයින් Private Extension Services &Crop Consultants	මෙම සේවාවන් සපයනු ලබන්නේ පුද්ගලික ව්‍යාප්ති විශේෂඥයින්, ව්‍යාපාර, උපදේශන සහ නිෂ්පාදන සැපයුම්කරුවන් වන අතර ඔවුන් විසින් ගාස්තුවක් සහිතව හෝ නොමිලේ ලබා දෙන සේවාවක් ලෙසින් මෙම සේවාව සපයනු ලබයි. ඉහළ අස්වැන්නක් සහිත රෝපණ ද්‍රව්‍ය, නවීන උපකරණ සහ යන්ත්‍රෝපකරණ, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය මත පදනම් වූ තොරතුරු හුවමාරු කිරීමේ යාන්ත්‍රණය මෙම ආකෘතියේ දී ප්‍රමුඛ සාධක වේ. වෙළඳපළ ලිබරල්කරණය සහ පෞද්ගලික

	අංශයේ ව්‍යාප්තිය සමඟ 1990-2000 වර්ෂවල වර්ධනය විය. කැපී පෙනෙන ලෙස වර්තමානයේත් ක්‍රියාත්මක වේ.
ඩිජිටල්/විද්‍යුත් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය e-Extension/ ICT based extension service	කෘෂිකාර්මික ව්‍යාප්තිය සහ උපදේශන සේවාවන් දියුණු කිරීමේ දී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. ගොවීන් - ගොවීන් අතරත්, ගොවීන් - ව්‍යාප්ති විශේෂඥයින් සහ විද්‍යාඥයින් අතරත් සහ ගොවීන්ගේ සිට සැපයුම්කරුවන්ට සහ වෙළඳපොළ අතරත් උසස් සම්බන්ධතාවයක් පවත්වා ගැනීමටත් ඔවුනොවුන් අතර වාසි ලබා ගැනීමටත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ වේදිකාවක් භාවිතය වඩාත් ප්‍රයෝජනවත් වේ. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යනු ඵලදායී සේවාවක් සැපයීම සඳහා කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාවේ වර්ධනය වන අංශයකි. ඩිජිටල් සහ සමාජ මාධ්‍ය, ජංගම දුරකථන, විද්‍යුත් තැපැල, වීඩියෝ සහ ශ්‍රව්‍ය සහ වෙනත් තොරතුරු තාක්ෂණයන් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සඳහා උදාහරණ වේ. 2004 වර්ෂයේ සයිබර් කෘෂිකාර්මික ව්‍යාප්තියත් සමඟ ආරම්භ වී තවදුරටත් පුළුල් වෙමින් ක්‍රියාත්මක වේ.
ස්වයං-උපකාරක කණ්ඩායම්: ප්‍රජා පාදක සංවිධාන/ගොවීන් පදනම් කරගත් සමුපකාර Self – Help Group: Community based Organization/Farmer based Corporative	ස්වයං-උපකාරක කණ්ඩායම් (Self-Help Group) යනු පොදුවේ ලබාගත යුතු ප්‍රතිලාභ සඳහා ප්‍රජා මට්ටමින් එකිනෙකාට උපකාර කිරීමට එක්වන කුඩා පිරිසකි. ගොවීන්ගේ කණ්ඩායම්, ඉතුරුම් කණ්ඩායම් සහ කාන්තා කණ්ඩායම් ස්වයං-උපකාරක කණ්ඩායම් සඳහා ප්‍රමුඛ උදාහරණ වේ. ස්ථාපිත කෙරෙන සෑම කණ්ඩායමකම තමන්ගේම ඉලක්ක සහ අරමුණු ඇත. පහළ සිට ඉහළට සහ සහභාගීත්ව ප්‍රජා සංවර්ධන ප්‍රවේශයන් තමන් විසින්ම සවිබල ගැන්වීම සඳහා ඉගෙන ගැනීමට භාවිතා කරයි. බොහෝ රජයන් සහ අනෙකුත් ආයතන ඔවුන්ගේ වැඩසටහන් මෙම ප්‍රජාවන්ට සම්බන්ධ කරගනිමින් ක්‍රියාත්මක කරනු ලබයි. 1930 සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව හා කෘෂිකාර්මික සමුපකාර මඟින් හඳුන්වා දී වර්තමානයේත් මෙම ප්‍රවේශයන් ක්‍රියාත්මක වේ.
ගොවි ව්‍යාපාරික පාසල් ව්‍යාප්ති ආකෘතිය Farmer Business School Model of Extension -FBS	ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO) විසින් ගොවි ක්ෂේත්‍ර පාසල (FFS) කෘෂිකාර්මික ව්‍යාප්ති ප්‍රවේශ ආකෘතියේ අත්දැකීම් පාදක කොටගනිමින් ''ගොවි ව්‍යාපාරික පාසල් ව්‍යාප්ති ආකෘතිය'' නමින් නව කෘෂිකාර්මික ව්‍යාප්ති සේවා ආකෘතියක් නිර්මාණය කර ඇත. මෙම ආකෘතිය ගොවීන්ට ඔවුන්ගේ ගොවිපළ තුළ ව්‍යාපාරික ධාරිතාවය, හැකියාවන් සහ දැනුම මෙන්ම තීරණ ගැනීමේ සහ ව්‍යවසායකත්ව කුසලතා වර්ධනය කර ගැනීමට පහසුකම් සපයයි. මෙම ව්‍යාප්ති ආකෘතිය මඟින් තම ගොවිපළ වෘත්තීයමය වශයෙන් සහ ලාභදායී ලෙස පවත්වා ගෙන යාමට කැමති කුඩා පරිමාණ හා ආන්තික මට්ටමේ ගොවීන්ට පහසුකම් සැපයීම සිදුකෙරේ. කාෂිකාර්මික නවීකරණ ව්‍යාපාතිය යටතේ 2010 - 2016 ආරම්භ වී වර්තමානයේත් ක්‍රියාත්මක වේ.

මූලාශ්‍රය: (Kaur & Kaur, 2018; Wanigasundera, 2015).

ක්‍රමිකව විකාශනය වෙමින් ඉදිරියට පැමිණි මෙම ව්‍යාප්ති සේවා ක්‍රම, ආකෘති සහ වැඩසටහන් හරහා ගොවීන් වෙත නව දැනුම බෙදාහරින අතර ඔවුන්ගේ ගොවිතැන් කුසලතා වැඩි දියුණු කිරීමට වඩාත් උපකාරී වේ. කෙසේ වෙතත්, එම ව්‍යාප්ති ක්‍රම, ආකෘති බොහෝමයක දක්නට ලැබෙන්නේ ඒක පාර්ශ්වීය ක්‍රියාවලියක් (One- Way Process) වේ. එනම්, ගොවීන්ගේ අවශ්‍යතා නොසලකා හරිමින් තාක්ෂණය උත්පාදනය කිරීමෙන් ආරම්භ වී එම තාක්ෂණික දැනුම ගොවීන් වෙත ලබා දීමෙන් අවසන් වන ක්‍රියාවලියක් ලෙස ය. මේ අනුව ශ්‍රී ලංකාවේ ව්‍යාප්ති පද්ධතිය තුළ කැපී පෙනෙන ගැටලු තිබේ. ඒවා නම්, ගොවීන්ගේ අදහස්, යෝජනා සහ ප්‍රශ්නවලට ප්‍රතිචාර නොදැක්වීම හේතුවෙන් ගොවීන් අතර ගොඩනැගී ඇති අතෘප්තිකරභාවය, රාජ්‍ය අංශයේ වැඩසටහන් තුළ ගොවීන්ගේ අවශ්‍යතාවය හෝ කැමැත්ත අභිබවමින් නිලධාරිවාදී තත්ත්වයක් පෙන්නුම් කිරීම, පර්යේෂණ සහ ගොවි ක්ෂේත්‍ර අතර කාර්ය සාධනය සම්බන්ධයෙන් වන පරතරය සහ ආයෝජන පහත වැටීම සහ තාක්ෂණික දැනුම ලබා

දීමෙන් ඔබ්බට පවතින අනෙකුත් පුළුල් ප්‍රශ්නවලට මන්දගාමීව අනුගත වීම සහ ග්‍රාමීය මට්ටමේ පැවති කෘෂිකර්ම ව්‍යාප්ති සේවක නිලධාරීන් අහිමි වීම වැනි ගැටලු වේ.

එබැවින් තාක්ෂණික දැනුම ව්‍යාප්ත කිරීමෙන් පමණක් සෑහීමකට පත් නොවී ඉන් එහා ගොවීන් මුහුණ දෙන විවිධ අභියෝග සමඟ සම්බන්ධ වෙමින් ක්‍රියාත්මක වන ව්‍යාප්ති පද්ධතියක් ලෙසින් දැනට පවත්නා ව්‍යාප්ති පද්ධතිය පරිණාමය වීමේ හදිසි අවශ්‍යතාවයක් පැණ නැගී ඇත. (Wanigasundara and Atapattu, 2019). ඒ සඳහා ව්‍යාප්ති පද්ධතිය තුළ දැනටමත් ක්‍රියාත්මක වන ව්‍යාප්ති ප්‍රවේශයක් වන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පාදක කෘෂිකාර්මික ව්‍යාප්තිය නැතහොත් ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාව ඵලදායී ලෙස යොදා ගැනීම පිළිබඳ දැඩි අවධානයක් යොමු වී ඇත.

2.2. ශ්‍රී ලංකාවේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (ICT) පාදක වූ කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය

වර්ෂ 2004 දී, ග්‍රාමීය ගොවීන්ට කාලීන තොරතුරු ලබා දීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සම්බන්ධ කර ගනිමින් “සයිබර් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවා” (Cyber Agricultural Extension) යාන්ත්‍රණය හඳුන්වා දෙන ලදී. බහුමාධ්‍ය පාදක ක්‍රමෝපායයන් (Multimedia- Based Strategies) උපයෝගී කර ගනිමින් 2006 වර්ෂය වන විට ගොවිජන සේවා මධ්‍යස්ථානවල සයිබර් ව්‍යාප්ති ඒකක 45ක් (CEUs) පිහිටුවන ලදී. අනතුරුව මෙම ඒකක සම්බන්ධයෙන් වසර දෙකක් අඛණ්ඩව අධීක්ෂණය සහ ඇගයීම සිදු කරන ලදී. 2007 වර්ෂයේ දී, ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සහ ව්‍යාප්තිය වැඩි දියුණු කිරීම සඳහා සයිබර් කෘෂිකාර්මික ව්‍යාප්ති ඒකක වෙත විදුලි සංදේශ සහ අන්තර්ජාල පහසුකම් ලබා දෙන ලදි. ගාස්තු රහිත කෘෂිකාර්මික ව්‍යාප්ති සහ උපදේශන සේවා ක්ෂණික ඇමතුම් අංකය (1920) ගොවීන් අතර ජනප්‍රිය විය. සයිබර් කෘෂිකාර්මික ව්‍යාප්ති ඒකකයන් පිහිටුවීමේ අරමුණ හා එයින් සේවය ලබාගැනීම පිළිබඳව ගොවීන්ගේ පාර්ශ්වයෙන් පැවති දුර්වලතාවන් එසේම එම ඒකකයන් හි අධීක්ෂණයේ පැවති අඩුපාඩු මෙම ව්‍යාප්ති ඒකකයන් හි පැවැත්මට බලපෑ බාධක විය (ලූර්දු, 2011). කෙසේ වෙතත්, සමස්තයක් ලෙස අඩු පරිගණක සාක්ෂරතාවය, සීමිත අන්තර්ජාල ප්‍රවේශය සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ ප්‍රමාණවත් සහයෝගයක් නොමැතිකම වැනි අභියෝග කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාව තුළ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතයට බාධා කරනු ලබයි (Wanigasundara and Atapattu, 2019).

Dissanayake et al., (2020) විසින් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය තුළ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පාදක කරගත් තොරතුරු පද්ධති සහ ශ්‍රී ලංකාව තුළ ඒවායේ ආර්ථික බලපෑම් හඳුනා ගැනීම සඳහා අධ්‍යයනයක් සිදු කරන ලදී. එම අධ්‍යයනයට අනුව, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ මෑත කාලීන දියුණුව කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාව තුළ විප්ලවීය වෙනසක් සිදු කර ඇති අතර ඒවා තීරණ ආධාරක පද්ධති (Decision support system), නිෂ්පාදන සැලසුම්කරණය (Production Planning) සහ ස්වයංක්‍රීය භාවිතයන් (Automating practices) සමඟ ඒකාබද්ධ කිරීමට අවස්ථාව ලබා දී ඇති බවට එම අධ්‍යයනය විසින් අනාවරණය කර ඇත. එසේම මෙම අධ්‍යයනය මඟින් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය තුළ රූපවාහිනී මාධ්‍ය භාවිතය, ජංගම දුරකථන, ස්මාර්ට් උපාංග සහ පරිගණක වැනි තොරතුරු හා සන්නිවේදන මාධ්‍යයන් සලකා බලා ඇති අතර, එම මාධ්‍යයන් හරහා ගනුදෙනු පිරිවැය අඩු කිරීම සහ වෙළඳපළ ප්‍රවේශය වැඩිදියුණු කිරීම වැනි ආර්ථික ප්‍රතිලාභ ඇතිවන්නේ ද යන්න කෙරෙහි ද අවධානය යොමු කර ඇත. එසේම විවිධ සේවාවන් සම්බන්ධ කිරීම, අන්තර් ක්‍රියාකාරී සන්නිවේදනය ප්‍රවර්ධනය කිරීමට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය විශිෂ්ට සේවාවක් සපයනු ලබන බව ද එම අධ්‍යයනය විසින් පෙන්වා දී ඇත. පාර්ශ්වකරුවන් අතර අඩු දැනුවත්භාවය, ව්‍යාප්ති නිලධාරීන් අතර ප්‍රමාණවත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කුසලතා නොමැතිකම, ඛණ්ඩනය වූ සේවාවන් සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයෙහි බලපෑම පිළිබඳ පර්යේෂණ සීමිත වීම, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ඇතුළත්ව සිදු කෙරෙන කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය තුළ හඳුනාගත හැකි බාධාවන් බව ද මෙම අධ්‍යයනය විසින් පෙන්වා දෙනු ලබයි.

Weththasinghe and Dissanayake (2024) විසින් ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයේ විකල්ප සහ තොරතුරු හා සන්නිවේදනය පදනම් වූ උපදේශන සහ ව්‍යාප්ති ප්‍රවේශයන් හඳුනා ගැනීම සඳහා සිදු කරන ලද අධ්‍යයනයේ දී 2020-2022 දක්වා ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයේ නිලධාරීන් අතර තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පාදක කරගත් උපදේශන සහ ව්‍යාප්ති ක්‍රම භාවිතා කිරීම පිළිබඳ තක්සේරු කර ඇත. නිලධාරින් 72 දෙනෙකුගෙන් සමන්විත මාර්ගගත සමීක්ෂණයෙන් හෙළි වූ පරිදි සමීක්ෂණයට සහභාගී වූ බහුතරයක් පිරිමින්ගේ (61%) සාමාන්‍ය වයස අවුරුදු 41කි. බොහෝ දෙනෙකුට ඩිප්ලෝමා මට්ටමේ අධ්‍යාපනය (47%) සහ වසර 13ක පළපුරුද්ද තිබුණි. මෙම නිලධාරීන් ප්‍රධාන වශයෙන් ජංගම ඇමතුම් (76.6%) සහ වට්ස්ඇප් (50%) භාවිතා කළහ. ප්‍රධාන බාධක ලෙස, දුර්වල සන්නිවේදන යටිතල පහසුකම් (62.5%), අඩු තොරතුරු හා සන්නිවේදන කුසලතා (51.6%) සහ සම්බන්ධතා ගැටලු (Connection Issues) (57.8%) ඇතුළත් විය. අභියෝග මධ්‍යයේ වුව ද, නිලධාරීන්ගෙන් 50%කට වඩා මෙම ක්‍රම දෙස ධනාත්මකව බලා ඇති අතර, 73.4% ක් ඒවා භාවිතා කිරීමට කැමැත්තෙන් සිට ඇත. එසේම තරුණ නිලධාරින් නිතර තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිත කර ඇති බවත් මෙම අධ්‍යයනයෙන් අනාවරණය කර ගෙන ඇත.

ඉහත විමර්ශනයට අනුව දැනට ක්‍රියාත්මක වන ව්‍යාප්ති සේවා සැපයුම කාර්යක්ෂමව සිදු කිරීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ආශ්‍රිත මැදිහත් වීම අත්‍යවශ්‍ය බව පැහැදිලි වන අතර වර්තමානයේ ශ්‍රී ලංකාවේ මේ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන රාජ්‍ය/රාජ්‍ය නොවන දෙපාර්ශ්වයටම අයත් පාර්ශ්වකරුවන් සිටින අතර ඔවුන් විසින් ගොවීන්ට විවිධ ව්‍යාප්ති මෙවලම් සහ වේදිකාවන් නිර්මාණය කර ඇති බව පෙනී යයි.

2.2.1. රාජ්‍ය නොවන සංවිධාන සහ පෞද්ගලික අංශයට අදාළ ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය

ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන බොහෝ රාජ්‍ය නොවන සංවිධාන හා පෞද්ගලික අංශයට අදාළ ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාවන් ආරම්භ වී ක්‍රියාත්මක වන්නේ, රාජ්‍ය අංශයේ ක්‍රියාත්මක කරන විවිධ ව්‍යාප්ති ප්‍රවේශයන් හා ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් සමඟ ඒකාබද්ධ වීමෙනි. උදාහරණ ලෙස, 1990 දශකය තුළ CARE ආයතනය හා ආහාර සහ කෘෂිකර්ම සංවිධානය (FAO) විසින් ආරම්භ කළ ගොවි ක්ෂේත්‍ර පාසැල් (FFS), වර්ෂ 2000–2010 අතර ආරම්භ කළ ගොවි ක්ෂේත්‍ර සහ ව්‍යාපාර පාසල (FFBS) / ගොවි ව්‍යාපාර පාසල (FBS) සහ ස්වයං උපකාරක කණ්ඩායම් (SHGs)/ ප්‍රජා පාදක සංවිධාන, සහභාගීත්ව ග්‍රාමීය ප්‍රවේශය (PRA), ක්ෂුද්‍ර මූල්‍ය සමඟ ව්‍යාප්ති සේවය (ජීවනෝපාය සහ උපදේශන සේවා) සහ වෙළඳ පොළ සම්බන්ධතා ආකෘති වර්තමානයේත් භාවිතා වෙමින් පවතී.

එසේම 1970 දශකයේ අග භාගයේ සිට 1990 දශකයේ අග භාගයන් හි ලිබරල්කරණය සමඟ සිදු වූ ව්‍යාප්ති අංශයේ සිදු වූ ව්‍යුහාත්මක වෙනස්කම්වලින් පසුව, පුද්ගලික ක්‍රියාකාරීන් (යෙදවුම් අලෙවිකරුවන්, කෘෂි ව්‍යාපාර, සැකසුම්කරුවන්) විසින් කොන්ත්‍රාත් ගොවිතැන සහ කෘෂි තාක්ෂණික සේවාවන් පුළුල් කිරීමත් වාණිජ/වෙළඳපොළට සම්බන්ධ සහ ගාස්තු මත පදනම් වෙමින් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාවන් සිදුකරන ලදි. වර්තමානයේ එම ක්‍රියාකාරීත්වය ඉතාමත් පුළුල් ලෙස ක්‍රියාත්මක වෙමින් පවතී.

තෙවැනි පරිච්ඡේදය

ප්‍රතිඵල හා සාකච්ඡා

ශ්‍රී ලංකාව තුළ දැනට පවතින ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාවන් භාවිතය පිළිබඳ වර්තමාන තත්ත්වය

3.0. හැඳින්වීම

අධ්‍යයනයේ පළමු විශේෂ අරමුණට අදාළව ශ්‍රී **ලංකාවේ** රාජ්‍ය අංශයේ ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවයට අදාළ පාර්ශ්වකරුවන් ලෙස, කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් ප්‍රධාන ආයතනයක් වන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය (NAICC), ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, පෞද්ගලික අංශයේ ආයතන සහ පුද්ගලික මට්ටමින් මේ සඳහා සම්බන්ධ පාර්ශ්වකරුවන් සමඟ කරන ලද දුරකථන සාකච්ඡා, සම්මුඛ සාකච්ඡා සහ සාහිත්‍ය විමර්ශනයන් මඟින් දැනට ක්‍රියාත්මක වන ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවා මෙවලම් සහ ක්‍රියාකාරීත්වයේ වර්තමාන තත්ත්වයන් පිළිබඳව සපයා ගත් තොරතුරු ඇතුළත්ව එම ආයතනයන් හි මේ සඳහා පවතින දායකත්වය සහ ශුදුඅත විශ්ලේෂණය සඳහා තෙවැනි පරිච්ඡේදය වෙන් කෙරේ.

3.1. ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය හා මෙවලම්

ශ්‍රී ලංකාවේ ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය සඳහා අවශ්‍ය නව තාක්ෂණික මෙවලම් හඳුන්වා දීම සහ එම භාවිතයන් යාවත්කාලීන කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය ආයතන, පෞද්ගලික ආයතන හා පෞද්ගලිකවම වගකීම දරන පාර්ශ්වකරුවන් රාශියක් හඳුනා ගත හැකි වේ. වර්තමානනය වන විට ශ්‍රී ලංකාවේ ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්තිය සඳහා භාවිතා වන සේවාවන් ලෙස, දුරකථන මාර්ග ඔස්සේ සිදු කරනු ලබන කෘෂි උපදේශන සේවා, SMS / කෙටි පණිවුඩ සේවා, සමාජ මාධ්‍ය ජාල (වට්ස්ඇප්, ෆේස්බුක්, යූ ටියුබ්, කෘෂි තොරතුරු සේවාවන් සඳහා ගූගල් පිටු), ජංගම දුරකථන යෙදුම් (Mobile Apps), කළමණාකරණ තොරතුරු පද්ධති (Management Information Systems - MIS) සහ විද්‍යුත් තැපැල (e- mail) හඳුනාගත හැකි වේ. මෙම සේවාවන් ක්‍රියාත්මක කිරීමේ දී කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය සහ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය සැලකිය යුතු දායකත්වයක් සපයනු ලබයි.

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය (ආහාර සැපයුම් අංශය) විසින් දිනපතා, සතිපතා සහ මාසික ආහාර මිල ගණන් පිළිබඳ තොරතුරු සිංහල හා ඉංග්‍රීසි භාෂාවෙන් ආයතනික වෙබ් පිටු හරහා (https://www.harti.gov.lk) ගොවීන් වෙත ඉදිරිපත් කරනු ලබයි. මෙම තොරතුරු අවශ්‍ය ඕනෑම අයෙකුට ලබා ගැනීමේ හැකියාව ඇත. එසේම මොබිටෙල් ආයතනය සහ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය එක්ව 6666 මොබිටෙල් ජංගම මිල දර්ශකය යන පහසුකම හරහා ශ්‍රී ලංකාවේ දෛනික එළවළු මිල ගණන් පිළිබඳ තොරතුරු ගොවීන්ට සහ අනෙකුත් පුද්ගලයින්ට ලබාගැනීමේ හැකියාව සකසා ඇත (https://www.mobitel.lk).

3.2. ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය (NAICC)

සාම්ප්‍රදායික කෘෂිකාර්මික ව්‍යාප්ති සේවයෙන් ඔබ්බට ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය ශ්‍රී ලංකාවේ ගොවි ප්‍රජාව වෙත සාර්ථකව හඳුන්වා දීමටත්, එම විද්‍යුත් මෙවලම් භාවිතා කිරීමේ දී ගොවීන්ට ප්‍රායෝගිකව පැන නගින ගැටලු හා ඒවාට විසඳුම් පිළිබඳව සහ ආයතනික මට්ටමෙන් පැන නගින ගැටලු

පිළිබඳවත් අවධානය යොමු කරමින් ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය පවත්වා ගෙන යාමේ දී කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය (NAICC) කැපී පෙනෙන කාර්යභාරයක් ඉටු කරයි. එම **මධ්‍යස්ථානයට අයත්** එක් එක් අංශයන් හි ප්‍රධානීන් සමඟ සිදු කරන ලද සම්මුඛ සාකච්ඡා (2024 ඔක්තෝම්බර් මස 8 වන දින) අනුව ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය විද්‍යුත් මුද්‍රිත හා සමාජ මාධ්‍ය හරහා ගොවි ප්‍රජාවන්ට හා අනෙකු ප්‍රතිලාභීන්ට සුදුසු කෘෂිකාර්මික තාක්ෂණය බෙදා හැරීම, කෘෂිකාර්මික අංශය සඳහා විද්‍යුත් විසඳුම් සංවර්ධනය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සඳහා තොරතුරු තාක්ෂණ යෙදවුම් වැඩි දියුණු කිරීම සඳහා ඔවුන් විසින් වගකීම දරන බව පැහැදිලි විය. මෙම ආයතනය යටතේ පරිපාලන අංශය ද ඇතුළුව ක්‍රියාකාරී අංශ 4ක් පවත්වා ගෙන යන අතර ඒවා නම්,

1. 1920 කෘෂිකර්ම උපදේශන සේවා අංශය
2. කෘෂිකර්ම වීඩියෝ හා ඡායාරූප අංශය
3. ග්‍රැෆික් සන්නිවේදන හා පුහුණු අංශය
4. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය

3.2.1. "1920" කෘෂිකර්ම උපදේශන සේවා අංශය

මෙම අංශය කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ආරම්භ කරන ලද්දේ 2006 දී වන අතර, 2016 ඔක්තෝම්බර් මාසයේ දී ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය පිහිටුවීමත් සමඟ එම අංශය මෙම ආයතනයට රැගෙන එන ලදී. '1920 කෘෂිකර්ම උපදේශන සේවය' මඟින් එළවළු, පලතුරු ක්ෂේත්‍ර බෝග හා අනෙකුත් අතිරේක බෝග ඇතුළු සියලු කෘෂි බෝග මෙන්ම ගම්මිරිස්, කහ, කුරුඳු, ඉඟුරු ඇතුළු සුළු අපනයන බෝග සම්බන්ධව ද පොල් වගාවේ ගැටලු පිළිබඳව ද අවශ්‍ය සියලු තොරතුරු ලබා ගැනීමේ අවස්ථාව සලසා දී ඇත. එසේම දෙමළ මාධ්‍යය මඟින් ද කෘෂි උපදේශන සේවාව ලබා ගැනීමට ද අවස්ථාව ලබා දී ඇත.

මෙම සේවාව මඟින් සේවය සැපයීම සඳහා නියෝජිතයින් 20 දෙනෙකුට එකවර සම්බන්ධ විය හැකි ආකාරයට පද්ධතිය නිර්මාණය කර ඇති නමුත්, මේ වන විට ආයතනයේ සම්බන්ධ විය හැකි නියෝජිතයින් සිටින්නේ 14 දෙනෙකු පමණි. '1920' කෘෂි උපදේශන සේවාව සඳහා අන්තර් ක්‍රියාකාරී හඬ ප්‍රතිචාර පද්ධතිය (Interactive Voice Response System -IVRS) භාවිතා කරයි. මෙම සේවාව රජයේ නිවාඩු දිනවල සහ සති අන්තයේ හැර කාර්යාල වේලාවන්වල පෙ.ව. 8.30 සිට ප.ව. 4.15 දක්වා දිනපතා සපයනු ලබයි. මේ සඳහා පළපුරුදු තාක්ෂණික නිලධාරීන් සම්බන්ධ වී සිටින අතර ඇමතුම්කරුවන් විසින් මතු කරනු ලබන විමසීම් සඳහා පිළිතුරු හා උපදෙස් සපයන අතර සංකීර්ණ තාක්ෂණික ගැටලු විසඳීමට කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විශේෂඥයින්ගේ සහාය ලබා ගැනීම සිදු කෙරේ. 1920 කෘෂි උපදේශන සේවාව සම්බන්ධව ප්‍රධාන දත්ත පද්ධති දෙකක් පවතී. එනම්,

- ඉසබෙල් ඇමතුම් මධ්‍යස්ථානය
- පාරිභෝගික සම්බන්ධතා කළමනාකාර පද්ධතිය මඟින් මෙහෙයවනු ලබන ගොවි ගැටලු පද්ධතිය

මෙම දත්ත පද්ධති මඟින් දිනපතා පැමිණි ඇමතුම් සංඛ්‍යාව, ඇමතුම් ලබාගත් පුද්ගලයින්ගේ විස්තර, ඇමතුම් ලබා ගැනීමට මූලික වූ කෘෂි ගැටලු පිළිබඳ වූ දත්තයන් පළාත් මට්ටමින් ද දිස්ත්‍රික්ක මට්ටමින් ද ලබාගත හැකිය. එසේම මෙම දත්ත පද්ධති මඟින් ප්‍රධාන වාර්තා දෙකක් සැකසෙන අතර එය ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය මඟින් අදාළ අංශ වෙත සපයනු ලබයි. එම වාර්තාවන් වන්නේ එක් එක් සතිය පුරා ගොවි ජනතාව වැඩිම වාර ගණනක් අසන ලද ගැටලු සහ විශේෂයෙන් සැලකිය යුතු ගැටලු පිළිබඳ වාර්තාවන් වේ. ගැටලුව, ගැටලුවේ ස්වභාවය හා ගැටලුව යොමු වූ දිස්ත්‍රික්කය ලෙස එම දත්තයන් වගුගත කර ඉදිරිපත් කරනු ලබයි.

නිරන්තරයෙන් අසන ලද ප්‍රශ්නවලින් සකස් කරගන්නා ලද මෙම වාර්තාව (FAQ Report) කෘෂිකර්ම අධ්‍යක්ෂ ජෙනරාල්, අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂවරුන්, දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂවරුන් වැනි බලධාරීන් වෙත යොමු කරනු ලබයි. ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය මඟින් මෙම තොරතුරු වාර්තාවක් දිස්ත්‍රික්ක මට්ටම දක්වා පමණක් යොමු කරන අතර එම වාර්තාවන්ට අදාළ ඉදිරි ක්‍රියාමාර්ග ඊට අදාළ බලධාරීන් විසින් ගනු ලබයි. බිම් මට්ටම දක්වා මෙය ගලා නොගිය ද නිලධාරීන්ගේ අවශ්‍යතාවය අනුව දිස්ත්‍රික් මට්ටමින් ඒ සියලු තොරතුරු ලබා ගැනීමේ හැකියාව ඇත. මෙමඟින් ක්ෂේත්‍ර කෘෂිකාර්මික උපදේශකවරුන්ට ගොවි ප්‍රජාව වෙත යාමට පෙර කෘෂිකාර්මික ගැටලු පිළිබඳව යාවත්කාලීන වූ පුළුල් දැනුමක් ලබා ගත හැකිය. එසේම අවශ්‍ය නම් මෙම වාර්තාවල අන්තර්ගත ගැටලුවලට අදාළ ගොවි ජන සේවා මධ්‍යස්ථානය, ගැටලුව යොමු කරන ලද ගොවියන්ගේ දුරකථන අංක ද නිලධාරීන්ට ජාතික කෘෂිකාර්මික තොරතුර හා සන්නිවේදන මධ්‍යස්ථානය මඟින් ලබා ගැනීමේ හැකියාව ද ඇත. මෙහි දී මෙම තොරතුරු බිම් මට්ටමේ ගොවි ප්‍රජාව අතරට ගෙන ඒමට කෘෂිකාර්මික උපදේශකයින් විසින් මැදිහත් වීම අත්‍යවශ්‍ය වන බවත් වර්තමානයේ එම කාර්යය සිදුවීමේ අඩුවක් පවතින බවත් මෙහි නිලධාරීන් විසින් සඳහන් කරන ලදී.

මාසිකව දළ වශයෙන් දුරකථන ඇමතුම් 7000 – 8000ක ප්‍රමාණයක් ශ්‍රී ලංකාවේ ගොවි ප්‍රජාව වෙතින් 1920 කෘෂි උපදේශන සේවාව වෙත ලැබෙන බව සම්මුඛ සාකච්ඡාවේ දී හෙළිදරව් විය. නමුත් උතුරු සහ නැගෙනහිර පළාත්වලින් දුරකථන ඇමතුම් නොලැබෙන අතර මෙයට ප්‍රධානතම හේතුව භාෂා අවහිරතාවය බව ද අනාවරණය විය. නො එසේ නම් දමිළ ගොවි ප්‍රජාව බෝග විවිධාංගීකරණයට අඩු නැඹුරුවක් දැක්වීමත්, දකුණු ඉන්දියානු කෘෂිකාර්මික සංස්කෘතියට වැඩි නැඹුරුවක් දැක්විමත් නව තාක්ෂණයන්ට යොමු වීම අඩුවීමත් පරම්පරාවෙන් පරම්පරාවට එන දැනුම බෙදා හැරීම් වැනි කරුණු නිසාත් මෙම උපදේශන සේවාවන් වෙත ප්‍රවේශ නොවන බව උපකල්පනය කරන බව මෙහි නිලධාරීන්ගේ අදහස විය.

පළාත් මට්ටමේ දී දමිළ කෘෂිකාර්මික නිලධාරීන්ගේ හිඟයක් ද පවතින බැවින් උතුරු සහ නැගෙනහිර පළාත්වල කෘෂි ගැටලුවලට සම්බන්ධ කෘෂිකාර්මික උපදේශන සේවා ඇමතුම් මධ්‍යස්ථාන ස්ථාපිත කළ යුතු බවත් එම මධ්‍යස්ථාන ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය සමඟ සම්බන්ධ කළ යුතු බවත් මෙම සාකච්ඡාවන්හි දී ඉදිරිපත් වූ අදහසක් විය. එමඟින් දමිළ ගොවි ප්‍රජාවට භාෂා ගැටලුවකින් තොරව ඉක්මන් සේවාවක් ලබාදීමේ හැකියාව ඇති වන බව ද සඳහන් කරන ලදි. රාජ්‍ය අනුග්‍රහය හරහා මෙම ක්‍රමය ක්‍රියාත්මක කළ යුතු බවත් වර්තමානයේ ඒ සඳහා ආයතනික ප්‍රතිපාදන නොමැති වීම මුහුණපාන ගැටලුවක් බවත් සඳහන් විය.

- **කෘෂිකාර්මික කෙටි පණිවිඩ සේවාව**

ගොවි ප්‍රජාව තුළ ඔවුන්ට අවශ්‍ය කෘෂිකාර්මික තොරතුරු ලබා ගැනීමට කෘෂිකාර්මික කෙටි පණිවිඩ සේවාවක් ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය විසින් පවත්වාගෙන යනු ලබයි. එක් බෝගයකට කෙටි පණිවිඩ 20ක් බැගින් බෝග 10ට අදාළව මෙම සේවා සිදු කරනු ලබයි. මේ සඳහා ගොවි මහතුන් ලියාපදිංචි කිරීමක් සිදු කරනු ලබන අතර, පසුව ඔවුන්ගේ බෝග දින දර්ශනයට ගැළපෙන පරිදි කෙටි පණිවිඩ සේවාව පවත්වා ගෙන යනු ලැබේ. මෙම සේවාව ද සිංහල හා දමිළ මාධ්‍යයෙන් සිදු කරනු ලබන නමුත්, දමිළ ගොවි ප්‍රජාව මේ සඳහා ලියාපදිංචි වී නොමැති බව අනාවරණය කර ගැනීමට හැකි විය. මෙයට බලපාන ප්‍රධාන හේතුව වන්නේ ද දමිළ ගොවි ප්‍රජාවට මෙම සේවාවන් ඉදිරිපත් කිරීමට දමිළ කෘෂි උපදේශන සේවා නිලධාරීන් මෙම මධ්‍යස්ථානය තුළ හිඟ වීම යි.

3.2.3. කෘෂිකර්ම වීඩියෝ අංශය

ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානයේ වීඩියෝ අංශය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නව කෘෂිකාර්මික තාක්ෂණයන්, කෘෂිකාර්මික අංශය ජයගත් ගොවි සහ ගොවි සමිතිවල සාර්ථක කතා බෙදා හැරීමේ මාධ්‍ය මෙහෙයුම මෙහෙයවයි. මීට අමතරව ඩිජිටල් ශ්‍රව්‍ය පටිගත කිරීමේ මැදිරිය සහ ඡායාරූප ක්‍රියාකාරකම් සමඟ වීඩියෝ අංශය ශක්තිමත් කර ඇත.

කෘෂිකාර්මික රූපවාහිනී වැඩසටහන් "මිහිකත දිනුවෝ", "උයරුම් උලවුම්" - දෙමළ වැඩසටහන සහ ගොවිබිමට අරුණළු NAICC වීඩියෝ අංශය මඟින් නිෂ්පාදනය කර සතියේ සෑම සිකුරාදා, සෙනසුරාදා සහ ඉරිදා දිනකම විකාශය කෙරේ. "මිහිකත දිනුවෝ" සහ ගොවිබිමට අරුණළු වැඩසටහන් ජාතික රූපවාහිනිය ඔස්සේ විකාශය වන අතර, "උයරුම් උලවුම්" දෙමළ වැඩසටහන ස්වාධීන රූපවාහිනී ජාලයේ වසන්තම් රූපවාහිනී නාලිකාව හරහා විකාශය වේ. එබැවින් වීඩියෝ අංශය මඟින් නිෂ්පාදනය කරන ලද කෘෂිකාර්මික රූපවාහිනී වැඩසටහන් තුළින් ගොවීන්ගේ ප්‍රඥාව මුවහත් කර දේශීය කෘෂි ආර්ථිකයේ දියුණුව සඳහා දෘශ්‍ය මාධ්‍ය සත්කාරයක් ලබාදීමට හැකි වී ඇත.

3.2.4. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය

විවිධ දෙපාර්තමේන්තුවල පූර්ව අවශ්‍යතා සහ අරමුණු සාක්ෂාත් කිරීම සඳහා විශ්වාසදායක තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පදනම් වූ විසඳුම් ලබා දීමේ අරමුණින් ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය ස්ථාපිත කර ඇත. විවිධ දෙපාර්තමේන්තු අවශ්‍යතා සපුරාලීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය විසින් සපයනු ලබන සේවාවන් ලෙස, කෘෂි උපදේශන සේවාව හා සම්බන්ධ ජංගම දුරකතන යෙදුම් සංවර්ධනය (Mobile Apps), වෙබ් අඩවි නිර්මාණය කිරීම හා නඩත්තු කිරීම (Web Site), සමාජ මාධ්‍ය ජාල හැසිරවීම (Social Media), විද්‍යුත් තැපැල (e-mail) සහ අනාගත තාක්ෂණික අවශ්‍යතා හඳුනාගනිමින් එම අවශ්‍යතා සපුරාලීමට තාක්ෂණය යාවත්කාලීන කිරීම හඳුනාගත හැකිය.

- **සමාජ මාධ්‍ය ජාල හැසිරවීමේ සේවාව**

සමාජ මාධ්‍ය ජාල සේවාව, ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය මඟින් කෘෂි තොරතුරු සමාජ මාධ්‍ය සේවාව ඔස්සේ ගොවි ප්‍රජාව හා අනෙකුත් පරිශීලකයන්ට ලබා දෙනු ලබයි. ඒ අනුව ක්‍රියාත්මක වන සමාජ මාධ්‍ය ජාල ලෙසින්, නිල ෆේස් බුක් සමාජ ජාලය, නිල Twitter පිටුව, කෘෂි TV යූ ටියුබ් නාලිකාව, නිල වට්ස්ඇප් සමූහය, විද්‍යුත් තැපැල් සේවය (e-mail) සහ Skype ගිණුම් හඳුනාගත හැකි වේ. මෙම විවිධ සමාජ මාධ්‍ය ජාල ඔස්සේ කෘෂි උපදෙස් ලබා දීමට මෙම මධ්‍යස්ථානය කටයුතු කරනු ලබයි. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නවතම කෘෂි තාක්ෂණික පණිවිඩ කඩිනමින් සමාජගත කිරීමේ අරමුණින් ඇති කරන ලද මෙම වට්ස්ඇප් සමූහය "ඇසිදිසි කෘෂි හවුල" නමින් පවත්වා ගෙන යනු ලබයි. මෙමඟින් නවතම කෘෂි තොරතුරු , කාලගුණික වාර්තා ආදිය ලබා දෙන අතර, ගොවි ප්‍රජාවට ඇති කෘෂි ගැටලු මෙම සමූහය හරහා ඉදිරිපත් කළ හැකි ය. එසේම Skype තාක්ෂණය භාවිතා කර සිදු කරනු ලබන බෝග සායන වැඩසටහන් මඟින් ගොවි ජනතාවට ඔවුන්ගේ බෝග නියැදි පෙන්වා අවශ්‍ය කෘෂි උපදෙස් කෘෂි විශේෂඥයින්ගෙන් ලබා ගත හැකි ය.

- **වෙබ් අඩවි නිර්මාණය**

ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය මඟින් කෘෂි තොරතුරු ලබා දීම සඳහා වෙබ් අඩවි කිහිපයක් නිර්මාණය කර ඇත. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය, කෘෂි සන්නිවේදනයේ නියැළෙන සියලු ආයතන සම්බන්ධීකරණය කරන කෘෂි ලංකා වෙබ් අඩවිය සහ මානව සම්පත් පෝෂණය අරමුණු කර ගත් වෙබ් අඩවි වශයෙන් ඒවා නම් කළ හැකි වේ. මෙම වෙබ් අඩවිවල සිංහල, ඉංග්‍රීසි හා දමිළ යන මාධ්‍ය තුනෙන්ම කෘෂි තොරතුරු සමාජ ගත කරනු ලබයි. මෙහි ආහාර බෝග, සත්ත්ව පාලනය, වැවිලි බෝග, අපනයන කෘෂි බෝග, මල් වගාව, ඖෂධ බෝග, කාලගුණය, කෘෂි උපදේශන සේවා, වෙළඳපොළ තොරතුරු යනා දී බොහෝ තොරතුරු අඩංගු වේ

- **ජංගම දුරකතන යෙදුම් (Mobile Apps)**

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය විසින් සිදු කරන කාර්යයන් අතර ජංගම දුරකතන යෙදුම් සංවර්ධනය කිරීම විශේෂ කාර්යයක් වේ. මෙම පර්යේෂණ අධ්‍යයනයේ දී ජංගම දුරකතන යෙදුම් පිළිබඳ වැඩි අවධානයක් සහිතව තොරතුරු ගවේශනය කරන ලද අතර NAICC ආයතනය මෙන්ම

අනෙකුත් රජයේ ආයතන, පෞද්ගලික ආයතන, පුද්ගලයින් විසින් නිර්මාණය කරන ලද කෘෂිකාර්මික ජංගම යෙදුම් පිළිබඳව මෙහි දී සාකච්ඡා කෙරේ.

ජංගම යෙදුමක් යනු?

ජංගම යෙදුමක් යනු ඩෙක්ස්ටොප් හෝ ලැප්ටොප් පරිගණක වෙනුවට ස්මාර්ට් දුරකතන සහ Tablet වැනි කුඩා රැහැන් රහිත පරිගණක උපාංගවල භාවිතය සඳහා විශේෂයෙන්ම නිර්මාණය කරන ලද මෘදුකාංග යෙදුමකි (Costopoulou et al, 2016). වර්තමානය වන විට කෘෂිකාර්මික තොරතුරු බෙදා හැරීම පහසු කරවීමටත් ගොවියාට එම තොරතුරු ලබා ගැනීම පහසු කරවීමටත් ජංගම දුරකථන යෙදුම් භාවිතය බහුල වශයෙන් සිදුකරයි. ඊට බලපාන ප්‍රධානම කරුණ වන්නේ ඒවායේ ඇති කාර්යක්ෂමතාවයයි. තොරතුරු ඉතා කෙටි කලක් තුළ යාවත්කාලීන (Update) වන අතර ගොවීන්ට තම ගොවිපොළ කටයුතු වඩාත් කාර්යක්ෂමව කළමනාකරණය කිරීමට සහ ඒ පිළිබඳව වඩාත් නිරවද්‍ය තීරණ ගැනීමේ හැකියාව මේ හරහා පවතී. මෙම ජංගම යෙදුම් බොහෝ විට වෙබ් පාදක කරගත් (Web based) සහ දේශීය යෙදුම් (Native Apps) ලෙස වර්ගීකරණය කර ඇති අතර ඒවා ලබා දී ඇති වේදිකාවන් (Platform) සඳහා විශේෂයෙන් නිර්මාණය කර ඇත (Costopoulou et al, 2020).

වර්තමාන ඩිජිටල් යුගයේ ජංගම යෙදුම් බොහෝ මිනිසුන්ගේ දෛනික ජීවිතයේ අත්‍යවශ්‍ය අංගයකි. සමාජ ජාලකරණය (Social Networking) සහ විනෝදාස්වාදයේ සිට ඵලදායිතාවය හා ව්‍යාපාර දක්වා මිනිසා තාක්ෂණය සමඟ අන්තර්ක්‍රියා කරන ආකාරය සම්බන්ධයෙන් ජංගම යෙදුම් වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. මෙම ජංගම යෙදුම් IOS, Android, සහ Windows Phone වැනි විශේෂිත ජංගම යෙදවුම් පද්ධති මත ධාවනය කිරීමට සැලසුම් කර ඇත. ජංගම යෙදුමක් භාගත (Download) කර උපාංගයක් මත ස්ථාපනය කළ විට එය උපාංගයේ මතකයේ ගබඩා කර එහි මෙහෙයුම් පද්ධතිය භාවිතයෙන් දියත් කෙරේ. https://www.techtarget.com/whatis/definition/mobile-app

- **කෘෂිකාර්මික ජංගම යෙදුම්**

කෘෂිකාර්මික තොරතුරු ලබා ගැනීමට භාවිතා වන මෙම ජංගම යෙදුම් සඳහා කාලගුණික දත්ත, චන්ද්‍රිකාවලින් ලබා ගන්නා දත්ත, කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ සහ උපකරණ සඳහා තොරතුරු, කෘෂිකාර්මික නිෂ්පාදන වෙළඳපොළ මිල, කෘෂිකාර්මික නිෂ්පාදන කළමණාකරණය, කිරි ගොවිතැන, වාරිමාර්ග පද්ධති කළමණාකරණය, බෝග කළමනාකරණය, අස්වනු පිළිබඳ අනාවැකි, අධීක්ෂණ කටයුතු, පාංශු වර්ග ලියාපදිංචි කිරීම සහ ගණනය කිරීම වැනි දත්ත ඇතුළත් කොට ඇත. මීට අමතරව කෘෂිකාර්මික පාර්ශ්වකරුවන් සම්බන්ධ කර ගැනීම සඳහා ද නිශ්චිත කෘෂිකාර්මික කටයුතු සඳහා සහතික කළ නියමිත තොරතුරු සැපයීමේ හැකියාව ද මෙමඟින් ලැබේ (Fadziso, 2018).

කෘෂි උපදේශක යෙදුම (Krushi Advisor App)

ශ්‍රී ලංකාවේ ආහාර බෝග වගාව සඳහා කෘෂිකාර්මික උපදේශන සේවා සපයනු ලබන ඇන්ඩ්‍රොයිඩ් අනුවාදයක් වන කෘෂිකර්ම ජංගම යෙදුමකි. මෙම ජංගම යෙදුමේ ඉලක්ක කණ්ඩායම ගොවීන්, කෘෂිකාර්මික ව්‍යවසායකයින්, සිසුන් සහ අනෙකුත් කෘෂිකාර්මික තොරතුරු සොයන පාර්ශ්වකරුවන් වේ. සුදුසු ස්ථානය, බීජ හා රෝපණ ද්‍රව්‍ය අවශ්‍යතා සහිත ප්‍රභේද, තවාන් කළමනාකරණය සහිත ක්ෂේත්‍ර පිහිටුවීම, පොහොර නිර්දේශය, ජල කළමනාකරණය, වල්පැළ කළමනාකරණය, පළිබෝධ කළමනාකරණය, රෝග කළමනාකරණය, පෝෂක ඌනතාවය වැනි සවිස්තරාත්මක උපදේශන ආකාරයෙන් සියලුම ආහාර බෝග තොරතුරු මෙම ජංගම යෙදවුම මඟින් ආවරණය කරයි. අස්වනු නෙළීම සහ පසු අස්වනු නෙළීම සහ පරිශීලකයා විසින් තෝරාගත් ආහාර බෝග සඳහා විශේෂ බෝග කළමනාකරණ පද්ධති තිබේ.

මෙම යෙදුමේ විශේෂ පහසුකම වන්නේ හඬ ඇමතුම්, දත්ත ඇමතුම් ඇතුළු විවිධ සන්නිවේදන ක්‍රම හරහා පරිශීලකයාට ඕනෑම වේලාවක 1920 කෘෂිකාර්මික උපදේශන සේවාව සම්බන්ධ කර ගැනීමට

ඇති හැකියාව යි. ආහාර බෝග තොරතුරු හැරුණු විට, නවතම කෘෂිකාර්මික තාක්ෂණය, කෘෂිකාර්මික ක්ෂේත්‍රයට අදාළ අණ පනත් සහ නීති රෙගුලාසි සහ කෘෂිකාර්මික ආශ්‍රිත සේවා සපයන්නන් ඔවුන්ගේ සම්බන්ධතා තොරතුරු වැනි පාර්ශ්වකරුවන්ට අතිශයින් ප්‍රයෝජනවත් වන වෙනත් අදාළ විෂයයන් මෙම ජංගම යෙදුම මඟින් ආවරණය කරනු ලබයි. එසේම විවිධ රෝග හා පළිබෝධවලට අදාළ ඡායාරූප මෙම යෙදුමේ අන්තර්ගත කර ඇති බැවින් පරිශීලකයාට වඩාත් පහසුවෙන් එම රෝග හඳුනා ගැනීමට මෙම ජංගම යෙදුම පහසුකම් සපයනු ලබයි.

Agri Staff යෙදුම

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරින්ගේ කාර්යාල තොරතුරු ලබා දීම අරමුණු කරගනිමින් ‘Agri Staff’ යෙදුම නිර්මාණය කර ඇත.

මීට අමතරව වී වගාව සඳහා පොහොර නිර්දේශය, නිවැරදි බෝගය නිවැරදි වෙලාවට වගා කිරීමට දැනුම දෙන බෝග පුරෝකතකය, ජාතික පළිබෝධ නිරීක්ෂණයය වැනි විවිධ ජංගම දුරකතන යෙදුම් ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය මඟින් නිර්මාණය කර ඇත.

3.3. රාජ්‍ය ආයතන, පෞද්ගලික ආයතන හා පෞද්ගලික අයිතිය සහිතව හඳුන්වා දී ඇති කෘෂිකාර්මික ජංගම දුරකතන යෙදුම්

ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානයට අමතරව පෞද්ගලික අයිතිය ඇති යෙදුම්, රාජ්‍ය ආයතන විසින් හඳුන්වා දෙන ලද යෙදුම් ලෙසින් ගොවීන් වෙත කෘෂිකාර්මික තොරතුරු හා දැනුම ලබා දීමට කෘෂිකාර්මික ජංගම දුරකතන යෙදුම් 50ට ආසන්න සංඛ්‍යාවක් හඳුනාගත හැකි බව මුල් පරිච්ඡේදයන් හි ද සඳහන් කර ඇත. ඒ අතරින් පිළිගත හැකි මට්ටමේ තොරතුරු සපයා ගත හැකි ක්‍රියාකාරී මට්ටමේ යෙදුම් පිළිබඳව පමණක් පහත 3.1 වගුවෙන් පෙන්වා දී ඇත (අනෙකුත් යෙදුම් ඇමුණුම් අංක 01 හි පෙන්වා දි ඇත).

වගු අංක 3.1. : ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශයට අදාළ ක්‍රියාකාරී මට්ටමේ පවතින ඩිජිටල් ජංගම දුරකතන යෙදුම්

රාජ්‍ය ආයතන හා සම්බන්ධ කෘෂිකාර්මික ජංගම දුරකතන යෙදුම්				
ජංගම යෙදුමේ නම	අවසන් වරට යාවත්කාලීන කළ දිනය	හඳුන්වා දුන් දිනය	හඳුන්වා දුන් ආයතනය/පුද්ගලයා ගේ නම	සම්බන්ධතාවය
GeoGoviya App			ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව	https://geogoviya.com/reports/
Kiri Aswanu	27. 11. 2023		K. සොෆ්ට්	https://apkcombo.com/kiri-aswanu/com.daphmobile/
GoviNena		25. 05. 2020	රුහුණු විශ්ව විද්‍යාලය	https://play.google.com/store/apps/details?id=com.govinena.app&pcampaignid=web_share

Export Agriculture Sri lanka	08. 08. 2016		ATI ගම්පහ	https://apkcombo.com/export-agriculture-sri-lanka/com.exportagriculture.mashaupul.aggrinew/
Food Gate Srilanka		29. 01. 2023	ICTA ශ්‍රී ලංකා	https://play.google.com/store/apps/details?id=com.icta.foodgate&pcampaignid=web_share
Helaviru	12.5.2020	06. 10. 2022	Epic Lanka Technologies	https://play.google.com/store/apps/details?id=com.helavirufarmermobi&pcampaignid=web_share
Hela Nutrition		19. 06. 2019	කෘෂිකර්ම දෙපාර්තමේන්තුව	https://apkcombo.com/hela-nutrition/org.bfn.srilanka/
Sugarcane App	05. 10. 2023		U.W.L.M. කුමාරසිරි	https://play.google.com/store/apps/details?id=com.SRIOC.Lahiru&pcampaignid=web_share
Hela Bojun	20.07.2023	13. 01. 2019	කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (Walker Tech)	https://apkcombo.com/hela-bojun/doa.gov.lk.helabojun/
SL-GAP		05. 02. 2010	කෘෂිකර්ම දෙපාර්තමේන්තුව	https://m.apkpure.com/sl-gap/com.doasl.doagap.sl_gap
Mobitel “6666” Agri Price Information Index (IVR) and Food Information Bulletin		1979 වසරේ සිට දිනපතා ක්‍රියාත්මක වේ	මොබිටෙල් ආයතනය සහ HARTIආයතනය	www.mobitel.lk http://www.harti.gov.lk
DEA App		18. 04. 2023	රුවන් බණ්ඩාර	https://dea.en.aptoide.com/app

1. පෞද්ගලික ආයතන විසින් හඳුන්වා දෙන ලද කෘෂිකාර්මික ජංගම දුරකතන යෙදවුම්				
AIGrow	01.10.2024	14. 03. 2018	Charge NET	https://play.google.com/store/apps/details?id=com.vega.aigrow&pcampaignid=web_share
CBLSmart Agrow	03.10.2023	03.02. 2022	CBL Online	https://play.google.com/store/apps/details?id=com.smartagroapp&pcampaignid=web_share
Govi Mithuru (Dialog)	03. 09. 2024	17. 07. 2019	ඩයලොග් Axiata	https://play.google.com/store/apps/details?id=com.arimaclanka.android.govimithuru&pcampaignid=web_share
Lanka Flowers APK		26.10.2018	Mobisec (pvt) Ltd.	https://m.apkpure.com/lanka-flowers/lk.ifsolutions.lankaflowers
Srilankan pepper Apps	21. 03. 2024	01.06. 2020	Corbel Business Applications Pvt.Ltd	https://apps.apple.com/lk/app/sri-lankan-pepper-app-ipc/id1515940099

2. පෞද්ගලික අයිතිය ඇති කෘෂිකාර්මික ජංගම දුරකතන යෙදවුම්				
Weladapola	29.02.2020	16.09. 2019	Seed Code Lab	https://play.google.com/store/apps/details?id=com.scl.weladapola&pcampaignid=web_share
Elawalu Wagawa	13.01.2021	21. 11. 2020	Piyal Dias Munasinghe Apps Sinhala	https://play.google.com/store/apps/details?id=io.ionic.prog5f71ca85108b525f97e18be7&pcampaignid=web_share
Govilitha	31.08.2022	09. 05. 2020	Thothanna innovation	https://play.google.com/store/apps/details?id=thothanna_innovations.project.govilitha&pcampaignid=web_share
Spice Price Sri Lanka	14. 05.2023	-	Dulitha Eshan	https://play.google.com/store/apps/details?id=com.dulithaeshan.spiceprices&ref=apkcombo.com
Mod Goviya	29.07.2022	20. 01. 2021	Genx code labs	https://play.google.com/store/apps/details?id=lk.habits.modgoviya&pcampaignid=web_share
ගෙවතුවගාව	22.04.2020		Yohan de silva	https://apkpure.com/%E0%B6%9C%E0%B7%99%E0%B7%80%E0%B6%AD%E0%B7%94-

				%E0%B7%80%E0%B6%9C%E0%B7%8F%E0%B7%80-gewathu-wagawa/io.ionic.prog5e91551335b105417bf2a127?utm_source=qrcode&utm_campaign=share&utm_medium=social_network
Yield Price Sri Lanka		07.01.2013	Chandana Napagoda	https://play.google.com/store/apps/details?id=com.chandana.marketprice&pcampaignid=web_share
AgroLIFE	31.10.2023	24. 04.2020	greensoft.co	https://play.google.com/store/apps/details?id=io.ionic.prog5e986cedd814f9698bb3adac&pcampaignid=web_share
AgroLIFE Sri Lanka	24. 04.2020		KOMA Labs	
Goviya Goda APK	20.01.2021		Dilshan (Installs 100+)	https://apkcombo.com/goviya-goda/com.dilshancs.goviyagoda/

මූලාශ්‍රය: අන්තර්ජාල තොරතුරු, 2024

ඉහත සඳහන් වගු සටහනට අයත් ඩිජිටල් ජංගම දුරකතන යෙදුම් පිළිබඳ සවිස්තරාත්මක සටහන් පහත සඳහන් වේ.

GeoGoviya Mobile App

නව්‍ය කෘෂිකර්මයට සහාය වන කාලීන දත්ත ග්‍රහණය කර ගැනීමට හා භාවිතා කිරීමට පහසු වන ලෙස ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ඇති ඇන්ඩ්‍රොයිඩ් (Android) ජංගම යෙදුමක් වන මෙය දත්ත ගබඩා කිරීම, කළමනාකරණය, පාලනය කිරීම ආදිය අන්තර්ජාලය හරහා දුරස්ථ සේවාදායක ජාලයක් භාවිතා කරන සේවා පද්ධතියක් (Cloud Based System) මත පදනම් වූ වෙබ් යෙදුමකි. එය සකස් කර ඇත්තේ කුඩා ඉඩම් හිමි ගොවීන්ගේ ජීවනෝපාය සංවර්ධනය සඳහා පුළුල් ලෙස දත්ත කළමනාකරණය පහසු කරවීම සඳහා ය. එය දැනට දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර නිලධාරීන් විසින් භාවිතා කරන අතර ආරම්භ කර ඇත්තේ IWMI ආයතනය (International Water Management Institute) සහ ඉන්දියානු රජය මැදිහත්වීමෙනි. මෙම යෙදුම අදියර දෙකක් යටතේ සංවර්ධනය කෙරෙන අතර පළමු අදියරේ වැඩකටයුතු 95%ක් මේ වන විට අවසන් වී ඇත. සමීක්ෂණය සහ සිතියම්ගත කිරීම (Surveying & Mapping) මඟින් එක් එක් ගොවියාට අයත් ඉඩම් ප්‍රමාණය මැන ඒ ප්‍රමාණයට අදාළ පොහොර ප්‍රමාණය ගණනය කර ගොවියාට ලබා දීමට මෙම යෙදුම මඟින් හැකි වේ. මෙම යෙදුම භාවිතා කිරීම නිසා ගොවීන්ගේ ඒ සඳහා වන වියදම් අඩු කිරීමට හැකි වනු ඇත. අනාගතයේදී එම යෙදුමේ දෙවන අදියර ආරම්භ කරන අතර ඒ සඳහා අනුග්‍රහය සපයන්නේ ආසියානු සංවර්ධන බැංකුව (Asian Development Bank) වන අතර ගොවිජන සේවා කාරක සභාවට බලය දී ඇති පරිදි වගා කටයුතු සඳහා යොදා ගනු ලබන ගොඩ ඉඩම් මැනීමට හා සිතියම්ගත කිරීමට බලාපොරොත්තු වේ. මෙම යෙදුම සංවර්ධනයේ දී ඇති වූ ගැටලු වන්නේ දිගු කලක් තිස්සේ වගා කටයුතු නොකරන ලද ඉඩම් පළමු වන අදියර යටතේ දී මැනීම, සමහර ඉඩම්වල අයිතිකරුවන් සොයා ගැනීම අපහසු වීම, සමහර පුද්ගලයන් මිය ගොස් ඇති නිසා මායිම් සොයා ගැනීමට නිලධාරීන්ට අපහසු වීම සහ ඉඩම් ආරවුල් (නඩු ඇති ඉඩකඩම්) ඇති ඉඩම් මැනීම සඳහා අවුල් නිරවුල් කරගන්නා තුරු සිටින්නට සිදුවීම වේ (https://geogoviya.com/reports/).

Sugarcane App

උක් පර්යේෂණ ආයතනය විසින් හඳුන්වා දී ඇති මෙම යෙදුම මෙම ආයතනයේ පර්යේෂණ නිලධාරියකු වන U.W.L.M. කුමාරසිරි මහතා විසින් නිර්මාණය කර ඇත. මෙම යෙදුම භාවිතයේ ඇතත් ව්‍යාප්ති සේවයට පහසුකම් සැපයීමේ මට්ටම දක්වා ගොස් නැත. නමුත් මේ වන විට 660 දෙනෙකු පමණ මෙම යෙදුම බාගත කර ගෙන ඇති අතර මෙහි ඉලක්ක ගත කණ්ඩායම වන්නේ උක් වගා කරන ගොවීන් ය. මෙහි සියලුම විස්තර සිංහල භාෂාවෙන් පවතින නිසා එය ගොවීන්ට භාවිතා කිරීමට පහසු වේ. මීට අමතරව උක් කර්මාන්තයට සම්බන්ධ සියලු දෙනාට භාවිතා කිරීමේ හැකියාව ඇත (විශ්වවිද්‍යාල සිසුන්ට හා උක් සම්බන්ධව ඉගෙන ගන්නා පුද්ගලයින්). වර්තමානයේ සීනි කම්හල් රට තුළ ස්ථාපිත වෙමින් පවතිනුයේ එමඟින් විශාල ලාභයක් ඉපැයිය හැකි බැවිනි. කර්මාන්ත දියුණු කිරීම සඳහා සහායක පද්ධතීන් ලෙස යොදා ගත හැකි වීම නිසා මෙම යෙදුම දියුණු කිරීම වඩාත් වාසි දායක වේ. උක් පර්යේෂණ ආයතනය මඟින් සොයා ගන්නා තොරතුරු සෘජුවම ගොවියා වෙත ගෙන යා හැකි වීම ඊට හේතුව යි. මෙහි ගැටලු වන්නේ, එම ආයතනයේ පර්යේෂණ නිලධාරියෙකු විසින් මෙම යෙදුම හඳුන්වා දී ඇති නිසා රාජ්‍ය මැදිහත් වීමක් නොමැති විම යි. ඒ හේතුවෙන් උක් වගාව සම්බන්ධ සීයලුම තොරතුරු මෙමඟින් ලබා ගත හැකි නමුත් නියමිත පරිදි යාවත්කාලීන නොවීමත්, ගොවීන් වෙත හඳුන්වා දීමත් නිසි පරිදි සිදු නොවේ. (https://play.google.com/store/apps/details?id=com.SRIOC.Lahiru&pcampaignid=webshare).

DEA - රුවන් බණ්ඩාර

මෙය යෙදුම රුවන් බණ්ඩාර නම් පුද්ගලයෙකු විසින් හඳුන්වා දෙන ලදී. "අපනයන බෝග වගාවන්වලට සිදුවිය හැකි (පෘෂ්ඨවංශී) සත්ත්ව හානිවලින් වගාවන් ආරක්ෂා කර ගැනීම සඳහා උපාංග ලබා දීම" යනුවෙන් නම් කර ඇති මෙම වැඩසටහන අපනයන බෝග වගාවට ඕලු මුවන්, ඉත්තෑවන්, මී මින්නන්, හාවුන්, ඌරන්, මොනරුන්, වඳුරන් හා වෙනත් පාෂ්ඨවංශී සතුන්ගේ හානි පවතී නම් එයින් වගාව ආරක්ෂා කර ගැනීම සඳහා සුදුසු සූර්යකෝෂ, විදුලි වැට, අතිධ්වනි ශබ්ද තරංග, දැල් වැට, වායු තුවක්කු හෝ වෙනත් සුදුසු ආරක්ෂක පද්ධතියක් ඉඩමේ / ඉඩම වටා සවිකර ගැනීමට ආධාර සැපයීම අරමුණු කරගෙන ඇත. මෙම වැඩසටහනට ඇතුළු වීමට ගොවියා සතුව ගම්මිරිස්, වැනිලා, කුරුඳු, සාදික්කා, කරාබු, එනසාල්, කෝපි, කොකෝවා, බුලත්, පුවක්, ලෙමන් ග්‍රාස්, සිට්‍රොනෙල්ලා හෝ ගොරකා යන අපනයන බෝග වගාවකින් අවම වශයෙන් අක්කර ¼ ක් හිමි අයෙකු විය යුතුය. මෙම වැඩසටහනට අයදුම්පත්‍රයක් අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඉහත වගා ආරක්ෂණ පද්ධතියන් නිර්දේශිත පරිදි සවි කර ගෙන අදාළ ලියකියවිලි සහ බිල්පත් නිසි පරිදි සම්පූර්ණ කර දෙන වගාකරුවන් සඳහා උපරිම ආයෝජන ආධාර හෝ වැය වූ මුදලින් 50%ක ප්‍රමාණය නොමිලේ ලබාදීම සිදු වේ (https://dea.en.aptoide.com/app).

Kiri Aswanu

කිරි ගොවීන්ට තම ගොවිපළ ලාභදායී ලෙස කළමනාකරණය කිරීමට උපකාර කිරීම සඳහා ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් දියත් කරන ලද ජංගම යෙදුමකි. කිරිගොවි කර්මාන්තයේ නවතම පුවත් / විස්තර සිදුවීම් පිළිබඳ යාවත්කාලීන තොරතුරු ලබා ගැනීමට දමෙම යෙදුම භාවිතා කළ හැකි ය. මෙම යෙදුම කිරි ගොවියා හා ප්‍රාදේශීය පශු වෛද්‍ය නිලධාරි සම්බන්ධ කරන මාධ්‍ය වේදිකාවක් ලෙස ක්‍රියා කරයි (https://apkcombo.com/kiriaswanu/com.daphmobile/).

Govi Nena

මෙම යෙදුමේ මූලික අභිප්‍රාය වනුයේ ආහාර සුරක්ෂිතතාවය සාක්ෂාත් කර ගැනීමත් ගොවීන්ට හා පාරිභෝගිකයන්ට ස්ථාවර හා තිරසාර මිලක් ලබා ගැනීමට සහය දීමයි. විද්‍යාත්මක දැනුම භාවිතා කරමින් බෝග තෝරා ගැනීමත්, ඒවා වගා කිරීමත්, යෙදවුම් සැපයුම්, වෙළඳපොළ සම්බන්ධතා සහ ණය පහසුකම් භාවිතා කරමින් බෝග තෝරා ගැනීමට හා වගා කිරීමටත් මෙය ආධාර වේ. වැඩි දියුණු කරන ලද සම්බන්ධීකරණය හේතුවෙන් ගණුදෙනු පිරිවැය හා නාස්තිය අඩු වීම විශේෂ විද්‍යාත්මක තොරතුරු තිබීම හේතුවෙන් ඉහළ ඵලදායීතාව තිරසාර බව වැඩි කිරීමට ගොවීන් සවිබල නැංවීමට ජීවනෝපාය නඟා සිටුවීමට සහ සියලු පාර්ශ්වකරුවන් සඳහා වටිනාකමක් ඇති කිරීමට මෙය හේතු වේ. ප්‍රවීණ දේශීය දැනුම සමඟ නවීන තාක්ෂණය ඒකාබද්ධ කරන මෙය පරිශීලක හිතකාමී යෙදුමකි. (https://play.google.com/store/apps/details?id=com.govinena.app&pcampaignid=webshare).

Export Agriculture Sri Lanka

මෙය ඉගැන්වීම් හා පුහුණු කිරීමේ මෙවලම් ලැයිස්තුවේ ප්‍රකාශිත Android සඳහා නොමිලේ හඳුන්වා දෙන ලද යෙදුමකි. මෙම යෙදුම නිර්මාණය කර ඇත්තේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන බෝග පිළිබඳ වැඩි විස්තර ලබා දීම සඳහා ය. මෙම යෙදුම භාවිතා කිරීමෙන් අපනයන කෘෂිකාර්මික නිෂ්පාදන මොනවාද යන්නත්, වගාවක් ආරම්භ කිරීමට සුදුසු ඉඩමක් තෝරා ගන්නේ කෙසේ ද යන්නත්, බෝග සිටුවීමට අවශ්‍ය ප්‍රදේශය ගණනය කිරීම, පොහොර යෙදීම, හඳුනා ගත් රෝග හා එම රෝගවලින් වළක්වා ගැනීම හා අවසානයේ අස්වැන්න නෙළීමේ ක්‍රමය ද ලබාගත හැකි වේ (https://apkcombo.com/export-agriculture-sri lanka/com.exportagriculture.mashaupul.aggrinew/).

Food Gate Sri Lanka

මෙම ජංගම යෙදුම ආහාර සුරක්ෂිතතාව සහ පෝෂණය සහතික කිරීම පිළිබඳ ශ්‍රී ලංකා රජයේ නවතම වැඩසටහනක කොටසකි. මෙම යෙදුම පහත සඳහන් ප්‍රධාන ක්ෂේත්‍ර තුන පිළිබඳ සත්‍ය දත්ත ග්‍රහණය කර ගැනීමට බිම් මට්ටමේ වේදිකාවක් සපයයි.

1. එක් එක් බිම් කොටසේ වගා කරන ලද බෝග පිළිබඳ විස්තරය
2. ආහාර අනාරක්ෂිත පවුල්වල විස්තර
3. මන්දපෝෂණයෙන් පෙළෙන දරුවන්ගේ හා ගැබිණි මව්වරුන්ගේ විස්තර

(**https://play.google.com/store/apps/details?id=com.icta.foodgate&pcampaignid=web_share**).

Helaviru

හෙළවිරු යෙදුම නිර්මාණය කර ඇත්තේ "හෙළවිරු වෙළඳ වේදිකාව" සඳහා කෘෂි වෙළඳාමේ යෙදී සිටින සහභාගී වන්නන් සම්බන්ධ කිරීම සඳහා ය. හෙළවිරු ගොවියන් සහ නායකයින්ට යෙදුම හරහා එම වේදිකාව සඳහා ලියාපදිංචි විය හැකි ය. ලියාපදිංචිය සාර්ථක වූ පසු ගොවීන්ට යෙදුම හරහා හෙළවිරු වෙළඳපොළ සඳහා තම කෘෂි නිෂ්පාදන ලැයිස්තුගත කළ හැකි ය. හෙළවිරු කෘෂි නිෂ්පාදන හා භාණ්ඩ වෙළඳ වේදිකාව විවිධ පාර්ශ්වකරුවන් අතර බාධාවකින් තොරව වෙළඳාම් කිරීමට හා කෘෂි නිෂ්පාදන හා භාණ්ඩ හුවමාරු කර ගැනීමට පහසුකම් සපයන ඩිජිටල් වෙළඳපොළකි. එය ගොවීන්, එකතු කරන්නන්, තොග වෙළෙන්දන්, තොග ගැණුම්කරුවන්, කුඩා හා මහා පරිමාණ පාරිභෝගිකයින් සහ තුන්වන පාර්ශ්වීය සේවා සපයන්නන් සැපයුම් හා රක්ෂණ ලෙස ඒකාබද්ධ කෘෂි නිෂ්පාදන සහ භාණ්ඩ සැපයුම් දාමයේ පරිසර පද්ධතියක් නිර්මාණය කරනු ඇත.

හෙළවිරු ගොවි යෙදුම ගොවීන් සඳහා දායක වන අතර හෙළවිරු වෙළඳපොළේ වෙළඳාම සඳහා ඔවුන්ගේ නිෂ්පාදන ලැයිස්තුගත කිරීමට හෙළවිරු ලීඩ්ස් (Helaviru Leads) දායක වේ. (හෙළවිරු ලීඩ්ස් යනු ගොවීන් වෙනුවෙන් ගොවි කටයුතු සිදු කරන හෙළවිරු කෘෂි නිෂ්පාදන සහ වෙළඳ භාණ්ඩ, වෙළඳ වේදිකාවේ සහභාගී වන්නන් වේ
(https://play.google.com/store/apps/details?id=com.helavirufarmermobi&pcampaignid).

Hela Nutrition

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ලද ආහාර හා පෝෂණය සඳහා ජෛව විවිධත්ව ව්‍යාපෘතිය මඟින් ශ්‍රී ලාංකීය ජනතාව දේශීය ආහාර පරිභෝජනයට යොමු කිරීමට සහ සමබර සෞඛ්‍ය සම්පන්න ජීවන රටාවක් ලබා ගැනීම සඳහා "හෙළ පෝෂණ" ඩිජිටල් යෙදුම කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් හඳුන්වා දෙන ලදී. ක්ෂණික ආහාර සංස්කෘතියෙන් ඈත් වී සෞඛ්‍ය සම්පන්න සාම්ප්‍රදායික ශ්‍රී ලාංකීය ආහාරවලට යොමු වීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක වන හෙළ බොජුන්හල් සාම්ප්‍රදායික ආහාර මධ්‍යස්ථානයේ සහාය මෙම යෙදුමට ලැබී ඇත. කැලරි මත පදනම් වූ සෞඛ්‍ය සම්පන්න ආහාර පරිභෝජනය පිළිබඳ ජනතාව දැනුවත් කිරීම සහ ශ්‍රී ලාංකීය ආහාර සමඟ ඔවුන්ගේ ආහාර පිහාන නිර්මාණය කිරීම සඳහා 'හෙළ පෝෂණය' ඩිජිටල් යෙදුම නිපදවා ඇත. දේශීය ආහාර වේලක් පරිභෝජනය කිරීමට කැමති පාරිභෝගිකයින්ට වර්තමානයේ 'හෙළ පෝෂණය' යෙදුම හරහා 'හෙළ බොජුන්' අලෙවිසැල් වලින් ආහාර ද්‍රව්‍යවල කැලරි වටිනාකමට අනුව මිල දී ගත යුතු දේ පහසුවෙන් තෝරා ගත හැකි ය. හෙළ බොජුන් අලෙවි කරන ප්‍රමාණයට අනුව ආහාර ද්‍රව්‍යවල පෝෂණ පැතිකඩ ද පාරිභෝගිකයින්ට දැකගත හැකි අතර එමඟින් පරිභෝජනය කරන ආහාර ද්‍රව්‍ය පිළිබඳ අවබෝධයක් ලබා දේ.
(https://apkcombo.com/hela-nutrition/org.bfn.srilanka/).
(https://apkcombo.com/agriculture-department-srilanka/com.Labs.Agriculture.DepSriLanDL/).

Hela Bojun

මෙම යෙදුම බාගත කර ගැනීම මඟින් ඉවුම් පිහුම් අත්දැකීම නව මාවතකට රැගෙන යා හැකි ය. දිනපතා ආහාර වට්ටෝරු යාවත්කාලීන කිරීම සහ පුද්ගලයින්ගේ සූප ශාස්ත්‍ර කුසලතාවය ප්‍රදර්ශනය කිරීමටත් කාන්තාවන්ට ව්‍යවසායිකාවන් ලෙස ගොඩනැගෙන්නටත් වේදිකාවක් මෙමඟින් සපයයි
(https://apkcombo.com/hela-bojun/doa.gov.lk.helabojun/).

SL – GAP

මෙම යෙදුම හරහා එළවළු හා පලතුරු සඳහා බෝග පදනම මත යහපත් කෘෂිකාර්මික පිළිවෙත් හඳුන්වා දෙනු ලැබේ. නිෂ්පාදකයන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තත්ත්ව සහතික සැපයුම්කරුවන් ලෙස ලියාපදිංචි වී සහතික කර ඇති අතර අදාළ පාර්ශ්වකරුවන්ට අවශ්‍ය තොරතුරු සැපයීම සඳහා දත්ත මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියා කරයි. යෙදුමේ අන්තර්ගතය වන්නේ,

(1) ඔබගේ නිෂ්පාදන සඳහා GAP සහතිකය ලබා ගන්නේ කෙසේ ද?
(2) GAP ගොවියෙකු ලෙස සහතික වීමේ ප්‍රතිලාභ
(3) සාර්ථක පුවත් (Success Stories) වශයෙනි.

(https://m.apkpure.com/sl-gap/com.doasl.doagap.sl_gap).

AiGrow

ගොවීන්ට / වගාකරුවන් වගාවට යොමු කිරීමට වේදිකාවක් (Platform) ලෙස මෙම යෙදුම ක්‍රියාකරන අතර පාලිත හරිතාගාර හා ස්වයං තිරසාර ගෘහ ඒකක හරහා සෞඛ්‍ය සම්පන්න නැවුම් වගාවන් අධීක්ෂණය කිරීම සහ ප්‍රජාවන් වර්ධනයට දිරිගැන්වීමේ වේදිකාවක් ලෙස ක්‍රියා කරයි. (https://play.google.com/store/apps/details?id=com.vega.aigrow&pcampaignid=webshare).

CBL Smart Agro

ඩිජිටල්කරණය හා තාක්ෂණය භාවිතා කරමින් සිය සැපයුම් දාමය හා බැඳුණු අනාගත අවදානම් කළමනාකරණය කර ගැනීමේ තවත් පියවරක් ලෙස **Smart Agro** ඩිජිටල් මෘදුකාංගය එළි දක්වා ඇත. නොමිලේ බාගත කරගත හැකි මෙම යෙදුම හරහා අලුත් ගොවීන්ගේ ලියාපදිංචි කටයුතු මෙන්ම එසේ ලියාපදිංචි වූ ගොවීන්ට ණය පහසුකම් ලබා ගැනීම, කොන්ත්‍රාත් කොන්දේසි කළමනාකරණය මෙන්ම CBL කෘෂි ක්ෂේත්‍ර නිලධාරීන්ගේ සහාය එ සැනින් ලබා ගැනීම ආදී සේවා රැසක් පහසුවෙන් ලබා ගත හැකි ය. වර්ධනය වන ඉල්ලුමට සාපේක්ෂව CBL ආහාර අමුද්‍රව්‍ය සපයා ගැනීමේ ක්‍රියාවලිය ද ගෙවුණු වසර කිහිපය තුළ ප්‍රසාරණය වී ඇත. එහි දී අමු ද්‍රව්‍ය සපයා ගැනීම ආශ්‍රිත විනිවිද භාවය සහ අඛණ්ඩ සන්නිවේදන කටයුතු වෙනුවෙන් අතිශය වැදගත් පියවරක් ලෙස මෙම ඩිජිටල් යෙදුම හඳුන්වාදී ඇත.

Smart Agro ව්‍යාපෘතිය මඟින් CBL ආයතනය ආහාර අමුද්‍රව්‍ය සැපයුම් දාමය මුහුණ දෙන අවදානම් තත්ත්ව කිහිපයකට විසඳුම් සපයන අතර විශේෂයෙන්ම ගොවි ප්‍රජාවට තම අස්වනු ඵලදායිත්ව ඉහළ නංවමින් වැඩි ලාභයක් අත්පත් කර ගැනීමට අවශ්‍ය වැදගත් කළමනාකරණ තීරණ ගැනීමට මෙම යෙදුම උපකාරී වේ
(https://play.google.com/store/apps/details?id=com.smartagroapp&pcampaignid=web).

Govi Mithuru

මෙය ගොවීන්ට උපදේශන සේවා සපයන අතර මෙහි 60,000ක් පමණ ක්‍රියාකාරී සාමාජිකයන් සිටින බව තරුෂ වනිගසේකර මහතා පැවසී ය. මෙම යෙදුම සමඟ සේවාව ද සපයනු ලබයි. මෙම යෙදුම භාවිතා කරන ගොවීන්ගේ අස්වනු 30%කින් වැඩිකර ගැනීමටත්, ගොවීන්ට නව දැනුම වෙත යාමේ කැමැත්තක් ගොඩනැංවීමට ද මෙය සමත් වී ඇත. ඉදිරියේදී AI (Artificial Intelligence) තාක්ෂණය භාවිතා කරමින් මෙම යෙදුම හරහා බෝගවල පෝෂණ ඌනතා තත්ත්ව හඳුනා ගැනීමට ද හැකිවන පරිදි මෙම යෙදුම දියුණු කිරීමේ අපේක්ෂාවක් ඇත. මෙම සේවාව සඳහා ලියාපදිංචි වූ පුද්ගලයින්ගෙන් දිනකට රු. 2.00ක බදු අය කරන අතර Govi Mithuru යනු බෝග සුරක්ෂිත කිරීම සහ පවුල් සෞඛ්‍ය යන තේමාව යටතේ ජංගම දුරකථන පදනම් කරගත් කෘෂිකර්ම උපදේශන සේවාව කි. මෙම යෙදුම ගොවීන්ට නියමිත වේලාවට අදාළ සහ නිවැරදි තොරතුරු වෙත ප්‍රවේශ වීමට ඉඩ සලසමින් ශ්‍රී ලංකාවේ ගොවිතැනේ වේගවත් වර්ධනයට අනුබල දෙයි. වගාවේ එක් එක් අවධීන්, වාරිමාර්ග වර්ග, බීජ වර්ග ආදිය එක් එක් ගොවියාගේ අවශ්‍යතා අනුව ලබාගත හැකිවන අයුරින් සකස් කර ඇත. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ අනෙකුත් බලයලත් ආයතන විසින් සපයනු ලබන අන්තර්ගතයන් සමඟින් ගොවි මිතුරු යෙදුම මඟින් ගොවීන් සඳහා බෝග ආරක්ෂණ හා පළිබෝධ සහ රෝග තොරතුරු කළමනාකරණ පිළිවෙත්, ගෙවතු වගාව සම්බන්ධ තොරතුරු, මල් වගා තොරතුරු, බෝග මිල සහ අනාගත බෝග සැලසුම් නිර්දේශ, බෝග මිල නියම කිරීමේ සේවාව මඟින් දෛනික පදනමින් ප්‍රධාන වෙළඳපළ ස්ථාන සහ ආර්ථික මධ්‍යස්ථානවලින් එකතු කරන තොග මිල තොරතුරු ද ගොවියාට මෙම යෙදවුම හරහා ලබාගත හැකි ය. සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා තුනෙන්ම පහසුවෙන් ගොවියාට තේරුම් ගත හැකි ආකාරයෙන් එය තොරතුරු සපය යි. ගොවීන්ට නවතම තොරතුරු වෙත ප්‍රවේශය ඇති බව සහතික කිරීම සඳහා ගොවි මිතුරු යෙදුම අඛණ්ඩව යාවත්කාලීන කරනු ලබයි. මෙම යෙදුම මඟින් එක් එක්

ගොවියාගේ තනි ගොවිතැන් පිළිවෙත් සහ ගොවියා වාසය කරන අදාළ කෘෂි - පාරිසරික කලාපය සම්බන්ධ තොරතුරු ද පළිබෝධ රෝග ඇතුළුව නිරන්තරයෙන් වෙනස් වන කෘෂිකාර්මික තත්ත්වයන් සම්බන්ධ හදිසි තොරතුරු පෙර දැනුම් දීම් කරන අතර ප්‍රතිචාර දැක්වීමට ද ප්‍රමාණවත් කාලයක් ලබා දෙයි.
https://play.google.com/store/apps/details?id=com.arimaclanka.android.govimithuru&pcampaignid=web_share

Lanka Flower APK

මෙම යෙදුම නිර්මාණය කර ඇත්තේ පුළුල් පරාසයක මල් සපයන්නන්ගේ තොරතුරු පහසුවෙන් සැපයීම සඳහා ය. මෙය ලංකාවේ ඇති විශාලතම මාර්ගගත මල් වෙළඳපළකි. මල් හා පැළ මෙන්ම උද්‍යාන විද්‍යාව සහ කෘෂිකර්මාන්තයට අදාළ වෙනත් යෙදවුම්, උපකරණ සහ මෙවලම් මිල දී ගැනීමට සහ විකිණීමට හැකියාව මෙම යෙදුම තුළ පවතී. විවිධ වර්ගයේ මල් වර්ග සහ සැපයුම්කරුවන් මෙම යෙදුම හරහා සොයා ගත හැකි ය. එමෙන්ම මල් ගොවීන්ගේ ප්‍රචාරණ කටයුතු ද මේ ඔස්සේ සිදු කළ හැකි ය.

Sri Lankan Pepper Farmer App

මෙම ජංගම යෙදුම ගම්මිරිස් ගොවීන්ට වගාව සම්බන්ධ කාලෝචිත තොරතුරු වන ගම්මිරිස් වගා කිරීම, පළිබෝධ හා රෝග පාලනය කිරීම, ඔවුන්ගේ නිෂ්පාදන අලෙවි කිරීම යනාදිය පිළිබඳ කාලෝචිත උපදෙස් ලබා ගැනීමට සහය වේ. එම නිසා ගොවීන්ට ඔවුන්ගේ ප්‍රශ්නවලට විශේෂඥයින්ගෙන් ක්ෂණික තොරතුරු ලබා ගැනීමට උපකාරී වේ. එමෙන්ම වෙළඳපළ සම්බන්ධ කිරීමේ විශේෂාංගය ගොවීන්ට තම නිෂ්පාදන අලෙවි කිරීමට උපකාරී වේ. අන්තර්ජාලය නොමැති විට පවා මෙම යෙදුම ක්‍රියා කරයි.
(https://m.apkpure.com/lanka-flowers/lk.ifsolutions.lankaflowers)

Weladapola App

කෘෂිකර්මාන්තය හා සම්බන්ධ නිෂ්පාදන මිල දී ගැනීම සහ විකිණීම සඳහා භාවිතා කළ හැකි ඩිජිටල් වෙළඳපොළකි. එමඟින් කෘෂි නිෂ්පාදන මිල දී ගැනීම් හා විකුණුම් පළ කර ගැනීමේ අවකාශය, කෘෂිකාර්මික ව්‍යාපාර සම්බන්ධ රැකියා ඇබෑර්තු පළ කිරීමේ හැකියාව, ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රකාශිත යාවත්කාලීන මිල දර්ශන ලබා ගැනීමේ හැකියාව, භාණ්ඩ ප්‍රවාහනය කිරීමට සහ කෘෂිකාර්මික වශයෙන් වැදගත් වන වාහන සොයා ගැනීමට සහ කෘෂිකාර්මික වශයෙන් වැදගත් වීඩියෝ නැරඹීමේ පහසුව පවතී.
(https://play.google.com/store/apps/details?id=com.scl.weladapola&pcampaignid=web_share

Elawalu Wagawa

මෙම යෙදුම නිර්මාණය කර ඇත්තේ එළවළු වගා කිරීමට අවශ්‍ය තොරතුරු ගොවීන් වෙත ලබා දීම සඳහා ය. ගොවීන් මෙන්ම තම ගෙවත්තේ මහා පරිමාණයෙන් එළවළු වගා කිරීමට කැමති අයට ඉතා ප්‍රයෝජනවත් යෙදුමකි. මෙහි එළවළු වර්ග 17ක් ඇතුළත් අතර ඒවා වගා කරන්නේ කෙසේ ද කළමනාකරණය කරන්නේ කෙසේ ද? යන්නත් ඇතුළත් වන අතර ගෙවතු වගාව කර ගෙන යාමට සහායකයක් වේ.
(https://play.google.com/store/apps/details?id=io.ionic.prog5f71ca85108b525f97e18be7&pcampaignid=web_share)

Govi Litha

මෙම යෙදුම මඟින් පැළ සිටුවීමට සුබ කාලසීමාවන් පෙන්වා දෙන අතර එය පරිසරවේදී තිලක් කන්දේගමගේ නිර්මාණාත්මක සංකල්පයකි. මෙම යෙදුම මඟින් පරිශීලකයන්ට ඔවුන්ගේ ශාකයේ තොරතුරු ඇතුළත් කළ හැකි අතර, යෙදුම මඟින් එම ශාකවලට අවශ්‍ය ජලය, පොහොර යෙදීමට අදාළ හොඳම දින (නැකැත්වලට අනුව) ලබා දෙන අතර අස්වැන්න නෙළා ගැනීමට හොඳ දින එමඟින් ලබා ගත හැකිය.
(https://play.google.com/store/apps/details?id=thothanna_innovations.project.govilitha&pcampaignid=web_share)

Spice Price Sri Lanka

මෙම යෙදුම මඟින් ශ්‍රී ලංකාවේ කුළුබඩු (පුවක්, බුලත්, එනසාල්, කුරුඳු, කරාබුනැටි, කොකෝවා, කෝපි, සාදික්කා, ගම්මිරිස්) මිල ගණන් පිළිබඳ විස්තර ලබාගත හැකිය. මෙය මිල විචලනය තේරුම් ගැනීමට හා ශ්‍රී ලංකා කුළුබඩු මිල දී ගැනීමට හෝ විකිණීමට හොඳම වෙළඳපොළ සොයා ගැනීමට උපකාරී වේ. මහනුවර, මාතලේ, නුවරඑළිය, කෑගල්ල, රත්නපුර, බදුල්ල, මොනරාගල, ගාල්ල, මාතර, හම්බන්තොට, කුරුණෑගල, කොළඹ, ගම්පහ, කලුතර එවැනි දිස්ත්‍රික්කවල නවතම මිල තොරතුරු ලබාගත හැකිය.
(https://play.google.com/store/apps/details?id=com.dulithaeshan.spiceprices&ref=apkcombo.com)

Mod goviya

මෙම යෙදුම මඟින් ශ්‍රී ලංකාවේ ගොවිතැන සඳහා මාර්ගෝපදේශ සපයයි. මෙහි දී නවීන ගොවිතැන් ශිල්ප ක්‍රම, නවීන තාක්ෂණය භාවිතා කරන්නේ කෙසේ ද? යන්නත්, කෘෂි කර්මාන්තයේ නව ප්‍රවණතා පිළිබඳව තොරතුරු ලබා දෙයි.
(https://play.google.com/store/apps/details?id=lk.habits.modgoviya&pcampaignid=web_shar)

Yield price Sri Lanka

වෙළඳපළට නොගොස් විවිධ භාණ්ඩවල මිල ක්ෂණිකව පරීක්ෂා කළ හැකි ය. කොළඹ මැනින් වෙළඳපොළ මිල ගණන් සමඟ සතිපතා මිල තොරතුරු යාවත්කාලීන කෙරේ. භාෂා තුනෙන්ම විස්තර ලබා ගත හැකිය.
(https://play.google.com/store/apps/details?id=com.chandana.marketprice&pcampaignid=web_share)

AgroLiFE

මෙමඟින් කෘෂිකර්ම නිෂ්පාදන ක්‍රියාවලින් එකවර සැලසුම් කිරීමට, සංවිධානය කිරීමට හා කළමනාකරණය කිරීමට කෘෂි නිලධාරීන් හා කෘෂිකාර්මික කටයුතුවල නියැළෙන පුද්ගලයන්ට පහසු වන පරිදි අස්වනු සකස් කරනු ලබයි. අස්වැන්න වැඩි කිරීම, මුළු ආදායම වැඩි කිරීමට මෙන්ම, වියදම් අඩු කිරීමට සහ බීජ සඳහා අවශ්‍ය වියදම් පිළිබඳ දත්ත මෙම යෙදුම හරහා ජනනය කරයි.

Agro Life Sri Lanka

මෙමඟින් බෝග නිෂ්පාදනය, බෝග ආරක්ෂණය, යන්ත්‍රෝපකරණ සහ දේශගුණ බලපෑම, අස්වනු ගබඩා කිරීමේ ක්‍රියා පටිපාටි සහ අදාළ සියලුම සේවාවන් පිළිබඳ සම්පූර්ණ තොරතුරු සපය යි. එය ගොවීන්ට ඔවුන්ගේ බෝගවලට බලපාන ගැටලු හඳුනා ගැනීමට හා නිවැරදි ක්‍රියාමාර්ග යෝජනා

කිරීමට උපකාරී වේ. එමෙන්ම කෘෂිකර්මාන්තයට අදාළ ප්‍රශ්න විසඳීමට සහාය වන සේවාවක් ද සපය යි. මෙම යෙදුමේ ඉලක්ක කණ්ඩායම ගොවීන්, කෘෂිකාර්මික ව්‍යවසායකයන් සිසුන් හා අනෙකුත් කෘෂිකාර්මික තොරතුරු සොයන පාර්ශ්වකරුවන් ය. එමඟින් සිසුන්ට කෘෂිකර්මය පිළිබඳ ඉගෙනීමට අවශ්‍ය දැනුම ලබා දෙන අතර බොන්සායි වගා කිරීමට අවශ්‍ය තොරතුරු ද ලබාගත හැකි ය. එමෙන්ම නව තාක්ෂණික තොරතුරුවලට අදාළව විස්තර ද මෙම යෙදුම මඟින් සපය යි. (https://play.google.com/store/apps/details?id=io.ionic.prog5e986cedd814f9698bb3adac&pcampaignid=web_share)

Goviya goda

වී මිලදී ගැනීම හා විකිණීම සඳහා භාවිතා කළ හැකි ඩිජිටල් යෙදුමකි. ගැනුම්කරුවන් හා විකුණුම්කරුවන් අතර සම්බන්ධතාවය අතරමැදියන් නොමැතිව පවත්වාගෙන යා හැකි ය. අතරමැදියා සඳහා යන වියදම ඉතිරිකර ගත හැකි ය. එදිනෙදා අලුත් වන වී මිල දැකගත හැකිය. https://apkcombo.com/goviya-goda/com.dilshancs.goviyagoda/

ඉහත සවිස්තරාත්මකව ඉදිරිපත් කෙරුණු ජංගම දුරකථන යෙදුම් තුළ කෘෂි ක්ෂේත්‍රයේ ගොවීන්ට අවශ්‍ය බොහෝ දැනුම හා තොරතුරු ඇතුළත් වන නමුත් බහුතරයක් යෙදුම් කාලීනව එම යෙදුම්වල අන්තර්ගත දැනුම හා තොරතුරු යාවත්කාලීන නොවන බව පෙනී යයි. මේ හේතුවෙන් ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාවන් අදාළ පරිදි යම් නියාමනයකට යටත්ව දියුණු කළ යුතු මට්ටමක පවතී. යාවත්කාලීන වෙමින් ඉතා වැදගත් දැනුම හා තොරතුරු සපයන යෙදුම් තවදුරටත් දියුණු කිරීමත් පුළුල් කිරීමත් සිදුකළ යුතු වේ.

3.4. ශුදුඅත විශ්ලේෂණය (SWOT Analysis)

SWOT ශුදුඅත විශ්ලේෂණයක් මඟින් සංවිධානයක් තුළ හෝ සමස්තයක් ලෙස ඩිජිටල් කාෂිකාර්මික ව්‍යාප්ති සේවා පද්ධතිය තුළ විවිධ ශක්තීන්, දුර්වලතාවන්, අවස්ථාවන් හා තර්ජන තක්සේරු කිරීමට හැකි වේ. මෙම අධ්‍යයනයයේ දී කෘෂිකාර්මික ව්‍යාප්ති පද්ධතිය තුළ ඩිජිටල් කාෂිකාර්මික ව්‍යාප්ති සේවාවන් සපයන්නන් කෙරෙහි අවධානය යොමු කරන ලදී. ඒ අනුව, ඩිජිටල් කාෂිකාර්මික ව්‍යාප්ති සේවාවන් සැපයීමට අදාළ පුද්ගලයින් හා නිලධාරින් සමඟ කරන ලද සම්මුඛ සාකච්ඡාවන් මඟින් රැස්කරගනු ලැබූ දත්ත හා තොරතුරු ආශ්‍රිතව සිදුකළ ශුදුඅත විශ්ලේෂණයේ (SWOT Analysis) ප්‍රතිඵල අනුව ඩිජිටල් කාෂිකාර්මික ව්‍යාප්ති සේවාවන් හි ශක්තීන්, දුර්වලතාවන්, අවස්ථාවන් හා තර්ජන පහත පහත පරිදි හඳුනා ගන්නා ලදී. එ මඟින් ඩිජිටල් කාෂිකාර්මික ව්‍යාප්ති සේවාවන් හි වර්තමාන තත්ත්වයට අදාළ ශක්තීන්, දුර්වලතාවන්, අවස්ථාවන් හා තර්ජන තක්සේරු කරන ලදි. පහත සඳහන් වගුවේ එම විශ්ලේෂණයට අදාළ සොයාගැනීම් දක්වා ඇත.

වගුව 3.4 ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාවන් හි ශක්තීන්, දුර්වලතාවන්, අවස්ථාවන් හා තර්ජන

ශක්තීන් (Strengths)	දුර්වලතාවයන් (Weaknesses)
• කෘෂිකාර්මික ක්ෂේත්‍රයකට අදාළව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතයට ජාතික මට්ටමේ කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානයක් (NAICC) ස්ථාපිත වී තිබීම.	• බොහෝ ගොවීන්ට (විශේෂයෙන් ග්‍රාමීය ප්‍රදේශවල) ඩිජිටල් මෙවලම් සහ වේදිකා ඵලදායි ලෙස භාවිතා කිරීමට කුසලතා නොමැති වීම.
• අවශ්‍ය විටෙක තොරතුරු හා දැනුම වෙත ප්‍රවේශ වීමට ගොවීන්ට හැකි වන පරිදි ඩිජිටල් ව්‍යාප්ති සේවා එම ආයතන තුළ අවශ්‍ය වේලාවට විවෘතව තිබීම.	• ආන්තික ග්‍රාමීය කෘෂි අංශවල ස්මාර්ට් ෆෝන්, පරිගණක හෝ අන්තර්ජාලය වෙත සීමිත ප්‍රවේශය හා එම මෙවලම් මිලට ගැනීමට ගොවීන්ට මූල්‍ය අපහසුතා පැවතීම.
• ඩිජිටල් වේදිකා මඟින් දැනුම හුවමාරු කර ගැනීම, ඉගෙනීම සහ ප්‍රජා සංවර්ධනය ඉහළ නැංවීම සඳහා විශේෂඥයින් හා රාජ්‍ය සේවා සමඟ ගොවීන් සම්බන්ධ කළ හැකි වීම.	• ග්‍රාමීය හෝ දුරස්ථ ප්‍රදේශවල දුර්වල අන්තර්ජාල හෝ ජංගම ජාල ආවරණය නිසා ඩිජිටල් කෘෂි ව්‍යාප්ති සේවාවන් සුමටව බෙදා හැරීමේ බාධාවන් පැවතීම.
• ගොවීන් විශාල සංඛ්‍යාවකට එකවර තොරතුරු ලබා ගැනීමේ හැකියාව පැවතීම.	• දෙමළ භාෂා මාධ්‍ය කතා කරන ප්‍රදේශයන් හි කෘෂිකාර්මික ප්‍රජාවට ඩිජිටල් මෙවලම් භාවිතයෙන් දැනුම හා තොරතුරු සැපයීමට අවශ්‍ය දෙමළ භාෂා මාධ්‍ය නිලධාරීන්ගේ හිඟයක් පැවතීම.
• ගොවීන්ට කාලෝචිත සහ නිවැරදි කෘෂිකාර්මික උපදෙස්, හොඳම භාවිතයන්, කාලගුණ අනාවැකි, පළිබෝධ පාලන ක්‍රම පිළිබඳව තොරතුරු ලබා ගත හැකි වීම.	• තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සහිත ව්‍යාප්ති මෙවලම් ගැන ගොවීන්ගේ අඩු දැනුවත් භාවය.
• ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානයට අමතරව වෙනත් රාජ්‍ය ආයතන, පෞද්ගලික අංශය සහ පුද්ගලයින් විසින් තොරතුරු හා දැනුම ගත හැකි ඩිජිටල් කෘෂිකාර්මික ජංගම දුරකතන යෙදුම් රාශියක් නිර්මාණය කර තිබීම	• තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සහිත ව්‍යාප්ති මෙවලමක් වන ඩිජිටල් කෘෂිකාර්මික ජංගම දුරකතන යෙදුම් පවතින බව හෝ ඒවා ජංගම දුරකතනයට බාගත කරගැනීම ගැන හෝ ගොවීන්ගෙන් බහුතරයක් නොදැන සිටීම.
	• ඩිජිටල් යෙදුම් හා වෙබ් පිටුවල තොරතුරු හා දැනුම නිවැරදි වේලාවට යාවත්කාලීන නොවීම හා දුරකතන අනුවාදයට අනුව යෙදුම් යාවත්කාලීන නොවීම.

අවස්ථාවන් (Opportunities)	තර්ජන (Threats)
• දත්ත හා තොරතුරු සෑම ක්ෂේත්‍රයකටම අත්‍යවශ්‍ය බව රාජ්‍ය මට්ටමින් ඇති පිළිගැනීම. • තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය හා භාවිතයන් පිළිබඳ වැඩිහිටි ප්‍රජාව තුළ යම් පිළිගැනීමක් ගොඩනැඟී තිබීම. • තරුණ ප්‍රජාවගේ ආකර්ෂණය ඉහළ මට්ටමින් පැවතීම හා ඒවා භාවිතයට ඇති ඉහළ නැඹුරුව. • තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය හා සම්බන්ධ උපාංග සුලභ වීම හා පරිශීලක පහසුකම් සහිත උපාංග බහුල වීම. • බහුතර පිරිසක් එම උපාංග පිළිබඳ දැනුවත්භාවයෙන් යුක්ත වීම.	• ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති මෙවලම් භාවිතා කරමින් ප්‍රමිතියකින් තොර තොරතුරු හා දැනුම සැපයීමේ හේතුවෙන් එම මෙවලම් භාවිතයට ගොවීන්ගේ ඇති අඩු නැඹුරුව. • වගකීමක් හෝ වගවීමක් නොමැතිව පෞද්ගලික ව හා තනි පුද්ගල වශයෙන් යෙදුම් නිර්මාණ බිහි කිරීම නිසා ඒවා ගැන ගොවීන් තුළ විශ්වාසය බිඳ වැටී තිබීම. • එවැනි යෙදුම්වලින් නිර්වද්‍යතාව අඩු තොරතුරු හා දැනුම සැපයීම නිසා රාජ්‍ය අංශයෙන් ඉදිරිපත් කෙරෙන මෙවලම් පිළිබඳවත් ගොවීන්ගේ විශ්වාසය හීන වී තිබීම.

සිව්වැනි පරිච්ඡේදය

ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාවන් භාවිතා කිරීමේ දී ගොවීන් සතු විභවයන් සහ බාධක

4.0. හැඳින්වීම

ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාව භාවිතා කිරීම සම්බන්ධයෙන් ගොවි මට්ටමේ විභවයන් සහ බාධක හඳුනා ගැනීම සඳහා තෝරා ගත් ගොවීන් සමඟ සිදුකළ ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා සහ කෙටි ප්‍රශ්නාවලී සමීක්ෂණයන්ගෙන් ලද තොරතුරු විශ්ලේෂණයක් මෙම පරිච්ඡේදයට අයත් වේ.

4.1. අධ්‍යයනයට සහභාගී වූ ගොවීන්ගේ ප්‍රජාවිද්‍යාත්මක ලක්ෂණ

ශ්‍රී ලංකාවේ ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාව පිළිබඳ අධ්‍යයනය සඳහා සහභාගී වූ ගොවීන්ගෙන් බහුතර පිරිස පුරුෂයින් (71%) වූ අතර කාන්තාවන් 29%ක් විය. වයස් මට්ටම් සැලකීමේ දී අධ්‍යයනය සඳහා සහභාගී වූ අති බහුතරය (88%) වයස අවුරුදු 40 ඉක්මවූවන් විය. වයස අවුරුදු 20 - 40 අතර වූ තරුණ කාණ්ඩය ලෙස සැලකිය හැකි ගොවීන් 12%කි. ගොවීන්ගෙන් 6 වසර -11 වසර දක්වා උගත් පුද්ගලයින් 22%ක් ද අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ සමතුන් 24%ක් ද අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ සමතුන් 23%ක් ද වූහ. ඩිප්ලෝමාධාරීන් 2%ක් සහ සහ උපාධිධාරීන් 3%ක් ද මෙම පිරිසට අයත් වූහ.



ප්‍රස්තාර අංක 4.1: ස්ත්‍රී/පුරුෂ භාවය අනුව ව්‍යාප්තිය
මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2024



ප්‍රස්තාර අංක 4.2: වයස අනුව ව්‍යාප්තිය
මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2024



ප්‍රස්තාර අංක 4.3: අධ්‍යාපනය අනුව ව්‍යාප්තිය
මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2024

ගොවීන්ගෙන් 84%ක් තම ප්‍රධාන රැකියාව ලෙස ගොවිතැන සිදු කරති. ඊට අමතරව රජයේ රැකියා, පෞද්ගලික අංශයේ රැකියා, කෘෂි ව්‍යවසායකයින් සහ ස්වයංරැකියා තම ප්‍රධාන රැකියාව කොට ගනිමින් ගොවිතැන් කටයුතු ද සිදු කරන ගොවීන් 16%ක් විය (ප්‍රස්තාර අංක 4.4). ගොවිතැන ප්‍රධාන ජීවිකාව වූ ගොවීන්ගෙන් 98%ක් වී වගාවේ නියැළෙන අතර එළවළු (24%), පළතුරු (11%), අතිරේක ආහාර බෝග (11%), පොල්, පුවක්, බුලත් සහ කජු (23%) වගාවන් හි සහ කිරිගව පාලනයෙහි (9%) නියැළෙති (ප්‍රස්තාර අංක 4.5).



ප්‍රස්තාර අංක 4.4: ප්‍රධාන රැකියාව අනුව ව්‍යාප්තිය
මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2024



ප්‍රස්තාර අංක 4.5 : ගොවීන් නියැලෙන ගොවිතැන් කටයුතු අනුව ව්‍යාප්තිය
මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2024

4.2. අධ්‍යයන ප්‍රදේශයේ සාමාන්‍ය කෘෂිකර්ම ව්‍යාප්ති සේවයේ ස්වභාවය

ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා සඳහා සම්බන්ධ වූ ගොවීන් සියල්ලන්ම සමස්තයක් ලෙස තම ව්‍යාප්ති සේවා අවශ්‍යතාවය සම්පූර්ණ කරගනු ලබන්නේ රාජ්‍ය අංශයේ ව්‍යාප්ති සේවා නිලධාරීන් හරහා වේ. ඒ සඳහා ඔවුන් විවිධ රැස්වීම් සහ අදාළ ව්‍යාප්ති නිලධාරීන් හා සෘජුව තම ගැටලු හා අවශ්‍යතා සන්නිවේදන සිදු කර ගනු ලබයි. ඊට අමතරව භෞතිකව නිලධාරියා සමඟ සම්බන්ධ වීමකින් තොරව ඔවුන්ගේ කෘෂිකාර්මික ගැටලු විසඳීමට හෝ තොරතුරු හා දැනුම සපයා ගැනීමට, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ආශ්‍රිතව ඉලෙක්ට්‍රොනිකව සිදු කරනු ලබන සන්නිවේදන ක්‍රියාවලීන් එනම්, ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාව වෙත නැඹුරුවක් පවතින බව අධ්‍යයනයේ දී අනාවරණය විය.

ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාව වෙත පවතින මෙම නැඹුරුව, අධ්‍යයනයට ලක් වූ ගොවිජන සේවා මධ්‍යස්ථාන අනුවත් ගොවි සංවිධාන අයත් වූ කෘ.ප.නි.ස. වසම් අනුවත් වෙනස්කම්වලින් යුක්ත වේ. ඒ අනුව, අධ්‍යයනයට ලක් වූ ගොවිජන සේවා මධ්‍යස්ථානයන්ට අයත් ගොවීන්ට අනුව ඔවුහු ප්‍රධාන වශයෙන්ම වී, එළවළු, පලතුරු හා පොල් වගාවට අමතරව සත්ත්ව පාලනයේ ද නියැළෙති. නාගොල්ලාගම ගොවිජන සේවා මධ්‍යස්ථානයට අයත් කටුවන්නාව සහ මීරිහන්පිටිගම වසම්වල බුලත්, අතිරේක බෝග වගා කරන ගොවීන් හා ඊට අමතරව ව්‍යාපාරිකයින් හා ව්‍යවසායකයින් ද මෙම සාකච්ඡාවේ දී හමු වූහ.

කෘෂිකර්ම උපදේශක මහත්ම මහත්මීන් හරහා ඔවුන්ට අවශ්‍ය තොරතුරු ලබා ගැනීම ප්‍රමාණවත් නොවන විට ග්‍රාමීය මට්ටමේ ගොවි සංවිධාන හෝ කාන්තා ගොවි සංවිධාන මඟින් සංවිධාන ගත වී තොරතුරු ලබා ගැනීමට උත්සාහ දරන බවත් එහි යම් පහසුකමක් ඔවුහු අත්විඳින බවත් පැහැදිලි විය. මෙම ප්‍රදේශයන් හි කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරීන්ට අමතරව කෘෂිරසායන ද්‍රව්‍ය අලෙවි නියෝජිත මඟින් ද තොරතුරු ලබා ගැනීමට ගොවීහු නැඹුරුව සිටිති.

එමෙන්ම බාහිරව නිලධාරීන්ගේ මැදිහත් වීමකින් තොරව සාම්ප්‍රදායික දැනුම හරහා වගාවන්ට යොමු වීමේ හා එහි නියැළීමේ ප්‍රබලතාවය ද ඉහළ මට්ටමක පවතී. පාරම්පරික වගා ක්‍රම, පොහොර භාවිතයන්, කෙම් ක්‍රම ආදිය අත්හදා බලන හා එහි ප්‍රතිඵල ලැබූ ගොවීන් කොබෙයිගනේ සහ රඹේ ගොවිජන සේවා මධ්‍යස්ථානවලට අයත් හිරිගොල්ල, තලාකොලවැව සහ තම්බුව වසම්වල පැවති ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡාවලදී අදහස් දැක්වූහ.

අධ්‍යයන ප්‍රදේශයේ මහව ගොවිජන සේවා මධ්‍යස්ථානයට අයත් ලියනගම වසමේ ගොවීන්ට සාමාන්‍ය කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාව වෙත ප්‍රවේශ වීම සම්බන්ධයෙන් ගැටලුවක් ඇති බව ද අනාවරණය විය. එනම්, කෘෂිකර්ම උපදේශක මහත්ම මහත්මීන්ගෙන් අවශ්‍ය දැනුම හා තොරතුරු ලබා ගැනීමට භාෂාව බාධාවක් වීම යි. මෙම වසම තුළ මුස්ලිම් ප්‍රජාව විශාල වශයෙන් ජීවත් වීම එයට හේතුවක් වී ඇත.

4.3. ගොවීන් අතර ස්මාර්ට් ජංගම දුරකතන භාවිතය

සමස්තයක් ලෙස අධ්‍යයනයට ලක් වූ ගොවිජන සේවා මධ්‍යස්ථානයන්ට අයත් වූ ගොවීන්ගේ ව්‍යාප්ති සේවා සපයා ගැනීමේ සාමාන්‍ය තත්ත්වය ඉහත 4.2 මඟින් පැහැදිලි කරන ලදි. අධ්‍යයන ප්‍රදේශයේ සාමාන්‍ය කාෂිකාර්මික ව්‍යාප්ති සේවයත් සමඟ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය හා සම්බන්ධ ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාව වෙතත් ගොවීන්ගේ නැඹුරුවක් පවතින බව සාකච්ඡාවල දී අනාවරණය විය.

ගොවීන් හා සිදු කරන ලද සාකච්ඡාවල දී පැහැදිලි වූ ආකාරයට ගොවීන්ට ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය හරහා කාෂිකාර්මික දැනුම හා තොරතුරු ලබා ගැනීමට ස්මාර්ට් ජංගම දුරකතනයක හිමිකම තිබීම තීරණාත්මක සාධකයක් වි ඇත. සමස්තයක් ලෙස ගොවීන්ගෙන් බහුතරයක් සාමාන්‍ය ජංගම දුරකතන (Mobile phone) භාවිතය සිදු කළ ද අධ්‍යයනයට සහභාගී වූ ගොවීන්ගෙන් 74%කට ස්මාර්ට් ජංගම දුරකතන (Smart mobile phone) හිමිකම පැවතිණි (ප්‍රස්තාර අංක 4.6).



ප්‍රස්තාර අංක 4.5: ස්මාර්ට් ජංගම දුරකතන හිමිකම අනුව ගොවීන්ගේ ව්‍යාප්තිය
මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2024

එය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය හා සම්බන්ධ ඩිජිටල් කාෂිකාර්මික ව්‍යාප්ති සේවය සම්බන්ධයෙන් වඩාත් සාධනීය තත්ත්වයක් වුව ද ගොවීන් තුළ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික මෙවලම් භාවිතය හා එම තාක්ෂණයන් ලබා ගැනීමේ හැකියාවන් අතර පවතින අසමානතාවයන් නිසා සහ ඒ සම්බන්ධයෙන් ඔවුන් නිරන්තරයෙන් යාවත්කාලීන නොවීම සහ ඒ හා බැඳුනු තවත් ගැටලු රාශියක් තිබීම හේතු කොට ගෙන ස්මාර්ට් ජංගම දුරකතනයක හිමිකමක් තිබූ පමණින් සෑම ගොවියෙක්ම ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාවට නැඹුරුවක් නොදක්වන බව සාකච්ඡාවල දී අනාවරණය විය.

4.4. ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාවන් සඳහා ගොවීන්ගේ නැඹුරුව හා දැනුවත්භාවය

ස්මාර්ට් ජංගම දුරකතන හිමි ගොවීන් තම ව්‍යාප්ති සේවාවන් සපයා ගැනීමට ඩිජිටල් මෙවලම් වෙත යොමු වන්නේ ද යන්නට පිළිතුරු සෙවීමේ දී වර්තමානයේ ගොවීන්ට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය හා සම්බන්ධ ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාව සපයා ගැනීම සඳහා මෙවලම් රාශියක් පවතන බව පැහැදිලි විය. සාහිත්‍ය විමර්ශනයන්ට අනුව රාජ්‍ය අංශයේ අමාත්‍යාංශ, ආයතන, පෞද්ගලික අංශය සහ පුද්ගලයින් විසින් නිර්මාණය කරන ලද කෘෂිකාර්මික දැනුම හා තොරතුරු සපයා ගත හැකි යෙදුම් වර්ග, වෙබ් පිටු සහ සමාජ මාධ්‍ය ජාලා වර්තමානය වන විට ගොවි සමාජය තුළ ඇත. අධ්‍යයනයේ දී අනාවරණය වූ ආකාරයට ගොවීන්ගෙන් 65%ක් තම කෘෂිකාර්මික කාරණා සම්බන්ධයෙන් කුමක් හෝ ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති මෙවලමක් භාවිතා කර ඇති නමුත් ගොවීන්ගෙන් 35%ක් එවැනි මෙවලම් භාවිතා නොකරයි (ප්‍රස්තාර අංක 4.7).



ප්‍රස්තාර අංක 4.6: ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති මෙවලම් භාවිතා කිරීමට ඇති නැඹුරුව අනුව ගොවීන්ගේ ව්‍යාප්තිය

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2024

4.4.1. ස්ත්‍රී පුරුෂ භාවය අනුව ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති මෙවලම් භාවිතයට ඇති නැඹුරුව

කෘෂිකාර්මික කාර්යයන් සම්බන්ධයෙන් දැනුම හා තොරතුරු ලබා ගැනීමට කුමක් හෝ ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති මෙවලමක් භාවිතා කිරීමට නැඹුරුව සිටින 65%ක් වූ එම ගොවීන්ගෙන් බහුතරයක් (67%) පුරුෂයින් වූ අතර 33%ක් කාන්තාවෝ වූහ.

කෘෂිකාර්මික සමාජයන් හි කාන්තාව තව දුරටත් සේවා සපයා ගැනීමේ සහ එම සේවාවන් වෙත ප්‍රවේශය තුළ ඇති අසමානතාවය පෙන්නුම් කරන තත්ත්වයක් මෙමගින් අනාවරණය කරනු ලබයි.



ප්‍රස්තාර අංක 4.7: ස්ත්‍රී පුරුෂ භාවය අනුව ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති මෙවලම් භාවිතා කිරීමට ඇති නැඹුරුව

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2024

4.4.2.ගොවීන්ගේ වයස් මට්ටම අනුව ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති මෙවලම් භාවිතයට ඇති නැඹුරුව

කෘෂිකාර්මික කාර්යයන් සම්බන්ධයෙන් දැනුම හා තොරතුරු ලබා ගැනීමට ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති මෙවලමක් භාවිතා කිරීමට නැඹුරුව සිටින 65%ක් වූ එම ගොවීන් වයස් මට්ටම් අනුව විසිරී සිටින ආකාරය විමසීමේ දී අනාවරණය වූයේ, වයස අවුරුදු 51-60 අතර 31%ක් ද අවුරුදු 41-50 අතර සහ අවුරුදු 60ට වැඩි ගොවීන් පිළිවෙළින් 27%ක් සහ 27%ක් නියෝජනය කරන බවයි. අවුරුදු 20- 30 සහ අවුරුදු 31-40 අතර නියෝජනය වූයේ, පිළිවෙළින් 2%ක් සහ 12%කි. එය ප්‍රස්තාර අංක 4.8 න් පැහැදිලි කෙරේ. එසේ තරුණ කාණ්ඩය කෘෂිකාර්මික කාර්යයන් සම්බන්ධයෙන් අඩු පිරිසක් නියෝජනය කළ ද සාකච්ඡාවන් හි දී අනාවරණය වූයේ එයින් බැහැර වූ වෙනත් ව්‍යවසායකත්ව කාර්යයන්,විශේෂ වෘත්තීමය හැකියාවන් පිළිබඳ දැනුවත් වීම සඳහා ඩිජිටල් ව්‍යාප්ති මෙවලම් භාවිතා කරන බවයි. මෙහි දී පැහැදිලි වන විශේෂ කාරණයක් වන්නේ මෙම ඩිජිටල් ව්‍යාප්ති මෙවලමක් නිර්මාණය කිරීමේ දී තරුණ කණ්ඩායම්වල කෘෂිකාර්මික සුවිශේෂතා පිළිබඳව වඩාත් සැලකිලිමත් විය යුතු බවයි.



ප්‍රස්තාර අංක 4.9: වයස අනුව ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති මෙවලම් භාවිතයට ඇති නැඹුරුව
මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2024

4.4.3. ගොවීන්ගේ අධ්‍යාපන මට්ටම අනුව ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති මෙවලම් භාවිතයට ඇති නැඹුරුව

ගොවීන්ගේ අධ්‍යාපන මට්ටම අනුව සැලකීමේ දී පෙනී යන්නේ අධ්‍යයන ප්‍රදේශය තුළ ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති මෙවලමක් භාවිතා කිරීමට නැඹුරුව සිටින ගොවීන් අතරින් වැඩි ප්‍රතිශතයක් (31%) අයත් වන්නේ අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ සමත් වූ ගොවීන්ට වේ. 6-11 වසර දක්වා (22%) උගත් ගොවීන් ද වැඩි පිරිසක් ඒ සඳහා නැඹුරුව සිටිති. අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ සමත් සමත් වූවන් 23%ක් ද ඩිප්ලෝමා හා උපාධිධාරීන් 6%ක් ද ඉහත මෙවලම් භාවිතයට නැඹුරුව සිටිති (ප්‍රස්තාර අංක 4.10).



ප්‍රස්තාර අංක 4.10: අධ්‍යාපන මට්ටම අනුව ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති මෙවලම් භාවිතයට ඇති නැඹුරුව

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2024

සමස්තයක් ලෙස මෙහි දී පෙනී යන්නේ අධ්‍යයන ප්‍රදේශයේ කෘෂිකාර්මික දැනුම හා තොරතුරු ලබා ගැනීමට ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති මෙවලම් භාවිතයට නැඹුරුව සිටින ගොවීන් වයස් මට්ටම් හා අධ්‍යාපන මට්ටම් ඉහළ හෝ පහළ වීම අනුව වෙනසක් පෙන්වන බවයි. එනම්, මේ සඳහා නැඹුරු වූවන්ගේ තොරතුරු අවශ්‍යතාවය අනුව ගොවීන් වයස් මට්ටම් හා අධ්‍යාපන මට්ටම් ඉහළ හෝ පහළ වීම වෙනසක් පෙන්නුම් කරයි. එනම් වයස අඩු තරුණ ගොවීන් වීම හෝ අධ්‍යාපන මට්ටම් ඉහළ ගොවීන් වීම නිසාම ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති මෙවලම් මගින් ලැබෙන සේවය ඔවුන් විසින් ලබා ගන්නා බව යි.

4.5. ගොවීන් ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති මෙවලම් භාවිතා කිරීමේ ස්වභාවය

ඩිජිටල් කෘෂිකාර්මික මෙවලම් භාවිතා කරන බව සඳහන් කළ ගොවීන්ගෙන් ඒවා භාවිතා කිරීමේ ස්වභාවය විමසීමේ දී පෙනී ගියේ ඔවුහු තමන්ට අවශ්‍ය වූ විට එම මෙවලම් භාවිතා කරන බවයි. නමුත් යූ ටියුබ් (14%), වට්ස් ඇප් සමූහ (8%), ෆේස් බුක් පිටු (12%) වැනි සමාජ මාධ්‍ය ජාලා සහ කාෂි රේඩියෝ යෙදුම (වෙබ් රේඩියෝ) වැඩසටහන් (20%) වැඩි පිරිසක් දිනපතා භාවිතා කරන බව පැහැදිලි විය. කාෂිකාර්මික ජංගම යෙදුම්, 1920 කෘෂි උපදේශන සේවා, කෘෂි වෙබ් අඩවි සහ කෘෂි තොරතුරු SMS සේවාවන් දිනපතා භාවිතා කිරීම පිළිබඳ ඇත්තේ ගොවීන්ගේ ඉතා අඩු නැඹුරුවකි. විවිධ වූ ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති මෙවලම් සහ ඒවා ගොවීන් විසින් භාවිතා කිරීමේ ස්වභාවය පහත සඳහන් 4.1 වගු සටහනින් පැහැදිලි කෙරේ.

වගු අංක **4.1:** ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති මෙවලම් භාවිතා කිරීමේ ස්වභාවය

භාවිතා කිරීමේ ස්වභාවය	ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති මෙවලම් වර්ග							
	කෘෂිකාර්මික ජංගම යෙදුම්	1920 කෘෂි උපදේශන සේවාව	යූ ටියුබ්	වට්ස් ඇප් සමූහ	ෆේස් බුක් පිටු	කෘෂි වෙබ් අඩවි	කෘෂි තොරතුරු SMS සේවාව	වෙබ් රේඩියෝ (කෘෂි රේඩියෝ යෙදුම)
දිනපතා	2.0	2.0	14.0	8.0	12.0	1.0	0.0	20.0
කලාතුරකින්,	3.0	1.0	3.0	2.0	4.0	2.0	2.0	6.0
අවශ්‍ය වූ විට	6.0	8.0	21.0	9.0	7.0	6.0	4.0	23.0
භාවිතා නොකෙරේ	89.0	89.0	62.0	81.0	77.0	91.0	94.0	51.0
එකතුව	100.0	100.0	100.0	100.0	100.0	100.0	100.0	100.0

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2024

ඉහත වගු අංක 4.1 අනුව, වර්තමානයේ ගොවීන්ට කෘෂිකාර්මික දැනුම සහ තොරතුරු ලබා ගැනීමට පවතින ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති මෙවලම් සහ ගොවීන් විසින් ඒවා වෙත ප්‍රවේශ වීමේ ස්වභාවය හඳුනා ගත හැකිය. සමස්තයක් ලෙස එක් එක් ඩිජිටල් කෘෂිකාර්මික මෙවලම් සම්බන්ධයෙන් දක්වා ඇති ප්‍රතිචාරයන් අනුව අධ්‍යයනයට සම්බන්ධ වූ ගොවීන්ගෙන් බහුතරයක් මෙම මෙවලම් ''භාවිතා නොකෙරේ'' යන්නට ප්‍රතිචාර දක්වා ඇත. නමුත් යූ ටියුබ්, වට්ස් ඇප් සමූහ, ෆේස්බුක් පිටු යන සමාජ මාධ්‍යයන් සහ කෘෂි රේඩියෝ යන ඩිජිටල් මෙවලම් සඳහා සම්බන්ධ වන ගොවීන්ගේ ප්‍රතිශතය ඉහළ මට්ටමක පවතින බව අනාවරණය විය. මෙම මෙවලම් සඳහා ''දිනපතා භාවිතා කෙරේ'' යන්නට පිළිවෙළින් 14%, 8%, 12% සහ 20%ක් වශයෙන් සාපේක්ෂව ගොවීන්ගේ ඉහළ මට්ටමේ නැඹුරුවක් ඇත.

4.6. ඩිජිටල් කෘෂිකාර්මික ජංගම දුරකතන යෙදුම් (Mobile Apps) පිළිබඳ ගොවීන්ගේ නැඹුරුව

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය (NAICC) විසින් ගොවීන්ට තම ව්‍යාප්ති කාර්යයන් ඉටුකර ගැනීම සඳහා විශේෂයෙන් සකස් කළ ප්‍රධාන ඩිජිටල් ව්‍යාප්ති මෙවලමක් වශයෙන් ජංගම දුරකතන යෙදුම් (Mobile Apps) හඳුනා ගත හැකිය. මෙම ජංගම දුරකතන යෙදුම් වෙත ප්‍රවේශ වීම සඳහා ස්මාර්ට් ජංගම දුරකතනවලට එම යෙදුම් බාගත (Download) කර ගත යුතු වේ. මෙම ජංගම දුරකතන යෙදුම් සම්බන්ධයෙන් අධ්‍යයන ප්‍රදේශයේ ගොවීන් 91%ක ගේම දැනුවත්භාවය අඩු මට්ටමක පවතී. ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය විසින් සඳහන් කළ අන්දමට මෙම ජංගම දුරකතන යෙදුම් සම්බන්ධයෙන් බිම් මට්ටමේ දැනුවත් කිරීම් සඳහා ඔවුන්ට මූල්‍ය හා අනෙකුත් පහසුකම් නොමැති බවත් නමුත් දිස්ත්‍රික් මට්ටමේ අදාළ ව්‍යාප්ති නිලධාරීන් හට මේ සම්බන්ධයෙන් දැනුවත් කිරීම් සිදු කෙරෙන බවත් ඔවුන් සඳහන් කරන ලදි.

අධ්‍යයන ප්‍රදේශය තුළ 9%ක් වැනි ගොවීන් සුළු පිරිසක් කෘෂිකර්ම ජංගම දුරකතන යෙදුම් ගැන හොඳින් දැනුවත්ව සිටී. එසේ දැනුවත්ව සිටින ගොවීන් අතරින් කෘෂි ඇඩ්වයිසර් ජංගම දුරකතන යෙදුම් (Krushi

Advisor Mobile App) “දිනපතා” භාවිතා කරන ගොවින් 2%ක් ද සහ කෘෂි රේඩියෝ (Krushi Radio) යෙදුම දිනපතා භාවිතා කරන ගොවීන් 2%ක් ද අධ්‍යයන ප්‍රදේශයෙන් හඳුනා ගත හැකි විය. පැඩි ෆර්ටිලයිසර් යෙදුම (Paddy Fertilizer App), කෘෂි රේඩියෝ, ඇග්‍රි ස්ටාෆ් යෙදුම, විකි ගොවියා සහ සුපිරි පොළ යන යෙදුම්, “අවශ්‍ය වූ විට” භාවිතා කරන ගොවීන් ඉතාමත් සුළු පිරිසක් හඳුනා ගත හැකි විය. ඩිජිටල් කෘෂිකාර්මික ජංගම යෙදුම් භාවිතා කිරීමේ ස්වභාවය පිළිබඳ ගොවීන්ගේ ප්‍රතිචාර වගු අංක 4.2න් ඉදිරිපත් වේ

4.2: ඩිජිටල් කෘෂිකාර්මික ජංගම යෙදුම් භාවිතා කිරීමේ ස්වභාවය

වගු අංක 4.2: ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති මෙවලම් භාවිතා කිරීමේ ස්වභාවය

භාවිතා කිරීමේ ස්වභාවය	ජංගම දුරකතන යෙදුම් වර්ගය							
	කෘෂි ඇඩ්වයිසර් මොබයිල් ඇප් (Krushi Advisor Mobile App)	පැඩි ෆර්ටිලයිසර් ඇප් (SL Paddy Fertilizer App)	ක්‍රොප් ෆෝකා ස්ටිං (Crop Fore Casting)	කෘෂි රේඩියෝ (Krushi Radio)	ඇග්‍රි ස්ටාෆ් ඇප් (Agri Staff App)	නැෂනල් පෙට්ස් සර්වෙයි ලන්ස් සිස්ටම් (National Pest Surveillance System)	විකි ගොවියා	සුපිරි පොළ
දිනපතා	2.0	0	0	2.0	0	0	0	0
කලාතුරකින්	0	0	1.0	0	0	0	0	0
අවශ්‍ය වූ විට	1.0	2.0	0	2.0	1.0	0	3.0	1.0
භාවිතා නොකෙරේ	97.0	98.0	99.0	96.0	99.0	100.0	97.0	99.0
එකතුව	100.0	100.0	100.0	100.0	100.0	100.0	100.0	100.0

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2024

සාහිත්‍ය විමර්ශනයන් හි අනාවරණය වූ පරිදි මෙතෙක් සාකච්ඡා කළ ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති මෙවලම්වලට අමතරව පෞද්ගලික ආයතන සහ විවිධ පුද්ගලයින් විසින් ද ගොවීන්ට දැනුම හා තොරතුරු ලබා ගැනීමට විශේෂයෙන් සැකසූ **ඩිජිටල්** කෘෂිකාර්මික ජංගම යෙදුම් ඇත. නමුත් ඒවා ගොවීන් අතර ප්‍රචලිත වීම හෝ ඔවුන් ඒවා භාවිතා කිරීමක් හෝ නොකරන බව 93%ක්ම සඳහන් කළහ. පෞද්ගලික අංශයේ ඩයලොග් ඇක්සියාටා සමාගම විසින් ගොවීන් වෙත හඳුන්වා දී ඇති “ගොවි මිතුරු” ඩිජිටල් කෘෂිකාර්මික ජංගම **යෙදුම** පිළිබඳ පමණක් ගොවීන්ගේ දැනුවත්භාවයක් ඇති නමුත් ඒවායින් ප්‍රයෝජන ගනු ලබන්නේ 7% වැනි ඉතාමත් සුළු පිරිසකි.

4.7. ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවා භාවිතා කිරීමේ දී ගොවි මට්ටමේ බාධක

මෙම අධ්‍යයනයේ සුවිශේෂී අරමුණු අතර ප්‍රධාන අරමුණක් වූයේ ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවා භාවිතා කිරීමට ගොවීන්ගේ මට්ටමේ විභවයන් සහ බාධක හඳුනා ගැනීමත්, ගොවීන්ට ඒ සඳහා සහය වීම සඳහා නිලධාරීන්ගේ මට්ටමේ විභවයන් සහ බාධක හඳුනා ගැනීමත් වේ. ඒ අනුව ඉලක්ක ගත කණ්ඩායම් සාකච්ඡා සහ කෙටි ප්‍රශ්නාවලී සමීක්ෂණ මඟින් අනාවරණය වූයේ සමස්තයක් ලෙස ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවා සඳහා ගොවි ප්‍රජාව අතර සැලකිය යුතු මට්ටමේ විභවතාවක් පවතින නමුත් එය ප්‍රායෝගික ලෙස තව දුරටත් ව්‍යාප්ත වීමට හා වැඩි වර්ධනය වීමට බාධා වන ගැටලු පවතින බවයි.

සමස්ත ගැටලු පිළිබඳව සැලකිලිමත් වීමේ දී ගොවීන්ට ප්‍රධාන ලෙසම බලපාන ගැටලු 6ක් සම්පිණ්ඩනය කළ හැකි වේ. එය පහත සඳහන් ප්‍රස්තාර අංක 4.11න් ඉදිරිපත් කෙරේ.

ප්‍රස්තාර අංක 4.10: ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති මෙවලම් භාවිතා කිරීමේ දී ගොවීන් මුහුන දෙන ගැටලු අනුව ගොවීන්ගේ ව්‍යාප්තිය



මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2024

1. ගොවීන් ඩිජිටල් කෘෂිකාර්මික ජංගම දුරකතන යෙදුම් පිළිබඳ නිසි පරිදි දැනුවත් නොවීම

අධ්‍යයනයට සම්බන්ධ වූ ගොවීන්ගෙන් ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය පිළිබඳ දැනුවත් හා ඒ සඳහා කැමැත්තක් ඇති ගොවීන් (65%) සැලකිය යුතු ප්‍රමාණයක් හඳුනා ගත හැකි වුව ද ඔවුන් අතර කෘෂිකාර්මික තොරතුරු හා දැනුම සපයා ගැනීම සඳහා වඩා වැඩි නැඹුරුවක් ඇත්තේ යූ ටියුබ්, වට්ස් ඇප් සමූහ, ෆේස්බුක් පිටු යන සමාජ මාධ්‍යයන් සහ වෙබ් රේඩියෝ (කෘෂි රේඩියෝ) යන ඩිජිටල් මෙවලම් පිළිබඳව වේ. රාජ්‍ය ආයතන, පෞද්ගලික ආයතන, විවිධ ව්‍යාපෘති මඟින් ගොවීන්ගේ ව්‍යාප්ති සේවා අවශ්‍යතාවය වෙනුවෙන් සකස් කළ ඩිජිටල් කෘෂිකාර්මික ජංගම දුරකතන යෙදුම් තිබෙන බව ගොවීන් නිසි පරිදි දැනුවත් වී නොමැත. ඩිජිටල් කෘෂි ව්‍යාප්ති සේවාවන් වෙත ගොවීන්ගේ නැඹුරුතාවයක් ඇති නොවීමට එය හේතු වී ඇත. ගොවීන්ගෙන් 93%කටම එය ගැටලුවක් බව අනාවරණය විය (ප්‍රස්තාර අංක 4.9).

විශේෂයෙන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය (NAICC) මඟින් ගොවීන් සඳහා හඳුන්වා දී ඇති කෘෂිකාර්මික යෙදුම් පිළිබඳ දැනුවත් භාවයට සාපේක්ෂව ඩයලොග් ඇක්සියාටා වැනි පෞද්ගලික සමාගම් මඟින් හඳුන්වා දී ඇති ඩිජිටල් කාෂිකාර්මික යෙදුම් පිළිබඳව ගොවීන්ගේ ඇනුවත්භාවය ඉහළය. ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානයේ නිලධාරීන් සමඟ කළ සාකච්ඡාවලින් පැහැදිලි වූ පරිදි එසේ වීමට මූලිකවම බලපාන ලද හේතුව වී ඇත්තේ ඩයලොග් සේවාව සමඟින්ම ඔවුන්ගේ ජංගම යෙදුම ද අදාළ ගොවීන්ගේ ජංගම දුරකතනයට ලබා දීම සහ ඒ පිළිබඳ දැනුවත් කිරීමක් සිදුකිරීමයි. එසේම එම නිලධාරින් විසින් තව දුරටත් සඳහන් කළ අදහස් අනුව අනාවරණය වූයේ, ඔවුන් විසින් ගොවීන් සඳහා නිර්මාණය කරන ලද ඩිජිටල් කාෂිකාර්මික යෙදුම් ඇතුළු සියලු සේවාවන් පිළිබඳව දැනුවත්භාවය ගොවීන් වෙත කෙතෙක් දුරට සම්ප්‍රේෂණය වී ඇත් ද යන්න හඳුනා ගෙන නො මැති බව යි. ගොවි මට්ටමේ දැනුවත් කිරීම් අත්‍යවශ්‍ය වුව ද ඒ සඳහා මූල්‍ය ප්‍රතිපාදන නොමැති බව ද සඳහන් විය. මෙම

තත්ත්වය මඟින් පැහැදිලි වන්නේ පෞද්ගලික අංශය හා රාජ්‍ය අංශයේ වඩා නිවැරදි සහභාගීත්වයක් සහිතව මෙම අංශය දියුණු කිරීමේ අවශ්‍යතාවයක් ඇති බව යි.

ගොවිජන සේවා මධ්‍යස්ථාන අනුව සැලකීමේ දී ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය මඟින් හඳුන්වා දී ඇති ඩිජිටල් කාෂිකාර්මික යෙදුම් පිළිබඳ දැනුවත්ව සිටින බව සඳහන් කළ වැඩි පිරිසක් නියෝජනය කළේ කොබෙයිගනේ ගොවිජන සේවා මධ්‍යස්ථානයට අදාළ ගොවි ප්‍රජාව විය. එහි ප්‍රතිශත නියෝජනය 17%කි. නමුත් අධ්‍යයනයට ලක් වූ ලියනගම, කටුවන්නාව සහ තලාකොළවැව වැනි කෘෂිකාර්මික වසම් වල ගොවීහු මෙම ඩිජිටල් කාෂිකාර්මික යෙදුම් පිළිබඳව කිසිදු දැනුවත්භාවයක් නොමැති බව සඳහන් කළහ.

මෙයට ප්‍රධාන හේතු ලෙස ගොවීන් සමඟ කළ කණ්ඩායම් සාකච්ඡාවල දී ඔවුන් ඉදිරිපත් කළ අදහස්වලට අනුව පෙනී යන්නේ, ගොවි ප්‍රජාව තුළ මෙම යෙදුම් පිළිබඳ දැනුවත්භාවය අඩු වීම හා සමහර ස්ථානවල දී එම තොරතුරු ලැබීමේ දී භාෂා ගැටලු පැවතීම ය. ගොවීන් මෙන්ම නිලධාරීන් විසින් ද මේ බව සඳහන් කරන ලදී. උදා : කොබෙයිගනේ ගොවිජන සේවා මධ්‍යස්ථානයට අයත් පන්නව වසමෙන් සමීක්ෂණ දිනයේ වැඩසටහනට සහභාගී වූ පිරිසෙන් බහුතරයක් මුස්ලිම් ප්‍රජාව වූ නමුත් ඔවුන් හා ව්‍යාප්ති සේවයේ යෙදෙන කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරී මහතා සිංහල භාෂාව හසුරුවන අයෙකු විය. ඔහු දැක් වූ අදහස්වලට අනුව එම ගොවි ප්‍රජාව සමඟ අදහස් හුවමාරු කිරීමේ දී භාෂාමය ගැටලු පැන නගින අවස්ථා පවතී.

2. ඩිජිටල් කෘෂිකාර්මික ජංගම දුරකතන යෙදුම් වෙත ප්‍රවේශ වීමේ නොදැනුවත්කම.

ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවා මෙවලම් අතරින් ඩිජිටල් කෘෂිකාර්මික ජංගම දුරකතන යෙදුම් පිළිබඳ ගොවීන්ගේ දැනුවත්භාවය පහළ මට්ටමක පැවතිය ද එම මෙවලම් අතර තිබෙන සමාජ මාධ්‍ය ජාලා (වට්ස් ඇප්, යූ ටියුබ්, ෆෙස්බුක් පිටු වැනි.) සම්බන්ධයෙන් නැඹුරුව ඉහළ මට්ටමක පවතී. ඒ හේතුවෙන් සමස්තයක් ලෙස ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය පිළිබඳව ගොවීන්ගේ නැඹුරුවක් ඇති බව අධ්‍යයනයේ දී පැහැදිලි වේ. කෙසේ වුව ද කෘෂිකාර්මික තොරතුරු හා දැනුම සපයා ගැනීමට පවතින ඩිජිටල් කෘෂිකාර්මික ජංගම දුරකතන යෙදුම් ඔවුන්ගේ ස්මාර්ට් ජංගම දුරකතන හරහා බාගත කර ගැනීමේ දී ත්, ඒවා වෙත ප්‍රවේශ වීමේ දී ත් ඒ සම්බන්ධයෙන් නිසි දැනුමක් ගොවීන්ට නොමැති බව අධ්‍යයනයේ දී ගොවීන්ගෙන් 39%ක් සඳහන් කළහ.

එසේ වුවත් මේ සම්බන්ධයෙන් ව්‍යාප්ති නිලධාරීන් සමඟ කළ සාකච්ඡාවල දී පැහැදිලි වූයේ, ගොවිජන සේවා බල ප්‍රදේශයන් හි විවිධ පුහුණු වැඩසටහන් පැවැත්වීම මඟින් ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය සහ මෙවලම් පිළිබඳව ගොවීන්ව දැනුවත් කළ බවයි. අධ්‍යයනයට සම්බන්ධ වූ නිලධාරීන්ගෙන් 59%ක් සඳහන් කළේ, ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාවන් හා ඊට අදාළ ඩිජිටල් කෘෂිකාර්මික ජංගම දුරකතන යෙදුම් පිළිබඳව ඔවුන්ට ලබා දුන් දැනුවත්භාවය ගොවීන් වෙත ද ලබා දෙමින් ගොවීන් සඳහා වට්ස් ඇප් සමූහ සහ ෆේස් බුක් සමූහ නිර්මාණය කළ බවයි. විශේෂයෙන් නිකවැරටිය, නාගොල්ලාගම, කොබෙයිගනේ වැනි ගොවිජන සේවා මධ්‍යස්ථානයන්ට අයත් ව්‍යාප්ති නිලධාරීන් විසින් ද. රඹේ ගොවිජන සේවා බල ප්‍රදේශයේ කාන්තා ගොවි සංවිධාන හරහා ද මෙම ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාවන් වෙත ප්‍රවේශ වීම පිළිබඳ ගොවීන් දැනුවත් කළ බව එම ව්‍යාප්ති නිලධාරීහු සඳහන් කළහ.

නිලධාරීන් විසින් තම බල ප්‍රදේශයන් තුළ තොරතුරු හා දැනුම සංසරණය කිරීමට ගොවීන් අතර හා ගොවි සංවිධාන අතර නිර්මාණය කළ වට්ස් ඇප් සමූහ දැනටත් භාවිතා කරන බව නිරීක්ෂණය කළ හැකි විය. කෙසේ නමුත් ස්මාර්ට් ජංගම දුරකථන පහසුකම් පැවතිය ද මෙම මෙවලම් වෙත ප්‍රවේශ වීම අඩු වීමට, ඩිජිටල් කෘෂිකාර්මික ජංගම දුරකතන යෙදුම් භාවිතයට සහ ඒ ගැන දැනුම සොයා යැමටත් දැනුම ලබා ගැනීමටත් ගොවීන් තුළ ගොඩ නැගී ඇති උනන්දුව අඩුවීම විශාල හේතුවක් වී තිබිණි.

3. ඩිජිටල් කෘෂිකාර්මික ජංගම දුරකතන යෙදුම් යාවත්කාලීන නොවීම සහ තොරතුරු යාවත්කාලීන නොවීමෙන් මෙවලම් පිළිබඳ නිර්වද්‍යතාවය සහ විශ්වසනීයත්වය නොමැති වීම

විවිධ වර්ගයේ ඩිජිටල් කෘෂිකාර්මික ජංගම දුරකතන යෙදුම් නිර්මාණය සිදු වුව ද එහි ප්‍රධානතම ගැටලුවක් වන්නේ, මෙම යෙදුම් දුරකථන අනුවාදයට අනුව යාවත්කාලීන නොවීම බව අධ්‍යයන ප්‍රදේශයේ නිලධාරීන් මෙන්ම ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාවන්ට අදාළ ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානයේ නිලධාරීන් හා කෙරුණු සාකච්ඡාවල දී පැහැදිලි විය. වර්තමානයේ තරඟකාරී තාක්ෂණික වෙළඳපොළ තුළ දුරකතන මාදිලි හා අනුවාද සීඝ්‍රයෙන් යාවත්කාලීන වන අතර, ඒ සමඟම මෙම යෙදුම් ද එයට අනුකූලව යාවත්කාලීන කළ යුතුව ඇත. නමුත් මේ සඳහා යම් පිරිවැයක් දැරීමට සිදුවන අතර මූල්‍ය ප්‍රතිපාදනවල යම් ගැටලු නිසා සමහර යෙදුම් නිසි පරිදි යාවත්කාලීන නොවේ. මෙය ආයතනික මට්ටමින් ද ගොවි ප්‍රජාව පාර්ශ්වයෙන් ද මුහුණ දෙන ප්‍රධානම ගැටලුවක් බව අධ්‍යයනයේ දී ද පැහැදිලි විය. මේ නිසා ගොවිජන සේවා බල ප්‍රදේශයන් හි ගොවීන්ට ඩිජිටල් කෘෂිකාර්මික ජංගම දුරකතන යෙදුම් හරහා ලබා ගන්නා තොරතුරුවල නිර්වද්‍යභාවය පිළිබඳ විශ්වාසයක් නැත. සමස්තයක් ලෙස ගොවීන්ගෙන් 29%ක් මෙය ගැටලුවක් බව සඳහන් කළහ. මෙම තත්ත්වය සමනය කිරීමට තාක්ෂණික විකල්ප යොදාගත හැකි වුව ද ගොවි ජනතාවගේ අන්තර්ජාල පහසුකම්, තාක්ෂණික සාක්ෂරතාවය, සමාජ ආර්ථික තත්ත්වය මත මෙම යෙදුම් හරහා තොරතුරු හා දැනුම සපයා ගැනීම තීරණය වන බව නිලධාරීන්ගේ අදහස විය. එමෙන්ම දිනෙන් දින දියුණු වන දුරකතන අනුවාදයන්ට අනුව දැනට පවතින ඩිජිටල් කෘෂිකර්ම ජංගම දුරකතන යෙදුම් යාවත්කාලීන කිරිමට නොහැකි වීම ආයතනික මට්ටමේ බාධාවක් බව විශේෂයෙන් ජාතික කාෂිකාර්මික තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථාන නිලධාරීන් විසින් පෙන්වා දෙන ලදි.

එමෙන්ම සාමාන්‍යයෙන් යූ ටියුබ් හරහා මෙන්ම විවිධ යෙදුම් හරහා දැනුම ලබා දීමට ඉදිරිපත් වන පුද්ගලයින් එම විෂයයන් පිළිබඳ මනා ප්‍රවීණතාවයකින් තොරව දැනුම හා තොරතුරු සැපයීම වර්තමානයේ මෙම ක්ෂේත්‍රය තුළ වඩාත් ගැටලුකාරී තත්ත්වයක් උදා කර ඇත. ගොවීන් විසින් නිරන්තරයෙන් අපේක්ෂා කරන තොරතුරු වූ කාලගුණික තොරතුරු, වෙළඳපොළ තොරතුරු සහ පොහොර කෘෂි රසායනික තොරතුරු නිවැරදිව යාවත්කාලීන විය යුතු වේ. කොබෙයිගනේ ගොවි ජන බල ප්‍රදේශයේ හිරිගොල්ල වසමේ ගොවීන් පිරිසක් විසින් යූ ටියුබ් හරහා සංසරණය වන වීඩියෝ හරහා දැනුම රැගෙන විශාල වියදමක් දරා වර්මි කොම්පෝස්ට් (පණු පොහොර) සකස් කිරීමට උත්සාහ කර ඇති නමුත් එය අසාර්ථක වී ඇත. නිකවැරටිය ගොවිජන සේවා බල ප්‍රදේශයේ තිබ්බිරියාව වසමේ ගොවීන්ට අනුව ඩිජිටල් කෘෂිකාර්මික ජංගම දුරකතන යෙදුම් හි සඳහන් වන වෙළඳපළ මිල ගණන් සහ විශේෂ ආර්ථික මධ්‍යස්ථානවල සඳහන් මිල ගණන් අතර විශාල පරස්පරතාවයක් පවතින බව පෙන්වා දෙන ලදි. එම බල ප්‍රදේශයේ ව්‍යාප්ති නිලධාරීන්ගේ අදහස වූයේ එවැනි අත්දැකීම් නිසා මේ සම්බන්ධයෙන් ගොවීන්ගේ විශ්වාසය හීන වී ඇති බවත් කෘෂිකාර්මික දැනුම හා තොරතුරු සංසරණය කරන විවිධ ඉදිරිපත් කිරීම් කෙරෙහි රාජ්‍ය මැදිහත්වීමක් හා නියාමනයක් අවශ්‍ය බවයි.

4. ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති මෙවලම් භාවිතයට සාපේක්ෂව රූපවාහිනිය හා ගුවන්විදුලිය භාවිතයට ඇති කැමැත්ත

අධ්‍යනයට සහභාගී වූ ගොවීන්ගෙන් 22%ක් රූපවාහිනිය සහ ගුවන්විදුලිය භාවිතය පහසු බව සඳහන් කළහ. ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති මෙවලම් භාවිතා කිරීමට ස්මාර්ට් ජංගම දුරකථනයක් තිබිය යුතු වීම, ඒ සඳහා යම් මූල්‍යමය පිරිවැයක් දැරීම කළ යුතු වීම, ඩිජිටල් යෙදුම් බාගත කර ගැනීමේ දී දුෂ්කරතාවලට මුහුණ දීමට සිදු විම වැනි අපහසුතා නිසා තමන්ට අවශ්‍ය දැනුම හා තොරතුරු රූපවාහිනිය, ගුවන්විදුලිය වැනි මාධ්‍ය හරහා ලබා ගැනීමට ගොවීන් කැමති බවත් සඳහන් කළහ. නවතාවයන් ගොවීන් අතර ප්‍රචලිත කිරීමේ දී ඒ සඳහා අනුවර්තනය වීම ප්‍රමාද වන ගොවීන් තව දුරටත් ගුවන්විදුලිය, රූපවාහිනිය වැනි ශ්‍රව්‍ය-දෘශ්‍ය මාධ්‍යන් වෙත වැඩි නැඹුරුවක් දැක්වීම ඩිජිටල්

කෘෂිකාර්මික ව්‍යාප්ති මෙවලම් භාවිතය ප්‍රචලිත වීමට ගොවීන්ගේ පාර්ශ්වයෙන් පවතින ආකල්පමය ගැටලුවක් ලෙස හඳුනා ගත හැකි විය.

5. අන්තර්ජාල පහසුකම් සඳහා අවහිරතා පැවතීම

වර්තමානය වන විට ශ්‍රී ලංකාව පුරා ජනතාවට අන්තර්ජාල පහසුකම් සැපයීමේ විශේෂ අවධානයක් යොමුකර ඇති නමුත් තව දුරටත් ග්‍රාමීය ප්‍රදේශයන් හි සංඥා සම්බන්ධයෙන් අවහිරතා පවතී. අධ්‍යයනයට ලක් වූ ගොවිජන සේවා මධ්‍යස්ථානයන් හි සෑම ප්‍රදේශයකටම නොමැති වුවත්, පාරිසරික තත්ත්වයන් අනුව සංඥා ගැටලු පවතින බව අනාවරණය විය. ගොවීන්ගෙන් 17%ක් එවැනි ගැටලුවලට මුහුණ දෙන බව සඳහන් කළහ. ව්‍යාප්ති නිලධාරීන්ට ද මෙම තත්ත්වය බාධාවක් වන බවත් එහි දී ඩිජිටල් කෘෂිකාර්මික **ව්‍යාප්ති** සේවාවන් සඳහා යම් විභවයක් ඇති ගොවීන් සමඟ හෝ දැනුම තොරතුරු බෙදා ගැනීමේ අපහසුවක් ඇති වන බව සඳහන් කළහ.

6. අන්තර්ජාල පහසුකම් සඳහා මූල්‍යමය අවහිරතාවය.

විවිධ යෙදුම් බාගත කර ගැනීමේ දී ඒ සඳහා මුදල් වැය වන බවත් එය ගැටලුවක් බවත්, ගොවීන්ගෙන් 10%ක් සඳහන් කළහ. මෙම තත්ත්වය බොහෝ විට අවශ්‍යතාවය අනුව සහ ප්‍රමුඛතාවය අනුව වෙනස් වන බව නිලධාරීන් විසින් සඳහන් කරන ලදි.

පස්වැනි පරිච්ඡේදය

ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාවන් භාවිතා කිරීමට සහය වීම සඳහා ව්‍යාප්ති නිලධාරීන් සතු විභවයන් සහ බාධක

5.0. හැඳින්වීම

ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාවන් භාවිතා කිරීමේ දී සහ එම මෙවලම් භාවිතා කිරීමට ගොවීන්ට සහය වීම සඳහා නිලධාරීන්ගේ මට්ටමේ විභවයන් සහ බාධක හඳුනා ගැනීම සඳහා අධ්‍යයනය සඳහා සහභාගී වූ ගොවිජන සේවා බල ප්‍රදේශයට අයත් ව්‍යාප්ති නිලධාරීන් වූ කෘෂිකර්ම උපදේශක නිලධාරීන් (10) ද ඊට සහාය දක්වන තාක්ෂණ සහායක නිලධාරීන් (04) සහ බිම් මට්ටමේ කෘෂිකාර්මික ව්‍යාප්ති කටයුතු සඳහා සම්බන්ධීකරණ කාර්යයන්ගෙන් සහය දක්වන කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන් (08) ඇතුළත්ව නිලධාරීන් 22 දෙනෙක් සමඟ සිදු කරනු ලැබූ සම්මුඛ සාකච්ඡා සහ කෙටි ප්‍රශ්නාවලින් මඟින් ලබා ගත් දත්ත හා තොරතුරු විශ්ලේෂණයක් මෙම පරිච්ඡේදයට ඇතුළත් වේ.

5.1. අධ්‍යයනයට සහභාගී වූ නිලධාරීන්ගේ ප්‍රජා විද්‍යාත්මක ලක්ෂණ

ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාව පිළිබඳ අධ්‍යයනය සඳහා සහභාගී වූ නිලධාරීන්ගේ වයස් මට්ටම් පිළිබඳව සැලකීමේ දී නිලධාරීන්ගෙන් 12 දෙනෙකු (55%) අයත් වූයේ වයස අවුරුදු 31 - 40ත් අතර කාණ්ඩයට වේ. වයස අවුරුදු 41 – 60 අතර කාණ්ඩයට නිලධාරීන් හත් දෙනෙකු (32%) දෙනෙකු සහ වයස අවුරුදු 20-30 අතර කාණ්ඩයට අයත් වූ නිලධාරීන් තිදෙනෙක් (14%) සිටියහ.

අධ්‍යාපන මට්ටම පිළිබඳව සැලකීමේ දී මෙම නිලධාරීන්ගෙන් 13න් දෙනෙකු (59%) කෘෂිකර්ම ඩිප්ලෝමාධාරීන් වූහ. උපාධිධාරීන් තිදෙනෙකි (14%). අ.පො.ස උසස් පෙළ සමත් වූවන් පස්දෙනෙකි (23%). අ.පො.ස සාමාන්‍ය පෙළ සමත් වූ එක් නිලධාරියෙකු ද හමු විය. නිලධාරීන්ගෙන් 15 දෙනෙකු (68%) ස්ත්‍රීන් වූ අතර පුරුෂ පාර්ශ්වය හත්දෙනෙකි (32%). නිලධාරීන් සියලු දෙනාම විවාහකයින් වූහ.



ප්‍රස්තාර අංක 5.1: වයස අනුව ව්‍යාප්තිය
මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2024



ප්‍රස්තාර අංක 5.2: අධ්‍යාපනය අනුව ව්‍යාප්තිය
මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2024

5.2. ව්‍යාප්ති නිලධාරීන් හා බිම් මට්ටමේ අනෙකුත් නිලධාරීන්ගේ ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාව පිළිබඳ දැනුවත්භාවය.

අධ්‍යනයට ලක් වූ ගොවිජන සේවා බල ප්‍රදේශයන්ට අයත් ව්‍යාප්ති නිලධාරීන් වන කෘෂිකර්ම උපදේශක නිලධාරීන් (10) ද ඊට සහාය දක්වන තාක්ෂණ සහායක නිලධාරීන් (04) සහ බිම් මට්ටමේ කෘෂිකාර්මික ව්‍යාප්ති කටයුතු සඳහා සම්බන්ධීකරණ කාර්යයන්ගෙන් සහය දක්වන කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන් (08) ඇතුළත්ව නිලධාරීන් 22 දෙනෙක් සමඟ සිදු කරනු ලැබූ සම්මුඛ සාකච්ඡා සහ කෙටි ප්‍රශ්නාවලින් මඟින් අනාවරණය වූ පරිදි නිලධාරීන් සියලු දෙනාටම (100%) ස්මාර්ට් ජංගම දුරකථන හිමිකම තිබුණි. එමෙන්ම ගොවීන් සඳහා ව්‍යාප්ති සේවාවන් සැපයීමේ දී ඩිජිටල් කෘෂි ව්‍යාප්ති සේවාවන්ට අදාළ මෙවලම් සහ ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය (NAICC) විසින් හඳුන්වා දී ඇති ඩිජිටල් කෘෂිකාර්මික ජංගම දුරකතන යෙදුම් (Mobile App) සම්බන්ධයෙන් දැනුවත්ව සිටින බවත් ඒවා භාවිතා කරන බවත් හඳුනාගත හැකි විය.

ඩිජිටල් කෘෂිකාර්මික ජංගම දුරකථන යෙදුම් (Mobile App) සම්බන්ධයෙන් නිලධාරීන්ගේ දැනුවත්භාවය කුමනාකාර ද යන්න පිළිබඳ ඔවුන්ගේ අදහස් විමසීමේ දී ඩිජිටල් කෘෂිකාර්මික ජංගම දුරකතන යෙදුම් ගැන තමන්ට "ඉහළ" දැනුවත් භාවයක් ඇති බවට අදහස් කළ නිලධාරීන් 36%ක් ද (කෘෂිකර්ම උපදේශක නිලධාරීන් -7ක් සහ තාක්ෂණ සහායක නිලධාරීන් -1ක්) "මධ්‍යම ප්‍රමාණයේ" දැනුවත්භාවයක් ඇති බවට අදහස් ඉදිරිපත් කළ නිලධාරීන් 64%ක් ද සිටියහ.



ප්‍රස්තාර අංක 5.3: ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාව හා භාවිතයේ දැනුවත්භාවය
මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2024

5.3. ව්‍යාප්ති නිලධාරීන් ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති මෙවලම් භාවිතා කිරීමේ ස්වභාවය

ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාව පිළිබඳව නිලධාරීන් සියලු දෙනාටම ඉහළ මට්ටමේ දැනුවත් භාවයක් නොපැවතිය ද සමාජ මාධ්‍ය ජාලාවන්ට අයත් වන යූ ටියුබ්, වට්ස් ඇප් සමූහ, ෆේස් බුක් පිටු හා කෘෂි වෙබ් අඩවි දිනපතා භාවිතා කරන බව සාකච්ඡාවන්හි දී අනාවරණය විය. නිලධාරීන්ට එදිනෙදා අවශ්‍ය වන කෘෂිකාර්මික දැනුම හා තොරතුරු මෙම ඩිජිටල් මෙවලම් මඟින් සපයා ගන්නා බව සඳහන් කරන ලදී.

ගොවීන් වෙනුවෙන් හා නිලධාරීන් වෙනුවෙන් විශේෂයෙන් සකස් කර ඇති ඩිජිටල් කෘෂිකාර්මික ජංගම දුරකතන යෙදුම් භාවිතා කිරීම අවශ්‍ය වූ විට පමණක් සිදු කරනු ලබන බව ද සඳහන් විය. එම ජංගම දුරකතන යෙදුම් පිළිබඳව ඉහළ මට්ටමේ දැනුවත්භාවයක් නොතිබුණ ද අධ්‍යයනයට සහභාගී වූ තාක්ෂණ සහායක නිලධාරීන් සහ කෘ.ප.නි.ස. නිලධාරීන්ට සාපේක්ෂව සියලුම කෘෂිකර්ම උපදේශක නිලධාරීන් විසින් බෝග වගාවේ දී බිම් සැකසීමේ කාර්යයේ සිට අස්වැන්න නෙළීම දක්වා වූ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ද ඊට අමතරව බෝගයන් හි විවිධ රෝග හා දිලීර හානි පළිබෝධ හානි සහ ඒවා පාලන ක්‍රම, කාලගුණික දේශගුණික තත්ත්වයන් පිළිබඳ, වෙළඳපොළ තොරතුරු හා නව තාක්ෂණය, කෘෂි උපකරණ භාවිතයට ගොවීන්ට දැනුම හා තොරතුරු ලබා දීමේ දී හා ගොවීන්ට පුහුණු වැඩසටහන් සැලසුම් කිරීමේ දී ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය විසින් හඳුන්වා දී ඇති ජංගම දුරකථන යෙදුම් වන SL Paddy Fertilizer App, National Pest Surveillant App, (Kurishi Advisor Mobile App), 'සුපිරි පොළ', කෘෂි රේඩියෝව සහ විකි ගොවියා යන යෙදුම් වර්ග නිලධාරීන් (45%) විසින් භාවිතා කරන බව අනාවරණය විය.

5.4. පෞද්ගලික ආයතන / පුද්ගලයින් හා විවිධ ව්‍යාපෘතිවල අවශ්‍යතාවයන්ට හඳුන්වා දී ඇති ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති යෙදුම් භාවිතා කිරීම

ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය විසින් හඳුන්වා දී ඇති ජංගම දුරකතන යෙදුම් වලට (Mobile App) අමතරව පෞද්ගලික ආයතන / පුද්ගලයින් හා විවිධ ව්‍යාපෘතිවල අවශ්‍යතාවයන්ට හඳුන්වා දි ඇති යෙදුම් සම්බන්ධයෙන් සැලකීමේ දී ව්‍යාප්ති නිලධාරීන්ගෙන් 13 දෙනෙකු (59%) ගොවිපොළ යෙදුම් සහ ගොවිමිතුරු යෙදුම් භාවිතා කරන බව සඳහන් කළහ. ව්‍යාප්ති නිලධාරීන්ගෙන් 11 දෙනෙකු (41%) එවැනි යෙදුම් පිළිබඳ දැනුවත් නොමැති බව සඳහන් කළහ.

5.5. අධ්‍යයන ප්‍රදේශය තුළ ව්‍යාප්ති නිලධාරීන් ඩිජිටල් කෘෂිකාර්මික ජංගම දුරකතන යෙදුම් භාවිතයට වැඩි නැඹුරුවක් නොදැක්වීමට බලපාන ලද හේතු

සමස්තයක් ලෙස රාජ්‍ය අංශයේ / පෞද්ගලික අංශයේ පුද්ගලයින් හා වෙනත් ව්‍යාපෘතීන් විසින් හඳුන්වා දෙන ලද කෘෂිකාර්මික ව්‍යාප්ති මෙවලම් අතරින් විශේෂයෙන් ඩිජිටල් කෘෂිකාර්මික ජංගම දුරකතන යෙදුම් භාවිතයට වැඩි නැඹුරුවක් නොදැක්වීමට විවිධ හේතු මෙම නිලධාරීන් විසින් සඳහන් කළහ. මේ සඳහා බලපාන ප්‍රධානතම හේතුව ලෙස නිලධාරීන් විසින් පෙන්වා දෙනු ලැබුවේ මෙම ඩිජිටල් කෘෂිකාර්මික මෙවලම් භාවිතා කිරීමේ දී අන්තර්ජාල පහසුකම් සඳහා අවහිරතා පවතින බවයි. එම අවහිරතා අතර ප්‍රධානතම අවහිරතාවයක් වූයේ සංඥා ගැටලු වන අතර අන්තර්ජාල පහසුකම් සඳහා මූල්‍යමය අපහසුතාවය ද හේතු වන බව සඳහන් කරන ලදී. එසේම මෙම යෙදුම් භාවිතයේ දී එමඟින් ලබා ගැනීමට අදහස් කරන සමහර තොරතුරු හා දැනුම යාවත්කාලීන නොවීම නිසා නිරවද්‍යභාවය පිළිබඳ විශ්වාසයක් නොමැති වීම ද ප්‍රධාන හේතුවක් ලෙස ඔවුහු සඳහන් කළහ. අනෙක් ප්‍රධාන හේතුව වන්නේ යෙදුම්වලට ප්‍රවේශය අපහසු වීමයි. එනම් ස්මාර්ට් ජංගම දුරකථන භාවිතය ඉහළ මට්ටමක පැවතිය ද අදාළ යෙදුම් වර්ග බාගත කර ගැනීමේ දී තමන්ට තිබෙන දුරකතන අනුවාදය අනුව යම් අවහිරතා ඇතිවන බව සඳහන් විය.

හයවැනි පරිච්ඡේදය

නිගමන සහ යෝජනා

6.0 හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාව භාවිතයේ ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා සුදුසු යෝජනා ඉදිරිපත් කිරීමට දැනට පවතින ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවා සහ ඒවායේ ආකෘති භාවිතය අධ්‍යයනය කිරීමට තෝරා ගන්නා ලද කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවා භාවිතා කිරීමට ගොවීන් තුළ ඇති විභවයන් සහ බාධකත් ගොවීන් එම සේවාවන් භාවිතා කිරීමේ දී නිලධාරීන්ගේ මට්ටමේ විභවයන් සහ බාධකත් පිළිබඳ ගවේශනාත්මක අධ්‍යයනයක නියැළීම මෙම පර්යේෂණ අරමුණ විය. ඒ සම්බන්ධයෙන් පෙර පරිච්ඡේදයන් හි සිදු කරන ලද විශ්ලේෂණයන් මඟින් ලැබූ අවබෝධය මත ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාව භාවිතයේ ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා සුදුසු නිගමන සහ යෝජනා මෙම පරිච්ඡේදයෙන් ඉදිරිපත් කෙරේ.

6.1. අධ්‍යයනයේ සොයා ගැනීම්

1. වර්තමානය වන විට අනෙකුත් ක්ෂේත්‍රවල මෙන්ම කෘෂිකාර්මික ක්ෂේත්‍රයට අදාළව රාජ්‍ය අංශයේ අමාත්‍යාංශ, ආයතන, පෞද්ගලික අංශය සහ පුද්ගලයින් විසින් නිර්මාණය කරන ලද කෘෂිකාර්මික දැනුම හා තොරතුරු සපයාගත හැකි ඩිජිටල් කෘෂිකාර්මික යෙදුම්, වෙබ් පිටු, සමාජ මාධ්‍ය ජාලා සහ අන්තර්ජාල පහසුකම් ගොවි සමාජය තුළ ද භාවිතා වෙමින් පවතී.

2. කෘෂිකාර්මික ක්ෂේත්‍රයට අදාළව රාජ්‍ය අංශයේ ඩිජිටල් කෘෂිකාර්මික මෙවලම් නිර්මාණය සම්බන්ධයෙන් ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය (NAICC) කැපී පෙනෙන කාර්යභාරයක් ඉටු කරනු ලබයි.

3. ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය සමඟ දමිළ භාෂාව සහිත ප්‍රදේශයන් හි නිලධාරීන්ගේ හා ගොවීන්ගේ සම්බන්ධතාවය ඉතා අඩු මට්ටමක පවතී. එමඟින් දමිළ ගොවි ප්‍රජාවට ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාවන් ලබාදීමේ හැකියාව අඩුය. දමිළ කෘෂි උපදේශන සේවා නිලධාරීන් මෙම මධ්‍යස්ථානය තුළ හිඟ වීමත් පළාත් මට්ටමේ දී දමිළ කෘෂිකාර්මික නිලධාරීන්ගේ හිඟය සහ භාෂා ගැටලු පැවතීමත් මේ සඳහා හේතු වී ඇත.

4. අධ්‍යයන ප්‍රදේශය තුළ ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාව පිළිබඳ අධ්‍යයනය සඳහා සහභාගී වූ ගොවීන්ගේ ප්‍රජා විද්‍යාත්මක ලක්ෂණ අනුව බහුතර පිරිස පුරුෂයින් (71%) වූ අතර 88%ක් වයස අවුරුදු 40 ඉක්ම වූවත් අධ්‍යාපන මට්ටම අනුව නව තාක්ෂණික දැනුම උකහා ගත හැකි විභවයක් සහිත කණ්ඩායමක් විය.

5. ගොවිතැන ප්‍රධාන ජීවිකාව (84%) වූ ගොවීන්ගෙන් 98%ක්ම වී වගාවේ නියැළෙන අතර එළවළු (24%), පලතුරු (11%), අතිරේක ආහාර බෝග (11%), පොල්, පුවක්, බුලත් සහ කජු (23%) වගාවන් හි සහ කිරිගව පාලනයෙ හි (9%) නියැළෙන්නන් ද මෙම ගොවි කණ්ඩායමට අයත් වූහ.

6. අධ්‍යයන ප්‍රදේශයේ ගොවීන් ප්‍රධාන වශයෙන් තම ව්‍යාප්ති සේවා අවශ්‍යතා රාජ්‍ය අංශයේ ව්‍යාප්ති සේවා නිලධාරීන් (කෘෂිකර්ම උපදේශක) හරහා සම්පූර්ණ කරගනු ලබයි. ඊට අමතරව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ආශ්‍රිතව ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාවන් ලබා ගත හැකි ඩිජිටල් මෙවලම් අතරින් සමාජ මාධ්‍ය ජාලා වෙත නැඹුරු වීම ඉහළ වුවත් භෞතිකව නිලධාරියා සමඟ සම්බන්ධ වීමකින් තොරව ඔවුන්ගේ කෘෂිකාර්මික ගැටලු විසඳා ගැනීමට හා

තොරතුරු දැනුම සපයා ගැනීමට සකසා ඇති ඩිජිටල් කෘෂිකාර්මික යෙදුම් සඳහා ඇත්තේ අඩු නැඹුරුවකි.

7. ගොවීන් අතර පවතින ඩිජිටල් කෘෂිකාර්මික යෙදුම් සඳහා ඇති අඩු නැඹුරුවට හේතු වී ඇත්තේ බිම් මට්ටමේ දී මෙම මෙවලම් පිළිබඳව දැනුවත් කිරීම අඩු වීම සහ එම මෙවලම් භාවිතය හා අදාළ තාක්ෂණයන් ලබා ගැනීමේ හැකියාවන් අතර පවතින අසමානතාවයන් වේ.

8. ගොවීන්ගෙන් 74%කට ස්මාර්ට් ජංගම දුරකථන (Smart Mobile Phone) හිමිකම පැවති අතර ඩිජිටල් කෘෂි ව්‍යාප්ති සේවය හරහා කාෂිකාර්මික දැනුම හා තොරතුරු ලබා ගැනීමට එය තීරණාත්මක හා විභව සාධකයක් වී ඇත.

9. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික මෙවලම් භාවිතය හා එම තාක්ෂණයන් ලබා ගැනීමේ හැකියාවන් අතර පවතින අසමානතාවයන් නිසාත් තාක්ෂණික වශයෙන් නිරන්තරයෙන් යාවත්කාලීන නොවීම යන ගැටලු හේතුවෙන් ස්මාර්ට් ජංගම දුරකථනයක් හිමි සෑම ගොවියෙක්ම ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාවට නැඹුරුවක් නොදක්වති.

10. ගොවීන්ගෙන් 65%ක් තම කෘෂිකාර්මික කාරණා සම්බන්ධයෙන් ගොවි සමාජය තුළ පවතින ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති මෙවලම් අතරින් කුමක් හෝ ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති මෙවලමක් භාවිතා කරමින් සිටී. ගොවින්ගෙන් 35%ක් එවැනි මෙවලම් භාවිතා නොකරයි.

11. අධ්‍යයන ප්‍රදේශය තුළ ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති මෙවලමක් භාවිතා කිරීමට නැඹුරුව සිටින ගොවීන්ගේ (65%) වයස් මට්ටම් හා අධ්‍යාපන මට්ටම් ඉහළ හෝ පහළ වීම අනුව එම නැඹුරුවේ වෙනසක් නොපෙන්වයි. තරුණ කාණ්ඩය කෘෂිකාර්මික කාර්යයන් සම්බන්ධයෙන් අඩු පිරිසක් නියෝජනය කළ ද සාකච්ඡාවන් හි දී අනාවරණය වූයේ එයින් බැහැර වූ වෙනත් ව්‍යවසායකත්ව කාර්යයන්, විශේෂ වෘත්තීමය හැකියාවන් පිළිබඳ දැනුවත් වීම සඳහා ඩිජිටල් ව්‍යාප්ති මෙවලම් භාවිතා කරන බවයි. මෙහි දී පැහැදිලි වන විශේෂ කාරණයක් වන්නේ මෙම ඩිජිටල් ව්‍යාප්ති මෙවලමක් නිර්මාණය කිරීමේ දී තරුණ කණ්ඩායම්වල කෘෂිකාර්මික සුවිශේෂතා පිළිබඳව වඩාත් සැලකිලිමත් විය යුතු බවයි.

12. ගොවීන්ට කෘෂිකාර්මික දැනුම සහ තොරතුරු ලබා ගැනීමට පවතින ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති මෙවලම් වෙත ගොවීන් ප්‍රවේශ වීමේ ස්වභාවය අනුව යූ ටියුබ්, වට්ස් ඇප් සමූහ, ෆේස්බුක් පිටු යන සමාජ මාධ්‍යයන් සහ වෙබ් රේඩියෝ(කෘෂි රේඩියෝ යෙදුම) යන ඩිජිටල් මෙවලම් සඳහා සැලකිය යුතු ගොවීන් පිරිසක් දිනපතා සම්බන්ධ වේ.

13. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ජාතික කෘෂිකාර්මික තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය විසින් ගොවීන් සඳහා විශේෂයෙන් සකස් කළ ඩිජිටල් ජංගම දුරකතන යෙදුම් භාවිතා කිරීම සම්බන්ධයෙන් අධ්‍යයන ප්‍රදේශයේ ගොවීන් 91%කගේම දැනුවත්භාවය අඩු මට්ටමක පවතී.

14. රාජ්‍ය අංශයේ (NAICC ඇතුළු) ඩිජිටල් ජංගම දුරකතන යෙදුම්වලට අමතරව පෞද්ගලික ආයතන සහ විවිධ පුද්ගලයින් විසින් නිර්මාණය කළ ඩිජිටල් ජංගම දුරකතන යෙදුම් ගොවීන් අතර ප්‍රචලිත වීම හෝ ඒවා භාවිතා කිරීම අඩු මට්ටමක පවතී. නමුත් පෞද්ගලික අංශයේ ඩයලොග් ඇක්සියාටා සමාගම විසින් ගොවීන් වෙත හඳුන්වා දී ඇති ''ගොවි මිතුරු'' ඩිජිටල් ජංගම දුරකතන යෙදුම පිළිබඳ පමණක් ගොවීන්ගේ දැනුවත්භාවයක් ඇති නමුත් ඒවායින් ප්‍රයෝජන ගනු ලබන්නේ ඉතාමත් සුළු පිරිසකි (7%).

15. සමාජ මාධ්‍ය ජාලා සහ වෙබ් රේඩියෝ (කෘෂි රේඩියෝ යෙදුම) යන ඩිජිටල් මෙවලම්වලට අමතරව රාජ්‍ය ආයතන, පෞද්ගලික ආයතන, විවිධ ව්‍යාපෘති මඟින් ගොවීන්ගේ ව්‍යාප්ති සේවා අවශ්‍යතාවය වෙනුවෙන් සකස් කළ ඩිජිටල් කෘෂිකාර්මික යෙදුම් පැවතිය ද ඒවා පිළිබඳව ගොවීන් නිසි දැනුවත් භාවයක් නොමැති වීම (93%), ඩිජිටල් කෘෂිකාර්මික යෙදුම් වෙත ප්‍රවේශ වීමේ නොදැනුවත්කම (39%), ඩිජිටල් කෘෂිකාර්මික ජංගම දුරකතන යෙදුම් යාවත්කාලීන නොවීම සහ තොරතුරු යාවත්කාලීන නොවීමෙන් මෙවලම් පිළිබඳ නිර්වද්‍යතාවය සහ

විශ්වසනීයත්වය නොමැති වීම (29%), ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති මෙවලම් භාවිතයට සාපේක්ෂව රූපවාහිනී හා ගුවන්විදුලිය භාවිතයට කැමැත්තක් ඇති වීම (22%), අන්තර්ජාල පහසුකම් සඳහා අවහිරතා පැවතීම (17%) සහ අන්තර්ජාල පහසුකම් සඳහා මූල්‍යමය අවහිරතාවයන් (10%) පැවතීම ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති මෙවලම් භාවිතය සම්බන්ධයෙන් ගොවීන් මුහුණ දෙන දෙන ප්‍රධාන ගැටලු වේ.

16. අධ්‍යයනයට සහභාගී වූ නිලධාරීන්ගේ ප්‍රජා විද්‍යාත්මක ලක්ෂණ අනුව ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාව ගොවීන් වෙත හඳුන්වා දිය හැකි විභවයක් සහිත වයස් මට්ටමක් සහ අධ්‍යාපන මට්ටමක් මෙන්ම නිලධාරීන් සියල්ල සතුව ස්මාර්ට් ජංගම දුරකථන හිමිකම පැවතීම නිලධාරීන් සතු විභවතාවන් වේ.

17. ගොවීන් සඳහා ව්‍යාප්ති සේවාවන් සැපයීමේ දී නිලධාරීන් සතු විභවතාවන් උපයෝජනය කිරීම සඳහා නිලධාරීන්ගෙන් බහුතරයකට (64%) ඒ සම්බන්ධයෙන් ඇති දැනුවත්භාවය ඉහළ නැංවීමේ අවශ්‍යතාවයක් පවතී.

18. සමාජ මාධ්‍ය ජාලාවන්ට අයත් වන යූ ටියුබ්, වට්ස් ඇප් සමූහ, ෆේස් බුක් පිටු හා කෘෂි වෙබ් අඩවි "දිනපතා" භාවිතා කරන අතර ගොවීන් වෙනුවෙන් හා නිලධාරීන් වෙනුවෙන් විශේෂයෙන් සකස් කර ඇති කෘෂිකාර්මික ජංගම දුරකතන යෙදුම් භාවිතා කිරීම සිදු වනුයේ "අවශ්‍ය වූ විට" පමණකි.

19. අධ්‍යයනයට සහභාගී වූ නිලධාරීන්ගෙන් 13 දෙනෙකු (59%) ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානයේ (NAICC) ජංගම දුරකතන යෙදුම්වලට අමතරව පෞද්ගලික ආයතන / පුද්ගලයින් හා විවිධ ව්‍යාපෘතිවල අවශ්‍යතාවයන්ට හඳුන්වා දී ඇති යෙදුම් වන ගොවිපොළ යෙදුම සහ ගොවිමිතුරු යෙදුම භාවිතා කරනු ලබති.

20. ඩිජිටල් කෘෂිකාර්මික මෙවලම් භාවිතා කිරීමේ දී අන්තර්ජාල පහසුකම් සඳහා සංඥා ගැටලු සහ මූල්‍යමය අපහසුතාවයන් පැවතීම, යෙදුම් භාවිතයේ දී සමහර තොරතුරු හා දැනුම යාවත්කාලීන නොවීම නිසා නිරවද්‍යභාවය පිළිබඳ විශ්වාසයක් නොමැති වීම සහ අදාළ යෙදුම් වර්ග බාගත කර ගැනීමේ දී ඒ සඳහා ප්‍රවීණතාවය අඩු වීම වැනි බාධාවන් නිසා නිලධාරීන් විසින් ඩිජිටල් ජංගම යෙදුම් භාවිතයට සාපේක්ෂව සමාජ මාධ්‍ය ජාලා භාවිතා කිරීමට වැඩි නැඹුරුවක් දක්වා ඇත.

6.1.1. නිගමන

වර්තමානයේ කාෂිකාර්මික අංශයට අදාළව ඩිජිටල් මෙවලම් සහ ඩිජිටල් වේදිකා බහුල ලෙස නිර්මාණය වී ඇත. එසේම එම උපාංග මඟින් ලබන ප්‍රයෝජනවල ද ප්‍රගතියක් ඇත. එසේ වුවත් සමස්තයක් ලෙස අධ්‍යයන ප්‍රදේශය තුළ මෙන්ම ග්‍රාමීය කෘෂිකාර්මික අංශය තුළ ද මෙම ඩිජිටල් මෙවලම් සහ ඩිජිටල් වේදිකා අතරින් වඩාත් ප්‍රතිඵලදායක වූ මෙවලම් කවරේ ද යන්න ගොවි ප්‍රජාවට පැහැදිලිව දෘශ්‍යමාන නොවීම, අන්තර්ජාලය සහ දැරිය හැකි මිල, ඩිජිටල් සාක්ෂරතාවය අතර පවතින අසමානතාවයන් අවම කිරීමත් ඒ සම්බන්ධයෙන් පැහැදිලි දැනුවත් කිරීම් සිදු කිරීමත් අවශ්‍ය වේ. එසේම නියාමනයකින් තොර නිර්මාණය වන ඩිජිටල් කාෂිකාර්මික ව්‍යාප්ති යෙදුම් (App) නිර්මාණය කිරීමේ දී ඒවා අධීක්ෂණයට ලක් කිරීම සහ පාලනය කිරීම ද සිදු කළ යුතු වේ. ඩිජිටල් කාෂිකාර්මික ව්‍යාප්ති සේවාවන් සැපයීමට අදාළ පාර්ශ්වයන් ආශ්‍රිතව සිදුකළ ශදුඅත විශ්ලේෂණය අනුව මෙම සියලු පාර්ශ්වයන්ට අදාළ ඩිජිටල් කාෂිකාර්මික මෙවලම් හි පවතින දුර්වලතාවන් හා තර්ජන අවම කිරීමට ඒවායෙහි ඇති ශක්තීන් හා අවස්ථාවන් නිසි ලෙස ප්‍රයෝජනයට ගත යුතු අතර ඒ මඟින් ඩිජිටල් කාෂිකාර්මික ව්‍යාප්ති සේවාවන් ආශ්‍රිත ගොවීන්ගේ හා නිලධාරින්ගේ ගැටලූ අවම කර එම දෙපාර්ශ්වයටම අයත් විභවතාවන් ඉහළ නැංවීමේ හැකියාව ඇති බව ද අධ්‍යයනයේ දී නිගමනය කළ හැකි වේ. එසේම, මෙම අධ්‍යයනය මඟින් පැහැදිලි වන්නේ පෞද්ගලික අංශය හා රාජ්‍ය අංශයේ වඩා නිවැරදි හවුල්කාරීත්වයක් සහිත ක්‍රමෝපායයක් අනුගමනය කරමින් මෙම අංශය දියුණුකිරීමේ

අවශ්‍යතාවයක් ඇති බවයි. එවැනි ක්‍රමෝපායයක් අනුගමනය කිරීමට හැකි පසුබිමක් වර්තමානය වන විට ග්‍රාමීය කෘෂිකාර්මික අංශය තුළ ප්‍රවර්ධනය වී ඇති බව ද අධ්‍යයනයේ දී පැහැදිලි විය. එබැවින් පෞද්ගලික අංශය හා රාජ්‍ය අංශයේ හවුල්කාරීත්වය හරහා ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති තාක්ෂණය ගොවීන් අතර ප්‍රවර්ධනය කිරීමෙන් යෙදවුම් සංරක්ෂණය කිරීමට, බෝග වගාවන්ගෙන් ඇති වන කෙටි කාලීන හා දිගු කාලීන පාඩු ලැබීම් හා මූල්‍ය ණයගැතිභාවයේ විෂම චක්‍රයෙන් ඉවත් වීමට සහ වාණිජ මට්ටමේ කෘෂිකාර්මාන්ත වෙත ප්‍රවේශ වීමේ දී අවැසි නිවැරදි තීරණ ගැනීමේ හැකියාව ගොවීන්ට ලබා දීම සිදු කිරීම සුදුසු බව අධ්‍යයනය විසින් නිගමනය කෙරේ.

6.2. යෝජනා

අධ්‍යයනයට ලක් වූ කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාවන් භාවිතය, ගැටලු සහ විභවතාවන් සම්බන්ධයෙන් අනාවරණය වූ දත්ත හා තොරතුරු විශ්ලේෂණයන් හා නිගමන පදනම් කර ගනිමින් පහත ප්‍රධාන යෝජනා ඉදිරිපත් කෙරේ.

1. බිම් මට්ටමේ සිටින කෘෂිකාර්මික අංශයට අදාළ නිලධාරීන්ට (කෘෂිකර්ම උපදේශක නිලධාරී, තාක්ෂණික සහායක නිලධාරී, කෘෂිකර්ම පර්යේෂණ සහ නිෂ්පාදන සහකාර නිලධාරී) ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්තිය, භාවිතය හා ප්‍රවේශය පිළිබඳව දැනුවත්භාවය ඉහළ නැංවීම. ඒ සඳහා,

    - කෘෂිකාර්මික ක්ෂේත්‍රයට අදාළව රාජ්‍ය අංශයේ ඩිජිටල් කෘෂිකාර්මික මෙවලම් නිර්මාණය සම්බන්ධයෙන් කැපී පෙනෙන මැදිහත් වීමක් සිදුකරන ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය (NAICC) සහ අදාළ පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයන් එක්ව දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන් දියත් කිරීම.

2. එම පුහුණුව ලත් නිලධාරීන් හරහා සෑම ගොවිජන සේවා මධ්‍යස්ථානයකම තෝරා ගත් ගොවි සංවිධාන හා කාන්තා සංවිධාන මට්ටමින් ගොවීන්ට ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්තියට නැඹුරු වීමට ප්‍රායෝගික පුහුණුවක් ලබා දීම.

    - මෙහිදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානයේ (NAICC) අදාළ නිලධාරීන් හරහා තාක්ෂණික පුහුණුව ලබා දීමේ හැකියාව සොයාබැලීම වැදගත් වේ. පුහුණුව ලත් බිම් මට්ටමේ නිලධාරීන්ට ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාව හා ඊට අනුගත වීම හරහා ලැබිය හැකි පහසුව ගැන ගොවීන් වෙත දැනුම සැපයිය හැකිය.

    - අධ්‍යයන ප්‍රදේශයට අයත් තරුණ ප්‍රජාවගේ ආකර්ෂණය ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය දියුණු කිරීම සම්බන්ධයෙන් වැදගත් අවස්ථාවක් මෙන්ම විභවයක් වන බැවින් තරුණ ගොවි ප්‍රජාව ඉලක්ක කරගනිමින් ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්තිය, භාවිතය හා ප්‍රවේශය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

3. සමාජ මාධ්‍ය ජාලාවන් හි කෘෂිකාර්මික ක්ෂේත්‍රයට අදාළ දැනුම හා තොරතුරු ව්‍යාප්තිය රාජ්‍ය මැදිහත් වීම හරහා නියාමනයට ලක් කිරීම.

    - දැනට කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ තොරතුරු සහ සන්නිවේදනය සඳහා වැදගත් භූමිකාවක් සිදු කරන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අදාළ ආයතනයන්ට මේ සම්බන්ධයෙන් යම් නියාමන බලතල පැවරීමක් සිදු කළ හැකිය. ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයට අදාළ/අදාළ නොවන කුමන ආයතනයක් හෝ නිලධාරියෙක් හෝ කුමන පුද්ගලයෙක් හෝ තාක්ෂණික වශයෙන් කෘෂිකාර්මික දැනුම හා තොරතුරු ඩිජිටල් මාධ්‍ය හරහා බෙදා හැරීමේ දී සහ ඊට අදාළ යෙදුම් (App)

නිර්මාණය කිරීමේ දී ඒවා අධීක්ෂණයට ලක් කිරීමටත් පාලනය කිරීමටත් අධීක්ෂණ හා පාලන මෙහෙයුම් දොරටුවක් ලෙස බලය පවරන ලද කමිටුවක් පත් කිරීමේ ක්‍රමවේදයක් සකස් කිරීම.

4. උතුරු සහ නැගෙනහිර පළාත්වල කෘෂිකාර්මික ගැටලුවලට සම්බන්ධ කෘෂි උපදේශන සේවා ඇමතුම් මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම සහ එම මධ්‍යස්ථාන ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය සමඟ සම්බන්ධ කිරීම

    - පළාත් මට්ටමේ දී දමිළ කෘෂිකාර්මික නිලධාරීන්ගේ හිඟයක් ද පවතින බැවින් උතුරු සහ නැගෙනහිර පළාත්වල කෘෂිකාර්මික ගැටලුවලට සම්බන්ධ කෘෂි උපදේශන සේවා ඇමතුම් මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම සහ එම මධ්‍යස්ථාන ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය සමඟ සම්බන්ධ කළ කිරීම මඟින් දමිළ ගොවි ප්‍රජාවට භාෂා ගැටලුවකින් තොරව ඉක්මන් සේවාවක් ලබාගැනීමේ හැකියාව ඇති වේ. ඒ සඳහා ආයතනික ප්‍රතිපාදන ඇති කිරීමට රාජ්‍ය අනුග්‍රහය ලැබිය යුතු වේ.

5. දූරකථන අනුවාදයට අනුව ජංගම කෘෂිකාර්මික ව්‍යාප්ති යෙදුම් යාවත්කාලීන කිරීමට කෘෂිකාර්මික අංශයේ ව්‍යාප්ති යෙදුම් නිර්මාණය කිරීමේ කාර්යයට මැදිහත් වන ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානයේ අදාළ නිලධාරීන්ට රාජ්‍ය අංශයේ මැදිහත්වීම යටතේ තාක්ෂණික දැනුම සහ පහසුකම් සැපයීම

    - ජංගම යෙදුම් නිර්මාණය කිරීමේ දී ප්‍රධානතම ගැටලුවක් වන්නේ මෙම යෙදුම් දූරකතන අනුවාදයට අනුව යාවත්කාලීන කළ යුතු වීමයි. වර්තමානයේ තරඟකාරී තාක්ෂණික වෙළඳපොළ තුළ දූරකතන මාදිලි හා අනුවාද සීඝ්‍රයෙන් යාවත්කාලීන වන අතර, ඒ සමඟම මෙම යෙදුම් ද එයට අනුකූලව යාවත්කාලීන කළ යුතුව ඇත. නමුත් මේ සඳහා යම් පිරිවැයක් දැරීමට සිදුවන අතර මූල්‍ය ප්‍රතිපාදනවල යම් ගැටලු නිසා සමහර යෙදුම් නිසි පරිදි යාවත්කාලීන නොවේ. මෙය ආයතනික හා නිලධාරී මට්ටමින් ද ගොවි ප්‍රජාව පාර්ශ්වයෙන් ද මුහුණ දෙන ගැටලුවකි. මෙම තත්ත්වය සඳහා රජයේ මූල්‍යමය හා පහසුකම් සැපයීමේ මැදිහත්වීම අත්‍යවශ්‍ය වේ.

6. ඩිජිටල් ව්‍යාප්ති මෙවලමක් නිර්මාණය කිරීමේ දී තරුණ කණ්ඩායම්වල කෘෂිකාර්මික සුවිශේෂතා පිළිබඳව වඩාත් සැලකිලිමත් වීම.

7. රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරිත්වය යටතේ දැනටමත් ක්‍රියාත්මක වෙමින් පවතින ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාවන් තවදුරටත් පුළුල් කිරීම සහ දියුණු කිරීම හරහා ගොවීන් වෙත කෘෂිකාර්මික දැනුම හා තොරතුරු ඵලදායී ලෙස සන්නිවේදනය වීම අසමානතාවයකින් තොරව ලැබීමේ පසුබිම සැකසීම.

ආශ්‍රිත ග්‍රන්ථ

Biradar, V.S., Al-Jiboory, A.K., Sahu, G., Babu,S.B.T.and Mahendra,k.,2023. Intelligent Control System for Industrial Automation and Robotics. In *2023 10th IEEE Uttar Pradesh Section International Conference on Electrical, Electronic and Computer Engineering (UPCON)* (Vol.10, pp1238-1243). IEEE.

Costopoulou, C., Karetsos, S. and Ntaliani, M. (2020). Investigating educational mobile apps for agriculture. *International Journal of Sustainable Agricultural Management and Informatics*, *6*(3), pp.272-287.

Costopoulou, C., Ntaliani, M. and Karetsos, S. (2016). Studying mobile apps for agriculture. *IOSR J. Mob. Comput. Appl*, *3*(6), pp.44-49.

Davis, F.D. (1989). Technology acceptance model: TAM. *Al-Suqri, MN, AI- AUfi,AS: Information Seeking behavior and Technology Adoption*, 205(219), 5.

Dissanayeke, U., Prasada, P. and Wickramasuriya, H. (2020). ICT-Based Information Systems in Agricultural Extension and Their Economic Implications: Sri Lankan Perspectives. Agricultural Research for Sustainable Food Systems in Sri Lanka: Volume 2: A Pursuit for Advancements, pp.331-351.

Fadziso, T. (2018). Internet of things in agriculture for smart farming. *Malaysian Journal of Medical and Biological Research*, *5*(2), 147-156.

Herath, M. M., Ahmad, N., Hassan, M. M., & Jaafar, W. M. W. (2021). Agricultural Extension among the Farming Community in Sri Lanka. International Journal of Academic Research in Business and Social Sciences, 11(11), 1819–1835. http://dx.doi.org/10.6007/IJARBSS/v11-i11/11663

Karim, Z. (1999). Agro-technology transfer: the quest for a better design of systems. In: Proceedings of the Symposium on Agricultural Extension Services in the 21st Century: Needs and Challenges. Department of Agricultural Extension, Bangladesh Agricultural University, Mymensingh, Bangladesh, pp 7–19.

Kashem M, A., Halim, A. (1999). Foreword. In: Proceedings of the Symposium on Agricultural Extension Services in the 21st Century: Needs and Challenges. Department of Agricultural Extension, Bangladesh Agricultural University, Mymensingh, Bangladesh.

Kaur, K. & Kaur, P. (2018). *Agricultural Extension Approaches to Enhance the Knowledge of Farmers – A Review. International Journal of Current Microbiology and Applied Science*,7(2), 2367-2376. https://doi.org/10.20546/ijcmas.2018.702.289

Lurdu, M. D. S., Epasinghe, S., Hitihamu, S. (2011). සයිබර් කෘෂිකර්මික ව්‍යාප්ති ඒකකයන් හි ප්‍රගතිය හා බලපෑම පිළිබඳ අධ්‍යයනය, Hector Kobbakaduwa Agrarian Research and Training Institute.

Lurdu, M. D. S., Jayasooriya, H. J. C., Bamunuarachchi, D. (2022). ශ්‍රී ලංකාවේ කාෂිකාර්මික ව්‍යාප්ති සේවය: හැරවුම් ලක්ෂ්‍යයන් සහ ඉදිරිගමනට මාර්ග සිතියමක්, Hector Kobbakaduwa Agrarian Research and Training Institute.

Mulungu, K., Kassie, M. and Tschopp, M. (2024). The role of Information and Communication Opportunities and Challengers. *Information Technology for Development*, 1-30. http://doi.org/10.1080/02681102.2025.2456232

Rohila, A.K., Yadav, K. and Ghanghas, B.S. (2017). Role of Information and communication technology (ICT) in agriculture and extension. *Journal of Applied and Natural Science*, 9(2), pp.1097-1100.

Sivayoganathan, C. (2020). Evolution of Agricultural Extension System in Sri Lanka. Agricultural Research for Sustainable Food Systems in Sri Lanka: Volume 1: A Historical Perspective, pp.351-367.

Thapa, M., Signorini, G., and Specht,A.R. (2025). Understanding factors influencing adoption of digital tools among extension agent of Nepal, Journal of Agribusiness in developing and emerging economics, Vol. ahead-of-print, No. ahead-of-print. http://doi.org./10.1108/JADEE-07-2024-0221

Wanigasundera, W.A.D.P. (2015). *Status of Extension & Advisory Service in Sri Lanka* (AESA Working Paper No.001). University of Peradeniya, Sri Lanka.

Wanigasundera, W.A.D.P. and Atapattu, N., (2019). Extension reforms in Sri Lanka: lessons and policy options. In Agricultural extension reforms in south Asia (pp. 79-98). Academic Press.

Weththasinghe, P., and Dissanayake, V.I. (2024). Alternative and ICT – based advisory and extension approaches in the tea sector in Sri Lanka: An explorative study, Tropical agricultural research,35(1):46-60.

World Bank (2012). Mobile applications for agriculture and rural development. Washington, D.C.: World Bank Group. http:/ /documents.worldbank.org/curated/en/167301467999716265/Mobile-applications-for-agriculture-and-rural development [Accessed: 28-10-2018].

Pallavi, G., Santosh, D, T., and Ashoka, N. (2023). E-Extension for agriculture development: ICT tools, implementation, and impacts. n book: Recent Advances in Agricultural Sciences and Technology (pp.609-618), Publisher: Dilpreet Publishing House, New Delhi.

Rogers, E.M.,Singhal, A.& Quinlan, M.M.(2014). Diffusion of innovations. *In An integrated approach to communication theory and research*(pp.432-448). Routledge.

- https://www.techtarget.com/whatis/definition/mobile-app
- https://play.google.com/store/apps/details?id=com.SRIOC.Lahiru&pcampaignid=web_share
- https://dea.en.aptoide.com/app)
- https://play.google.com/store/apps/details?id=zincat.net.cocoguru&pcampaignid=web_share
- https://apkcombo.com/kiri-aswanu/com.daphmobile/
- https://play.google.com/store/apps/details?id=com.govinena.app&pcampaignid=web_share
- https://apkcombo.com/export-agriculture-sri-lanka/com.exportagriculture.mashaupul.aggrinew/
- https://play.google.com/store/apps/details?id=com.icta.foodgate&pcampaignid=web_share
- https://play.google.com/store/apps/details?id=com.helavirufarmermobi&pcampaignid=web_share
- https://apkcombo.com/hela-nutrition/org.bfn.srilanka/
- https://apkcombo.com/agriculture-department-sri-lanka/com.Labs.Agriculture.DepSriLanDL/
- https://apkcombo.com/hela-bojun/doa.gov.lk.helabojun/
- https://m.apkpure.com/sl-gap/com.doasl.doagap.sl_gap
- https://apkcombo.com/agriculture-department-sri-lanka/com.Labs.Agriculture.DepSriLanDL/
- https://sri-lanka-fish-prices.soft112.com/
- https://pussalla.en.softonic.com/android?ex=RAMP-2639.0
- https://play.google.com/store/apps/details?id=com.jkit.keellsretailapp&hl=en
- https://play.google.com/store/apps/details?id=com.vega.aigrow&pcampaignid=web_share
- https://play.google.com/store/apps/details?id=com.smartagroapp&pcampaignid=web_share
- https://play.google.com/store/apps/details?id=com.arimaclanka.android.govimithuru&pcampaignid=web_share
- https://m.apkpure.com/lanka-flowers/lk.ifsolutions.lankaflowers
- https://play.google.com/store/apps/details?id=com.scl.weladapola&pcampaignid=web_share
- https://play.google.com/store/apps/details?id=io.ionic.prog5f71ca85108b525f97e18be7&pcampaignid=web_share
- https://play.google.com/store/apps/details?id=thothanna_innovations.project.govilitha& pcampaignid=web_share
- https://play.google.com/store/apps/details?id=com.dulithaeshan.spiceprices&ref=apkcombo.com
- https://play.google.com/store/apps/details?id=lk.habits.modgoviya&pcampaignid=web_share

- https://apkpure.com/%E0%B6%9C%E0%B7%99%E0%B7%80%E0%B6%AD%E0%B7%94-%E0%B7%80%E0%B6%9C%E0%B7%8F%E0%B7%80gewathuwagawa/io.ionic.prog5e91551335b105417bf2a127?utm_source=qrcode&utm_campaign=share&utm_medium=social_network
- https://play.google.com/store/apps/details?id=com.chandana.marketprice&pcampaignid=web_share
- https://play.google.com/store/apps/details?id=com.ceylonapz.lakvegie&pcampaignid=web_share
- https://play.google.com/store/apps/details?id=io.ionic.prog5e986cedd814f9698bb3adac&pcampaignid=web_share
- https://apkcombo.com/goviya-goda/com.dilshancs.goviyagoda/

ඇමුණුම් අංක 1: කෘෂිකාර්මික ක්ෂේත්‍රයට අදාළව හඳුනාගත හැකි ඩිජිටල් කෘෂිකාර්මික ව්‍යාප්ති යෙදුම්

	නම Name	Date of App Release/ Updated	Offered By/ Developer	Link
1	Krushi Advisor	14-Dec-2018	Department of Agriculture, Sri Lanka	https://play.google.com/store/apps/details?id=com.prasadbandra.krushiadvisor&pcampaignid=web_share
2	Agri Staff	19-Aug-2019	Agriculture Information & Communication Center, Sri Lanka	https://play.google.com/store/apps/details?id=com.tfbs.agristaff&pcampaignid=web_share
3	Krushi Radio	10-Aug-2019	Television & Farm Broadcasting Service	https://play.google.com/store/apps/details?id=com.tfbs.krushiradio&pcampaignid=web_share
4	Crop Forecasting	28-Jan-2020	Department of Agriculture Sri Lanka	https://play.google.com/store/apps/details?id=com.prasad_doa.cropforcast&pcampaignid=web_share
5	DEA	18-Apr-2023	Ruwan Bandara	https://dea.en.aptoide.com/app
6	Coconut App	02-Sep-2019	Coconut Cultivation Board	https://play.google.com/store/apps/details?id=zincat.net.cocoguru&pcampaignid=web_share
7	SL Paddy Fertilizer	04-Nov-2019	Department of Agriculture Sri Lanka	https://play.google.com/store/apps/details?id=icta.doa.fertilizer&pcampaignid=web_share
8	Weladapola	16-Sep-2019	Seed Code Lab	https://play.google.com/store/apps/details?id=com.scl.weladapola&pcampaignid=web_share
9	Pussalla	18-Sep-2021	FNH	https://play.google.com/store/apps/details?id=lk.futurenetwork.leb.pussalla&pcampaignid=web_share
10	Kiri Aswanu	15-Nov-2022	K-SOFT	https://play.google.com/store/apps/details?id=com.daphmobile&pcampaignid=web_share
11	Helaviru	06-Oct-2022	Epic Lanka Technologies	https://play.google.com/store/apps/details?id=com.helavirufarmermobi&pcampaignid=web_share
12	Elawalu Wagawa	21-Nov-2020	Dias Apps Sinhala	https://play.google.com/store/apps/details?id=io.ionic.prog5f71ca85108b525f97e18be7&pcampaignid=web_share

13	Govi Mithuru	31-May-2021	Dialog Axiata.	https://play.google.com/store/apps/details?id=com.arimaclanka.android.govimithuru&pcampaignid=web_share
14	Keells	31-Jan-2021	Keells Online	https://play.google.com/store/apps/details?id=com.jkit.keellsretailapp&pcampaignid=web_share
15	Govinena Home Garden	25-May-2020	Govi-Nena	https://play.google.com/store/apps/details?id=com.govinena.app&pcampaignid=web_share
16	Ai Grow	14-Mar-2018	ChargeNET	https://play.google.com/store/apps/details?id=com.vega.aigrow&pcampaignid=web_share
17	Export Agriculture Sri Lanka	8/8/2016 (Update)	ATI Gampaha	https://apkcombo.com/export-agriculture-sri-lanka/com.exportagriculture.mashaupul.aggrinew/
18	Spice price Sri Lanka	5/14/2023 (Update)	Dulitha Eshan	https://play.google.com/store/apps/details?id=com.dulithaeshan.spiceprices&ref=apkcombo.com
19	Govi litha	9-May-2020	Thothanna Innovations	https://play.google.com/store/apps/details?id=thothanna_innovations.project.govilitha&pcampaignid=web_share
20	SL Aquaclture	15-Jul-2020	chinthaka perera	https://play.google.com/store/apps/details?id=io.ionic.prog5e91746cb6e4f34073de770a&pcampaignid=web_share
21	Mod Goviya	11/30/2020 (Update)	Genx Code Labs	https://play.google.com/store/apps/details?id=lk.habits.modgoviya&pcampaignid=web_share
22	Gewathu Wagawa	4/22/2020 (Update)	Yohan de silva	https://apkpure.com/%E0%B6%9C%E0%B7%99%E0%B7%80%E0%B6%AD%E0%B7%94-%E0%B7%80%E0%B6%9C%E0%B7%8F%E0%B7%80-gewathu-wagawa/io.ionic.prog5e91551335b105417bf2a127?utm_source=qrcode&utm_campaign=share&utm_medium=social_network
23	Tea Advisor	19-Jun-2023	Tea Research Institute of Sri Lanka	https://play.google.com/store/apps/details?id=com.extension.advisor&pcampaignid=web_share
24	National Pest Surveillance	30-Nov-2022	Department of Agriculture Sri Lanka	https://play.google.com/store/apps/details?id=com.prasadbandara.npss&pcampaignid=web_share
25	CBL's Smart Agro	3-Feb-2022	CBL Online	https://play.google.com/store/apps/details?id=com.smartagroapp&pcampaignid=web_share
26	Yield Price Sri Lanka	7-Jan-2013	Chandana Napagoda	https://play.google.com/store/apps/details?id=com.chandana.marketprice&pcampaignid=web_share

27	Lak Veggie - By Sri Lanka veg	30-Aug-2018	Ceylonapz Technologies	https://play.google.com/store/apps/details?id=com.ceylonapz.lakvegie&pcampaignid=web_share
28	Food Gate Sri Lanka	29-Jan-2023	ICTA Sri Lanka	https://play.google.com/store/apps/details?id=com.icta.foodgate&pcampaignid=web_share
29	Agro Life Sri Lanka	24-Apr-2020	KOMA Labs	https://play.google.com/store/apps/details?id=io.ionic.prog5e986cedd814f9698bb3adac&pcampaignid=web_share
30	Goviya Goda	1/20/2021 (Update)	dilshan	https://play.google.com/store/apps/details?id=com.dilshancs.goviyagoda&ref=apkcombo.com
31	Govi pola	5-Jul-2020	Dhahas Technologies	https://play.google.com/store/apps/details?id=com.pfmerchant&pcampaignid=web_share
32	Hela Nutrition	9-Jun-2019	Department of Agriculture Sri Lanka	https://apkcombo.com/hela-nutrition/org.bfn.srilanka/
33	Sugarcane App	7/11/2023	U.W.L.M.Kumarasiri	https://play.google.com/store/apps/details?id=com.SRIOC.Lahiru&pcampaignid=web_share
34	Agriculture Department Sri Lanka APK	1/1/2019	K. Indrawathi	https://apkcombo.com/agriculture-department-sri-lanka/com.Labs.Agriculture.DepSriLanDL/
35	Hela Bojun	1/13/2019	Department of Agriculture Sri Lanka	https://apkcombo.com/hela-bojun/doa.gov.lk.helabojun/
36	Lanka Flowers APK	10/26/2018	Mobisec (Pvt) Ltd	https://m.apkpure.com/lanka-flowers/lk.ifsolutions.lankaflowers
37	Landscaping - ගෙවතු අලංකරණය හා APK	3/24/2020	HelaGuru Team	https://apkcombo.com/landscaping-%E0%B7%99%E0%B6%9C%E0%B7%80%E0%B6%AD%E0%B7%94-%E0%B6%85%E0%B6%BD%E0%B6%82%E0%B6%9A%E0%B6%BB%E0%B6%AB%E0%B6%BA-%E0%B7%84%E0%B7%8F/io.ionic.prog5e25dc6c2c86e7544905c858/
38	SL-GAP	5/2/2018	Department of Agriculture Sri Lanka	https://m.apkpure.com/sl-gap/com.doasl.doagap.sl_gap
39	Ministry of Agriculture Sri lanka apk	4/4/2018	K. Indrawathi	https://chipapk.com/app/3852852/
40	Ceylon Tea	8/17/2016	RAMPS	https://apkcombo.com/ceylon-tea/com.srilankantourism_tea/
41	Ceylon Cinnamon	7/25/2016	Gabriel Albuquerque Silva	https://apkpure.com/ceylon-cinnamon/ramps.srilankancinnamon

42	Sri Lankan Pepper Farmers App	12/11/2022	Corbel Business Applications Pvt Ltd	https://m.apkpure.com/sri-lankan-pepper-farmers-app/apps.corbelbiz.ipc_srilanka
43	Spices of Sri Lanka	8/15/2015	RAMPS	https://play.google.com/store/apps/details?id=com.ramps.srilankanspices&hl=en&gl=US
44	Agstar Fertilizer Field Functi	3/9/2020	eMerge Solutions (Pvt) Ltd	https://apkcombo.com/agstar-fertilizer-field-functi/project.emarge.fertilizerrep/
45	AgStar Prith Seeds Manager	3/8/2021	eMerge Solutions (Pvt) Ltd	https://apkgk.com/project.emarge.prithseeds_manager
46	Post harvest	12/28/2021	Sri Lanka Anti-Doping Agency	https://m.apkpure.com/post-harvest/hiruni.app.project
47	Sri Lanka Fish Prices	8/7/2015	ICTA Sri Lanka	https://m.apkpure.com/sri-lanka-fish-prices/lk.gov.fisheriescorporation.android.prices/download
48	GB STORE-Mushroom Cultivation	5/5/2020	Tech Eminence	https://play.google.com/store/apps/details?id=io.ionic.prog5e7fdf2f68843411a253f7f6&pcampaignid=web_share

මූලාශ්‍රය: අන්තර්ජාල තොරතුරු, 2024

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය
තැ.පෙ. 1522
කොළඹ
ශ්‍රී ලංකාව
Tel. +94 11 2 6969 81
+94 11 2 6964 37
Fax. +94 11 2 6924 23
e-mail director@harti.gov.lk
Web www.harti.gov.lk

ISBN: 978-624-5973-66-8

9 7 8 6 2 4 5 9 7 3 6 6 8

PRICE LKR ..../-